# මාධ්‍ය උද්දේශන මෙවලම් කට්ටලය

ප්‍රජාතාන්ත්‍රික ශ්‍රී ලංකාවක් උදෙසා මාධ්‍ය සවිබලගැන්වීමේ වැඩසටන (MEND)



USAID FROM THE AMERICAN PEOPLE

IREX

# පටුන


| මාතෘකාව | පිටු අංකය |
|---|---|
| හැඳින්වීම | 3 |
| **පළමු කොටස** | |
| උද්දේශනය සැලසුම් කිරීම | |
| 1 මොඩියුලය - උද්දේශනය යනු කුමක්ද? | 4 |
| 2 මොඩියුලය - උද්දේශන සැලැස්මක් නිර්මාණය කරගැනීම | 5 |
| 3 මොඩියුලය - ප්‍රශ්නය හඳුනාගැනීම | 7 |
| 4 මොඩියුලය - ප්‍රශ්නය විශ්ලේෂණය කිරීම / ලබාදිය හැකි විසඳුම් | 9 |
| 5 මොඩියුලය - පාර්ශ්වකරුවන් හා පරිසරය | 13 |
| 6 මොඩියුලය - අරමුණු හා අභිමතාර්ථ | 15 |
| 7 මොඩියුලය - ප්‍රතිපත්ති ස්ථාවරය පැහැදිලි කිරීම | 17 |
| 8 මොඩියුලය - උපායමාර්ග තෝරාගැනීම | 20 |
| 9 මොඩියුලය - පණිවුඩය නිර්මාණය කිරීම | 22 |
| 10 මොඩියුලය - උද්දේශන උපායමාර්ගයක් නිර්මාණය කිරීම | 25 |
| 11 මොඩියුලය - උද්දේශනය සැලසුම් කිරීම | 27 |
| **දෙවන කොටස** | |
| ප්‍රතිපත්ති සම්පාදය | |
| 1 මොඩියුලය - තොරතුරු එක්රැස්කරගැනීම | 29 |
| 2 මොඩියුලය - තොරතුරු සංවිධානය හා බෙදාහදාගැනීම | 30 |
| 3 මොඩියුලය - උපදෙස් විමසීම | 32 |
| **තෙවන කොටස** | |
| සම්පත් කළමනාකරණය | |
| 1 මොඩියුලය - සම්පත් වර්ග | 36 |
| 2 මොඩියුලය - සම්පත් කළමනාකරණ මූලෝපායන් සහ තාක්ෂණයන්: වාර්ෂික සැලැස්මක් සැකසීම | 37 |
| 3 මොඩියුලය - සම්පත් සැලසුම් කිරීම | 38 |
| 4 මොඩියුලය - අරමුදල් එක්රැස්කිරීම | 42 |
| 5 මොඩියුලය - ස්වේච්ඡා බඳවාගැනීම් | 44 |
| 6 මොඩියුලය - වාර්තා කිරීම හා ඇගයීම | 46 |
| **සිව්වන කොටස** | |
| සක්‍රිය ක්‍රියාමාලා | |
| 1 මොඩියුලය - උද්දේශන සන්නිවේදනය | 47 |
| 2 මොඩියුලය - ජාලගත වීම | 53 |
| 3 මොඩියුලය - බලපෑම් කිරීම | 55 |
| ඇමුණුම | 59 |

## IREX/MEND's උද්දේශන මෙවලම් කට්ටලය වෙත ඔබ සාදරයෙන් පිළිගනිමු!

ඔබ මේ සැරසෙන්නේ ගවේෂණාත්මක චාරිකාවකටයි. මෙම මෙවලම් කට්ටලයේ ඔබට අවශ්‍ය සියලු විස්තර, ශ්‍රී ලංකාවෙන් හා ලෝකයෙන් උදාහරණ ඇතුළු ඔබගේ උද්දේශන ක්‍රියාමාලාව ශක්තිමත් කරගැනීම සඳහා අවශ්‍ය සියලු දේ අඩංගුය.

මෙම අන්තර්ගතය සකස්කරගෙන තිබෙන්නේ මූලාශ්‍ර ගණනාවක් ඇසුරෙනි. එය ශ්‍රී ලාංකික සංදර්භයට ගැලපෙන අන්දමින් සකසාගෙන තිබේ. මෙම ප්‍රකාශනය තුළින් ඔබට වටිනා අදහස් ගොඩනගා ගතහැකි වනු ඇතැයි අපි අපේක්ෂා කරන්නෙමු. ඔබගේ කාර්යයන් මගින් ඔබ ඉගෙනගන්නා පාඩම් ද මෙම අත්පොතට එකතු කර එය පෝෂණය කිරීමට ඔබට හැකිය.

මෙම මෙවලම් කට්ටලය සැකසීමේදී අප විසින් භාවිතා කරන ලද "Politically Smart Advocacy: A guide to Effective Civil Society Advocacy for Sustainable Development" (PACT, 2018) යන ග්‍රන්ථය සම්පාදනය කළ PACT ආයතනයටත්, "Advocacy in restricted spaces: A toolkit for civil society organizations," (Freedom House, 2020) නම් ග්‍රන්ථය සම්පාදනය කළ Freedom House ආයතනයටත් අපගේ ස්තුතිය හිමි වේ.

### ඔබ මෙම මෙවලම් කට්ටලය භාවිතා කළ යුත්තේ ඇයි?



උද්දේශන ක්‍රියාමාර්ග සැලසුම් කිරීම සඳහා හඳුන්වාදීමේ ආකෘතියක් මෙම මෙවලම් කට්ටලයෙන් සපයනු ලැබේ. මෙම මාර්ගෝපදේශය භාවිතා කිරීම සඳහා ඔබට පූර්ව දැනුමක් අවශ්‍ය නැත. ඔබට අවශ්‍ය හැම දෙයක්ම මෙහි අඩංගු වේ. අමතර කියවීම සඳහා යොමුකිරීම් ද ඒ අතර තිබේ.

### මෙම මෙවලම් කට්ටලයෙන් ඔබට ලැබෙන්නේ කුමක්ද?

මෙම මෙවලම් කට්ටලය කොටස් හතරකට යුක්තය:

1) උද්දේශන සැලැස්මක් නිර්මාණය කිරීම

2) ප්‍රතිපත්ති සම්පාදනය

3) සාර්ථක සම්පත් කළමනාකරණය

4) සක්‍රිය ක්‍රියාමාලා

යම් පිළිවෙලකට ඔබ මෙම පාඨමාලාව හදාරන්නැයි අපි නිර්දේශ කරන්නෙමු. එහෙත්, එය අනිවාර්ය නැත. ඔබට අවශ්‍ය නම්, ඔබට කිසියම් කොටසක් මගහැර ගොස්, පසුව එය වෙත ආපසු පැමිණිය හැකිය. ඔබගේ දැනුම පුළුල් කරගැනීම සඳහා එය හොඳ අදහසකි

උද්දේශන සැලසුම් කිරීම

මොඩියුලය 1

## 1. උද්දේශනය යනු කුමක්ද?

**බොහෝ පුද්ගලයන් හා සංවිධාන උද්දේශනය අර්ථ නිරූපණය කිරීමට උත්සාහ දරා තිබේ. පහත දැක්වෙන්නේ කීපයකි:**

"උද්දේශනය යනු යම් අදහසකට හෝ අරමුණකට දක්වනු ලබන ක්‍රියාකාරී සහයෝගයයි. එය ප්‍රකාශ කරනු ලබන්නේ, පුද්ගලයන්ගේ හා සංවිධානවල අදහස් හා තීරණවලට බලපෑම් කළ හැකි උපායමාර්ග සහ ක්‍රමවේද මගිනි. [1]"

"සමාජ හා ආර්ථික සංදර්භය තුළ, උද්දේශනයේ අරමුණ වන්නේ, ජනතා ජීවිතවලට බලපාන ප්‍රතිපත්ති, නීති, රෙගුලාසි, සම්පත් බෙදීයාම හෝ වෙනත් තීරණ නිර්මාණය කිරීම හෝ වෙනස් කිරීම සහ එවැනි තීරණ ක්‍රියාත්මක වන බව සහතික කිරීමයි. [2]"

උද්දේශනය වෙනුවෙන් පැහැදිලි අර්ථකථනයක් ඉදිරිපත් කිරීම පහසු නැත. උද්දේශනය අවබෝධ කරගැනීමේ එක් ආකාරයක් වන්නේ ඒ සමග සමීප සංකල්පයක් වන ක්‍රියාවාදය සමග එය සන්සන්දනය කිරීමයි.

### උද්දේශනය - Advocacy

- උද්දේශනය යනු අරමුණකට, අදහසකට හෝ ප්‍රතිපත්තියකට පක්ෂව කරුණු ඉදිරිපත් කිරීමයි. සාමාන්‍යයෙන් එහි අවසන් අරමුණ වන්නේ, තීරණ ගන්නා පුද්ගලයන් සමග ඍජුව හා ධනාත්මකව සන්නිවේදනය කිරීමයි.
- උද්දේශනය ක්‍රියාත්මක වන්නේ 'පවත්නා ක්‍රමය' තුළය.
- සම්බන්ධතා, ශක්තිමත් ප්‍රතිපත්ති සහ ගරුත්වය උද්දේශනය සමග සම්බන්ධය.
- උද්දේශනය යම් කාරණයක් සම්බන්ධයෙන් ගනුලබන පූර්ව ක්‍රියාමාර්ගයකි. එය ප්‍රගාමී හෝ ප්‍රතිචාරාත්මක විය හැකිය.
- එලදායී උද්දේශනයෙහි සාමාන්‍යයෙන් තිබෙන්නේ එදිරිවාදී නොවන, මෘදු ක්‍රියාමාර්ගයකි. උදාහරණයක් ලෙස, අයවැය ප්‍රතිපාදන, බදු සංශෝධන හා ප්‍රතිපත්ති සැකසීම සම්බන්ධයෙන් කරනු ලබන උද්දේශනය සැලකිය හැකිය.



1 Steve Buckley, Advocacy strategies and approaches: Overview (Association of Progressive Communications)

2 Sofia Sprechman and Emily Pelton Advocacy Tools and Guidelines: Promoting Policy Change (Atlanta: CARE, 2001)

### ක්‍රියාවාදය

- ක්‍රියාවාදය යනු දේශපාලනික හෝ සමාජ අරමුණු දිනාගැනීම සඳහා සෘජු ක්‍රියාමාර්ග ගැනීමයි.
- බොහෝ විට එය සම්බන්ධතා නොමැතිකමෙහි හෝ අසාර්ථක උද්දේශනයෙහි ප්‍රතිඵලයකි. එය සාමාන්‍යයෙන් ගත්කල තනි කාරණාවක් වටා පදනම් වේ.
- එය ඇතැම්විට ප්‍රශ්නකාරී උපායමාර්ග භාවිතා කරයි. ඇතැම් විට ඒවා නීති විරෝධී විය හැකිය (සිවිල් නීති කඩකිරීම, ප්‍රචණ්ඩ නොවන සෘජු ක්‍රියාකාරකම්).
- ක්‍රියාවාදය තුළ තීරණ ගන්නන් සමග තිබෙන්නේ අවම සෘජු සම්බන්ධයක් හා සන්නිවේදනයකි. එබැවින් එහිදී වැඩි විශ්වාසයක් ඇත්තේ මාධ්‍ය කෙරෙහිය.
- එහි අරමුණ වන්නේ දේශපාලනික පීඩනයක් නිර්මාණය කිරීම සඳහා පොදු දැනුවත්භාවය නැංවීමයි.
- 'ක්‍රියාවාදය' නම් සංකල්පය අවබෝධ කරගන්නා ආකාරය හා මාධ්‍යවල ක්‍රියාකාරීන් නිරූපණය කරනු ලබන ආකාරය අනුව, එය නිශේධාත්මක අරුතින් නිරූපණය වීමට ඉඩ තිබේ.

## මොඩියුලය 2

### 2. උද්දේශන සැලැස්මක් නිර්මාණය කිරීම


### 2.1 කෙටි හැඳින්වීමක්

උද්දේශන සැලසුම්කරනය සාර්ථකත්වය පිළිබඳ හුදු බලාපොරොත්තු සහගත සිතීමෙන් ඔබ්බට යා යුතු කාර්යයකි. එය චේතනාන්විත හා මූලෝපායික ක්‍රියාවලියකි. එමගින් ඔබගේ සංවිධානය සාර්ථක, මිනිය හැකි ප්‍රතිඵල වෙත යොමු කරයි. මෙම මොඩියුලය මගින් උද්දේශන සැලසුම්කරන චක්‍රය හඳුන්වාදෙනු ලැබේ. එසේම, සාර්ථක උද්දේශන සැලැස්මක් සැකසීම පියවරෙන් පියවර විස්තර කරදෙනු ලැබේ.

### 2.2 උද්දේශන සැලසුම් චක්‍රය

උද්දේශන සැලසුම් චක්‍රය යනු මාධ්‍ය උද්දේශන සංවිධානයකට සාර්ථක ක්‍රියාකාරී සැලැස්මක් නිර්මාණය කිරීම සඳහා ගත හැකි පියවර හඳුනාගැනීම සඳහා උපකාරී වන මෙවලමකි.

**උද්දේශන සැලසුම් චක්‍රයක් කුමටද?**






උද්දේශන ක්‍රියාමාර්ග එහි ස්වභාවයෙන්ම චක්‍රීයය. සැලැස්ම ක්‍රියාත්මක කිරීම ආරම්භ කළ විට, ඔබ විසින් ප්‍රතිපෝෂණය භාවිතා කරමින් විශ්ලේෂණය කර එම සැලැස්ම වැඩිදියුණු කරමින් ඉදිරියට ගෙන යනු ලැබේ.

## මොඩියුලය 3



### ප්‍රශ්නය හඳුනාගැනීම

ඔබ උද්දේශන ක්‍රියාමාර්ගයක් ගන්නට යන්නේ නම්, ඔබ විසින් පළමුව තීරණය කළ යුතුව තිබෙන කාරණයක් වන්නේ, ඔබට සාක්ෂාත් කරගැනීමට අවශ්‍ය වන්නේ කුමක්ද යන්නයි. එනම්, ඔබටත්, ඔබගේ සාමාජිකයන්ටත්, සමස්තයක් ලෙස ක්ෂේත්‍රයටත් වැදගත් වන ප්‍රශ්නයක් තේරුම්ගැනීමයි.

ශ්‍රී ලංකාවේ මාධ්‍ය පරිසරය තුළ පහත දැක්වෙන ආකාරයේ ප්‍රශ්න දැකිය හැකිය:

- තොරතුරු දැනගැනීමේ අයිතිය
- ජනමාධ්‍යවේදීන්ගේ සේවා තත්වය
- මාධ්‍ය නියාමනය කරනු ලබන නීතිමය පරිසරය. මෙයට බලපත්‍ර ලබාදීම හා සංඛ්‍යාත වෙන්කිරීම ද ඇතුළත්ය.
- ජනමාධ්‍යවේදීන්ට පනවනු ලබන සිවිල් හා නීතිමය දණ්ඩන
- සංස්කාරක නිදහස
- මාධ්‍ය මූලාශ්‍ර ආරක්ෂා කිරීම

වඩාත්ම වැදගත් වන්නේ ඔබගේ ප්‍රජාවට වැදගත් ප්‍රශ්නයක් හඳුනාගැනීමයි. පර්යේෂණ හෝ උපායමාර්ග වෙනුවෙන් ඔබට බාහිර සහයෝගය ලබාගත හැකිය. එහෙත්, ඔබගේ උද්දේශන වැඩසටහනෙහි හරය වන්නේ ප්‍රශ්නයයි. එය සම්බන්ධ අදාළභාවයක් ප්‍රජාවට තිබිය යුතුය.

අදාළ ප්‍රශ්න අවබෝධ කරගැනීම හා හඳුනාගැනීම සඳහා අපට පහත දැක්වෙන ප්‍රශ්න අපගෙන්ම අසාගත හැකිය[3]

- සාර්ථක වුවහොත්, අප පෙනීසිටින වෙනස අපගේ ප්‍රජාවගේ ජන ජීවිතයෙහි සැලකිය යුතු වෙනසක් සිදුකරනවාද? අපගේ සාර්ථකත්වය හේතුවෙන් බලාපොරොත්තු නොවූ ප්‍රශ්න ඇතිවිය හැකිද?
- ප්‍රශ්න හා එයට ලබාදිය හැකි විසඳුම නිරූපණය කරන සාක්ෂි හෝ පර්යේෂණ තිබේද?
- අප විසින් හඳුනාගන්නා ලද ප්‍රශ්නය ප්‍රජාවගේ අතෘප්තියට සැබෑ හේතුවද? මහජනතාව ප්‍රශ්නය දෙස බලන්නේ කෙසේද?
- වෙනස වෙනුවෙන් කරනු ලබන ඉල්ලීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් එකඟතාවක් තිබේද?
- ප්‍රශ්නය ඔබගේ සංවිධානයේ (සහ එයට අරමුදල් සපයන්නන්ගේ) කාර්යභාරයට අදාළද?
- අසාර්ථක වුවහොත්, උද්දේශනයෙන් අපේක්ෂිත වෙනස ලබාගැනීමට අසමත් වීම නිසා ප්‍රජාවගේ ජීවන ගුණාත්මකභාවයේ පිරිහීමක් සිදුවේද? අසාර්ථකත්වය නිසා සිදුවිය හැකි අනපේක්ෂිත ප්‍රතිඵල මොනවාද?

3 Sofia Sprechman and Emily Pelton, Advocacy Tools and Guidelines: Promoting Policy Change (Atlanta: CARE, 2001) 07

සිද්ධි අධ්‍යයනය - 1

## කොංගෝ ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ සීමාකාරී නීති අභියෝගයට ලක්කිරීම

2017 වසරේ සිට, කොංගෝ රාජ්‍යයේ සිවිල් සමාජ සංවිධානවල තත්වය කඩාවැටෙමින් තිබිණි. පොලිසිය හා ආරක්ෂක අංශ සිවිල් සමාජ සංවිධානවලට හා ක්‍රියාධරයන්ට පහරදීම, තර්ජනය කිරීම, සැලසුම් සහගත ලෙස අත්අඩංගුවට ගැනීම හා ඝාතනය සඳහා ඉලක්ක කිරීම පවා සිදුවිය. රජය විවේචකයන්ට එරෙහිව ක්‍රියාමාර්ග ශක්තිමත් කළ අතර, සිවිල් සමාජය වැඩිදුරටත් සීමාකරන නීති යෝජනා ගෙන ආවේය.

අරමුණ: තර්ජන, ප්‍රචණ්ඩත්වය හෝ රජයේ ඇඟිලිගැසීම්වලින් තොරව සිවිල් සමාජ සංවිධානවලට ක්‍රියාත්මක වීමට හැකි වාතාවරණයක් නිර්මාණය කිරීම.

මූලෝපාය: සිවිල් සමාජය සීමාවන්ට යටත් කරන නීති පරාජය කිරීමටත්, සිවිල් සමාජය සඳහා ප්‍රජා සහයෝගය දිනාගැනීමටත් මුලපිරුමක් දේශීය සිවිල් සමාජ සංවිධානයක් විසින් දියත් කරන ලදී.

උපායමාර්ග: ජාතික මට්ටමේ දේශපාලනයට බලපෑම් කිරීමේ දුෂ්කරතාව හේතුවෙන්, ප්‍රාදේශීය මට්ටමේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට බලපෑම් කිරීමට සිවිල් සමාජ සංවිධානය තීරණය කළේය. කෙටුම්පත් කර තිබෙන නීතිය අත්හිටුවීම සඳහා ඔවුන්ගේ සහාය දිනාගැනීම අරමුණ විය. වඩාත්ම ආන්දෝලනාත්මක පළාත් දෙකක් වෙත මූලික අවධානය යොමුකිරීමට සිවිල් සමාජ සංවිධානය තීරණය කළේය. එනම් උතුරු හා දකුණුදිග කිවු පළාත්ය. සිවිල් සමාජ සංවිධානවලට එරෙහි වැඩිම තර්ජන තිබුණේ එම පළාත්වලය. 2017 මැයි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ මෙම පළාත් දෙකෙහි සිවිල් සමාජ සංවිධාන වේදිකා 48ක් නිර්මාණය කිරීමට එම සංවිධානය සහයෝගය ලබාදුන් අතර එම නීතියට එරෙහි උද්දේශනය සම්බන්ධීකරණය කරන ලදී. රජයේ ඉලක්ක බවට පත්ව සිටි ක්‍රියාධරයන්ගෙන් තොරතුරු එක්රැස්කරගැනීම සඳහා ඔවුන් විසින් ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා හයක් පවත්වන ලදී. එසේ ලබාගන්නා ලද තොරතුරු මාධ්‍ය ප්‍රචාරණ ක්‍රියාමාලාවලදී සහ ප්‍රාදේශීය හා පළාත් ප්‍රතිපත්ති සම්පාදකයන් සමග රැස්වීම්වලදී යොදාගන්නා ලදී.

බලපෑම: සාපේක්ෂ වශයෙන් කෙටි කාලයක් තුළදී, පොලිස් නිලධාරීන්ගේ චර්යාව වෙනස් වූ අතර, සාමකාමී ලෙස සිවිල් සමාජ සංවිධාන අධීක්ෂණය කරනු දක්නට ලැබිණි. ඒවාට බාධාකිරීම අවම විය. මාධ්‍ය ක්‍රියාමාලාවේ ප්‍රතිඵලයක් ලෙස සිවිල් සමාජයට මහජන සහාය ද වර්ධනය විය. සිවිල් සමාජ සංවිධාන විසින් පවත්වන ලද අහිංසාවාදී පාගමන්වලට සහාය පිණිස බොහෝ පුරවැසියන් විසින් තම කාර්යාල හා සාප්පු වසාදමන ලදී. ප්‍රාදේශීය මට්ටම කෙරෙහි අවධානය යොමුකරමින් ඉලක්ක අරමුණු මත පිහිටා සිටීමෙන්, සිවිල් සමාජ සංවිධානවලට සැබෑ ප්‍රතිඵල ලබාගත හැකි විය. රාජ්‍ය නොවන සංවිධාන සීමාකරන නීති තර්ජනය තවමත් පවතී. එහෙත්, ඒ සඳහා දැරූ මුල් උත්සාහය පසුබැස්වීමට සිවිල් සමාජ සංවිධාන සමත් විය.

### සිද්ධි අධ්‍යයන විශ්ලේෂණය

ඉහත සඳහන් කරන ලද උදාහරණයේ දැක්වෙන ක්‍රියාමාලාවේ දුර්වලකම් මොනවාද?
එය අසාර්ථක වී නම් ප්‍රජාවට කුමන බලපෑමක් ඇතිවිය හැකිව තිබුණිද?
අවදානම අවම කිරීම සඳහා ඔවුන්ට ගත හැකිව තිබුණු පියවර කීපයක් නම්කළ හැකිද?

ශ්‍රී ලංකාවේ මේ හා සමාන උද්දේශන ක්‍රියාමාර්ගයක් ගැන ඔබට මතක් වෙනවාද? මාධ්‍යවලට නිශේධාත්මක අන්දමින් බලපාන නීති කෙටුම්පතක් තිබෙනවාද? ඔබගේ සංවිධානය ඒ සම්බන්ධයෙන් කිසියම් ක්‍රියාමාර්ගයක් ගත්තාද? එය සාර්ථක වුණාද? එහි කිසියම් නිශේධාත්මක ප්‍රතිඵල තිබුණාද?

## මොඩියුලය 04

### ප්‍රශ්නය/ ලබාදිය හැකි විසඳුම් විශ්ලේෂණය කිරීම

යම් ප්‍රශ්නයක් වෙනුවෙන් ක්‍රියාත්මක වීමේ තීරණය ගන්නා විට, සාර්ථක වීමට තිබෙන අවස්ථාව කෙරෙහි ද අවධානය යොමුකළ යුතුය. එසේම, සංදර්භයේ ඉතිහාසය හා කාලය තුළ සිදුවූ පරිණාමය කෙරෙහි ද අවධානය යොමුකළ යුතුය. අප පහත දැක්වෙන ප්‍රශ්න අපගෙන්ම අසාගත යුතුය:

- අතීතයේ දරණ ලද උත්සාහයන් මොනවාද?
- සාර්ථක වූයේ කුමක්ද? එය සාර්ථක වූයේ ඇයි?
- අසාර්ථක වූයේ කුමක්ද? එය අසාර්ථක වූයේ ඇයි?

සාර්ථක වීමේ අවස්ථාව සම්බන්ධයෙන් අප යථාර්ථවාදී විය යුතුය. එහිදී හුදු බලාපොරොත්තු සහගත වීමේ තේරුමක් නැත.



විශ්ලේෂණය තුළදී පහත දැක්වෙන ප්‍රශ්න මතුවනු ඇත.

- අපට අවශ්‍ය සියලු තොරතුරු තිබේද?
- අපට අවශ්‍ය අමතර තොරතුරු මොනවාද?
- අලුත් තොරතුරු එක්රැස් කිරීම සඳහා භාවිත කළ හැකි මූලාශ්‍ර මොනවාද?
- දැනුම මඳකම මගහරවාගැනීම සඳහා කළ හැකි අධ්‍යයන මොනවාද?

ප්‍රශ්නය විශ්ලේෂණය කිරීමට උත්සාහ කිරීමේදී අප පහත දැක්වෙන කරුණු කෙරෙහි අවධානය යොමුකළ යුතුය.

- ප්‍රශ්නයට හේතුවන පොදු ප්‍රතිපත්ති තිබේද?
- ප්‍රශ්නය සම්බන්ධ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ වගකීම තිබෙන්නේ කාටද?
- පවත්නා තත්වය වෙනුවෙන් උද්දේශනය කිරීමෙන් වාසි අත්පත් කරගන්නා පිරිසක් සිටිනවාද?
- වෙනස්කම් සිදුකිරීමේ හැකියාව තිබෙන පාර්ශ්ව ප්‍රතිපත්ති තේරුම්ගන්නේ කෙසේද?

මෙම ප්‍රශ්නය වටා තිබෙන දේශපාලන සංදර්භය හා යෝජිත විසඳුම් අවබෝධ කරගැනීම විශ්ලේෂණයේ තවත් වැදගත් කොටසකි. දේශපාලන වාතාවරණය සකස් වන්නේ වඩාත් ශක්තිමත් බලවේගය අනුවය. උද්දේශනයේදී අප සාමාන්‍යයෙන් දේශපාලන බලයේ තුන් ආකාරයක් හඳුනාගන්නෙමු. එනම්, විධිමත්, අවිධිමත් හා අදෘෂ්‍යමාන බලයන්ය.

ප්‍රශ්නයේ පසුබිම හා ලබාදිය හැකි විසඳුම් පිළිබඳ පූර්ණ අවබෝධයක් ලබාගැනීම සඳහා අප බලයේ මෙම මූලාශ්‍ර තුනම අවබෝධ කරගත යුතුය. ඇතැම්විට, අවශ්‍ය ප්‍රතිපත්තිමය සංශෝධන සිදුකිරීමෙන් අනතුරුව පවා, දිගුකාලීනව බලපාන ප්‍රතිවිපාක ඇතිවිය හැකිය. සාධාරණ ප්‍රශ්නයක් සම්බන්ධයෙන් ඔබගේ හඬ අවදිකිරීම හේතුවෙන් පවා මාධ්‍ය ප්‍රජාවට සහ උද්දේශනයේ යෙදෙන අයට අහිතකර ප්‍රතිඵල ඇතිවිය හැකිය. සාර්ථක ලෙස පොදු ප්‍රතිපත්ති වෙනස්කිරීමෙන් පවා ඇතැම්විට අනපේක්ෂිත ප්‍රතිඵල ඇතිවිය හැකිය. ඒවා පුද්ගල හා පොදු

ආරක්ෂාවට බලපෑ හැකිය. සංදර්භය පිළිබඳ පූර්ණ අවබෝධයක් ලබාගැනීම සඳහා සියලු පියවර කල්තබා සැලසුම් කළ යුතුය.

## සිද්ධි අධ්‍යයනය 2

සාපරාධී අපහාස නීතිය ශ්‍රී ලංකාවේ මහත් විවාදාත්මක නීතියකි. බ්‍රිතාන්‍ය යටත්විජිත පාලන සමයේ ක්‍රියාත්මක කරන ලද එය 1948 නිදහසින් පසුව ද ක්‍රියාත්මක විය. එම නීතිය මාධ්‍ය මර්දනය සඳහා යොදාගන්නා ලදී. අපහාස නීති මගින් අපේක්ෂා කරනු ලැබුවේ පුද්ගල කීර්තිය ආරක්ෂා කිරීමයි. එහෙත්, එක්දහස් නවසිය හැත්තෑගණන්වල සිට බලයට පත්වූ ආණ්ඩු විසින් පුවත්පත් සංස්කාරකවරුන්ට පීඩාකිරීම හා මාධ්‍ය සීමාකිරීම සඳහා එම නීති භාවිත කරන ලදී.

මාධ්‍ය ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් උපදෙස් ලබාදීම සඳහා පත්කරන ලද ආර්.කේ.ඩබ්ලිව් ගුණසේකර කමිටුව විසින් 1995දී සාපරාධී අපහාස නීතිය හා සම්බන්ධ දණ්ඩනීති සංග්‍රහයේ 118, 120 හා 479 වගන්ති ඉවත්කිරීමට නිර්දේශ කරන ලදී. කෙසේ වෙතත්, 2002 දක්වාම එය ක්‍රියාත්මක වූයේ නැත.

වසර දහයක් පමණ වන මෙම අතරමැදි කාලය තුළදී ශ්‍රී ලාංකික මාධ්‍ය ක්‍රියාධරයන් ඒ වෙනුවෙන් උද්දේශන ක්‍රියාමාලා රැසක් සිදුකළහ.

අගමැති රනිල් වික්‍රමසිංහ සමග 2002 ජනවාරි මාසයේදී පවත්වන ලද සාකච්ඡාවකදී, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය, කර්තෘ සංසදය හා ප්‍රකාශකයන්ගේ සංගමය යන මාධ්‍ය සංවිධාන තුනෙහි නියෝජිතයන් සහ රජය අතර ගිවිසුමකට එළඹෙන ලදී. රටේ අදහස් ප්‍රකාශනයේ නිදහස ශක්තිමත් කිරීම සඳහා වන ප්‍රතිසංස්කරණ පැකේජයක් එයට අයත් විය. අදහස් ප්‍රකාශනයේ නිදහසට බාධාකාරී නීති අහෝසිකිරීම, තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනතක් හඳුන්වාදීම, පුවත්පත් පාලක මණ්ඩලය වෙනුවට ස්වාධීන පුවත්පත් පැමිණිලි කොමිෂන් සභාවක් පත්කිරීම සහ ස්වාධීන මාධ්‍ය පුහුණු ආයතනයක් පිහිටුවීම ඒ අතර විය.

2002දී, සාපරාධී අපහසාස නීතිය අහෝසි කිරීම, මාධ්‍ය උද්දේශන සංවිධාන විසින් ප්‍රශ්නය හා සම්බන්ධ බලය හා දේශපාලන සංදර්භය විශ්ලේෂණය කර විසඳුම් යෝජනා කිරීම සම්බන්ධයෙන් හොඳ උදාහරණයකි. බලයේ ස්වභාවය හා දේශපාලනික පරිසරය විශ්ලේෂණය කරගැනීමෙන්, වෙනස්කම් සඳහා බලපෑම් කිරීමට යෝග්‍යම මොහොත



NEWSROOM

**Letter: Sri Lanka government repeals criminal defamation laws**

Jul 8, 2002

His Right Hon. Ranil Wickramasinghe
Prime Minister
Office of the Prime Minister
Democratic Socialist Republic of Sri Lanka
58, Sir Ernest de Silva Mawatha
Colombo 7
Fax: 0094 1 385670

8 July 2002

Your Excellency,

The International Press Institute (IPI), the global network of editors, leading journalists and media executives, wishes to warmly congratulate both the government and parliament of Sri Lanka on its decision to repeal the criminal defamation laws.

According to information provided to IPI, on 18 June, members of parliament unanimously voted to repeal the country's defamation laws. Enacted during British colonial rule and kept on the statute books when Sri Lanka gained its independence in 1948, the laws have been used to intimidate the media. An IPI protest dated 26 July 2001 revealed that editor-in-chief of the Ravaya newspaper, Victor Ivan, faced four outstanding criminal defamation charges. Prior to this case, there were numerous prosecutions of editors and journalists.

By repealing the defamation laws, IPI believes Your Excellency is displaying a new commitment to press freedom in Sri Lanka. After so many years of false promises, IPI finds it deeply encouraging that the present government is making good on its promises to local press freedom organisations, in particular, the Free Media Movement, The Editors Guild of Sri Lanka and the Newspaper Society of Sri Lanka. All of these organisations have long championed the cause of press freedom, through some of the most difficult periods in Sri Lanka's history, and the government is to be applauded for acting upon the recommendations of these organisations.

Aside from the defamation laws, IPI looks forward to further changes in the Sri Lankan legislation. Indeed, IPI notes that the government has also decided to draft a Right to Information Act and is working with local media organisations on an Independent Press Complaints Commission and intends to repeal the present Press Council Act. Furthermore, IPI has been told that the Press Performance Act may also be repealed and that the government has promised to review secrecy laws.

IPI hopes the government will press ahead with these and other changes and that it will create a media environment which can be emulated by other countries in the region. Furthermore, if such changes are undertaken, IPI will actively consider the removal of Sri Lanka from the "IPI Watch List" at its board meeting in November of this year.

Congratulations once again on the progress you have made.

We thank you for your attention.

Johann P. Fritz
Director
International Press Institute (IPI)



Home>>World

Last updated at: (Beijing Time) Friday, April 26, 2002

**Sri Lanka to Repeal Criminal Defamation Law**

The Sri Lankan government has decided to repeal the criminal defamation law which provides for a two year jail term and fine for media personnel in the first week of May, local media reported on Friday.

PRINT DISCUSSION CHINESE SEND TO FRIEND

The Sri Lankan government has decided to repeal the criminal defamation law which provides for a two year jail term and fine for media personnel in the first week of May, local media reported on Friday.

Justice Minister W.J.M. Lokubandara said that the cabinet gave its approval to repeal the criminal defamation law on Wednesday.

A person subject to defamation may file a civil action for damages since the civil law of defamation will continue to remain.

"Those who feel that they have been defamed could continue to seek damages under the civil laws of this country," Lokubandara said.

The criminal defamation law has been in place since the Britishcolonial rule in the country which won its independence in 1948.

FMM welcomes repeal of criminal defamation law - IFEX
Microsoft Word - lanka94.doc (refworld.org)

https://ipi.media/letter-sri-lanka-government-repeals-criminal-defamation-laws/

හඳුනාගැනීමට මාධ්‍ය සංවිධානවලට හැකි විය. ඒ ඔස්සේ ශ්‍රී ලංකාවේ ප්‍රකාශනයේ නිදහස සහ මාධ්‍ය ක්ෂේත්‍රය වෙනුවෙන් වාසිදායක ප්‍රතිඵලයක් ලබාගැනීමට හැකිවිය.

කෙසේ වෙතත්, මෑත කාලයේදී, සාපරාධී අපහාස නීතිය නැවත හඳුන්වාදීම සඳහා දේශපාලන පීඩනය ගොඩනැගෙමින් තිබේ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විසින් ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලද කරුණු 11කින් සමන්විත යෝජනා මාලාව තුළ සාපරාධී අපහාස නීතිය නැවත හඳුන්වාදීම ද තිබිණි.

බලය පිළිබඳ අවසන් කාරණාව වෙත මෙය අප රැගෙන යයි.

SLFP pushing hard to reintroduce criminal defamation | Sunday Observer


SLFP pushing hard to reintroduce criminal defamation

අධ්‍යයන විශ්ලේෂණය

අප මීට පෙර සාකච්ඡා කළ කරුණු වෙත ආපසු යමු. ඔබ 2001 සමයේ මාධ්‍ය ක්‍රියාකාරිකයකු යයි සිතන්න. ඔබට පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය හැකිද?

අපට අවශ්‍ය සියලු තොරතුරු තිබේද?

අපට අවශ්‍ය අමතර තොරතුරු මොනවාද?

අලුත් තොරතුරු එක්රැස් කිරීම සඳහා භාවිතා කළ හැකි මූලාශ්‍ර මොනවාද?

දැනුම මදකම මගහරවාගැනීම සඳහා කළ හැකි පර්යේෂණ මොනවාද?

අපි දැන් වර්තමානය වෙත හැරෙමු. ඉහත දක්වන ලද පුවත්පත් ලිපිය මත පදනම්ව මෙම නිර්ණායක භාවිතා කරමින් තත්වය විශ්ලේෂණය කරන්න. මෙම ප්‍රශ්නයට හේතුව ලෙස සැලකිය හැකි පොදු ප්‍රතිපත්ති දැනට ක්‍රියාත්මක වෙමින් තිබේද? ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වගකිව යුත්තේ කවුරුද?

පවත්නා තත්වය වෙනුවෙන් උද්දේශනය කිරීමෙන් වාසි අත්පත් කරගන්නා පිරිසක් සිටිනවාද?

වෙනස්කම් සිදුකිරීමේ හැකියාව තිබෙන පාර්ශ්ව ප්‍රතිපත්ති තේරුම්ගන්නේ කෙසේද? වෙනස්කම් වෙනුවෙන් පෙනීසිටින සංවිධාන ඔවුන් පිළිගන්නවාද?

**උපදෙසක්: පක්ෂපාතීත්වය ප්‍රශ්නයක් වී තිබෙන විටදී**

මෙවැනි තත්වයන්හිදී, එදිරිවාදී මානසිකත්වයකින් යුතුව ඔබගේ උද්දේශන සැලසුම්කරණය ආරම්භ කිරීමෙන් වළකින්න.

සාමාන්‍යයෙන් ගත් කල, බලයේ සිටින අය පිළිබඳ එදිරිවාදී ආස්ථානවල සිටිමින් ක්‍රියාමාලා ආරම්භ කරන්නෝ මුලදීම තම හැකියාවෙන් අඩක් අහිමි කරගනිති. සුබවාදී ප්‍රයත්නයන් ලෙස ආරම්භ වන උද්දේශන ක්‍රියාමාලා පවා පසුව සෘජු ක්‍රියාවාදයන් හා වෙනත් එදිරිවාදී උපායමාර්ග වෙත යොමුවිය හැකිය. එසේ වීමෙන් පසුව, ඒවා ආපසු සුබවාදී ප්‍රයත්නයන් බවට පත්කිරීම දුෂ්කරය.

## මොඩියුලය 5

### පරදු දරන්නන් (stakeholders) හා පරිසරය



පරදු දරන්නන් යනු කවුරුද?

කිසිදු සංවිධානයක් හෝ ව්‍යාපාරයක් පවතින්නේ රික්තයක නොවේ. අපගේ දෛනික කාර්යයන්වලදී අපි බොහෝ සම්බන්ධතා පවත්වන්නෙමු. ඇතැම් සම්බන්ධතා පවත්වන්නේ අභ්‍යන්තර පාර්ශ්වයන් සමග වන අතර තවත් සමහර සබඳතා බාහිර පාර්ශ්වයන් සමගය. ඇතැමෙකුට ඔබගේ සංවිධානය සමග ඍජු අදාළත්වයක් තිබේ. සේවකයන්, පාරිභෝගිකයන්, ආයෝජකයන් හා පරිත්‍යාගශීලීන් එවැනි අයයි. දේශපාලන නියෝජිතයන්ධ, නීති සම්පාදකයන්, ප්‍රතිපත්ති සම්පාදකයන් ආදීන් ද ඒ අය අතර සිටිය හැකිය. ඔබගේ උද්දේශන මුලපිරුමේදී ඔබට ඉලක්ක කිරීමට අවශ්‍ය වන්නේ කුමක්ද?

### ඔබගේ පරදු දරන්නන් හඳුනාගැනීම

### 1 පියවර: පරදු දරන්නන් වර්ග කරන්න

ඍජු: පාරිභෝගිකයන්, සාමාජිකයන්, සේවකයන්

මූල්‍ය: ආධාරකරුවන්, ආයෝජකයන්, පරදු දරන්නන්

පොදු පරදු දරන්නන්: දේශපාලන නියෝජිතයන්, මන්ත්‍රීවරුන්, පොදු ප්‍රතිපත්ති සම්පාදකයන්, පෞද්ගලික ප්‍රතිපත්ති සම්පාදක ප්‍රජාව, නියාමන ආයතන

නියෝජිත පරදු දරන්නන්: වෘත්තීය සමිති, සාමාජිකත්ව හා නියෝජිත සංවිධාන (වෙළඳ සංවිධාන, සම්මේලන), අභිලාෂය දක්වන කණ්ඩායම් (රාජ්‍ය නොවන සංවිධාන, ක්‍රියාමාලා සංවිධානය කරන කණ්ඩායම් - මේවා ප්‍රාදේශීය, ජාතික හෝ ජාත්‍යන්තර විය හැකිය)

එලදායී පරදු දරන්නන්: හැඟීම්බර ලෙස සම්බන්ධ වන පරදු දරන්නන් (මිතුරන්, පවුල, ආධාරකරුවන්) ආදි සිසුන්, සම වයස් කණ්ඩායම්.


මාධ්‍ය: ප්‍රාදේශීය, පළාත්, ජාතික ජාත්‍යන්තර, විකාශන, මුද්‍රිත, නව මාධ්‍ය හා පොදු ජනතාව

වැදගත් ප්‍රතිපත්ති සම්පාදකයන් හා අදාළ සියලුම පරදු දරන්නන් ඔබ විසින් හඳුනාගත යුතුව තිබේ. ප්‍රශ්නය සම්බන්ධයෙන් ඔවුන්ගේ අභිලාෂයන් හා විවෘතභාවය සැලකිල්ලට ගත යුතුය. ක්‍රියාමාර්ග සඳහා සුදුසු කාලය හඳුනාගත යුතුය. උදාහරණයක් ලෙස, නීතිමය හෝ වෙනත් කාලසීමාවන් තිබේදැයි බැලිය යුතුය.

ඔබගේ සාර්ථකත්වය සඳහා පරදු දරන්නන් සමග තිබෙන සම්බන්ධය ඉතා වැදගත්ය. ක්‍රියාවාදය මෙන් නොව, උද්දේශනය යනු සම්බන්ධතා පාදක ප්‍රවේශයකි. පරදු දරන්නන් සමග යහපත් සබඳතා පැවතීම සහ පරදු දරන්නන් ඔබගේ අරමුණු වෙනුවෙන් කළමනාකරණය කරගැනීම ව්‍යාපෘතියේ සාර්ථකත්වයට විශාල වශයෙන් බලපායි.

පරදු දරන්නන්ගේ වැදගත්කම අප විසින් ආමන්ත්‍රණය කරනු ලබන ප්‍රශ්නය අනුව වෙනස් වේ. ඔබගේ පරදු දරන්නන් වර්ග කරන්නට දැනගැනීම ප්‍රතිපත්ති සම්පාදනයේදී වැදගත්ය. පරදු දරන්නන් හඳුනාගැනීම ඔබගේ ස්ථාවරය වෙනුවෙන් පෙනීසිටීමේදී ඉතා වැදගත්ය.

ප්‍රශ්න හා සම්බන්ධ වාතාවරණයකදී අප ඔවුන්ගේ ස්ථාවරය හඳුනාගන්නට උත්සාහ කිරීම මගින් අපට ප්‍රශ්නය හා සම්බන්ධ බලය, බලපෑම් කිරීමේ හැකියාව හා අභිලාෂය අනුව පරදු දරන්නන් වර්ග කළ හැකිය




ඉහළ බලපෑම් හැකියාවක් හා ඉහළ කැමැත්තක් තිබෙන පරදු දරන්නන් උද්දේශනයේදී ප්‍රමුඛතාව ලබාදිය යුතු වැදගත් ක්‍රියාකරුවන් වේ.

**සිද්ධි අධ්‍යයන විශ්ලේෂණය**

2002 වසරේදී, අගමැති රනිල් වික්‍රමසිංහගේ නායකත්වයෙන් යුත් රජය විසින් ඉවත්කරනු ලබන තෙක්ම, අපහාසය සාපරාධී වරදක් ලෙස සැලකුණු අතර දණ්ඩ නීති සංග්‍රහය යටතේ වසර දෙකක සිර දඬුවමකට ලක්කරන ලදී. සාපරාධී අපහාස නීතිය අහෝසි කරදැමූ දකුණු ආසියාවේ පළමු හා එකම රට ශ්‍රී ලංකාවයි.

මාධ්‍ය සංවිධාන හා බලපෑම් කණ්ඩායම් විසින් දශකයක් පුරා සිදුකරන ලද අරගලකාරී ක්‍රියාමාලා රැසකින් පසුව, 2002 ජූනි 18 දින සාපරාධී අපහාස නීතිය නීති පොතෙන් ඉවත් කරන ලදී. මෙම ක්‍රියාමාලාවට ජාත්‍යන්තර සංවිධාන කීපයක සහයෝගය ලැබිණි. ඒ අතර International Press Institute (IPI), International PEN, World Association of Newspapers, Commonwealth Press Union (CPU), Committee to Protect Journalists (CPJ), Article XIX සහ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිෂන් සභාවේ ප්‍රකාශනයේ නිදහස පිළිබඳ විශේෂ වාර්තාකරු ද සිටියහ.

විවිධ වර්ගවල පාර්ශ්වකරුවෝ මෙම ක්‍රියාවලියේ කොටස්කරුවෝ වූහ.

ඍජු: ජනමාධ්‍යවේදීන්

මූල්‍ය: මාධ්‍ය ආයතන

පොදු: මහජනතාව

නියෝජිතයන්: මාධ්‍ය අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සංවිධාන

ඵලදායී: පවුල්, සම කණ්ඩායම්

මාධ්‍ය: සියලු මාධ්‍ය

අපගේ පාර්ශ්වකාර විශ්ලේෂණ මෙවලම ඔස්සේ පරදු දරන්නන් පහත දැක්වෙන අන්දමින් වර්ගීකරණය කළ හැකිය:

| ඉහළ බලපෑම් හැකියාව, අඩු කැමැත් | ඉහළ බලපෑම් හැකියාව, ඉහළ කැමැත්ත |
| --- | --- |
| විපක්ෂ දේශපාලන නායකයන්<br>සාමාන්‍ය මන්ත්‍රීවරු | ජාත්‍යන්තර මාධ්‍ය උපකාරක සංවිධාන<br>ජාත්‍යන්තර මාධ්‍ය හිමිකම් ක්‍රියාකාරිකයෝ<br>ජාත්‍යන්තර ප්‍රමිතිවලට ගරුකරන දේශපාලන නායකයෝ<br>මානව හිමිකම් උද්දේශකවරු |
| අඩු බලපෑම් හැකියාව, අඩු කැමැත්ත<br><br>මහජනයා | අඩු බලපෑම් හැකියාව, ඉහළ<br><br>ජනමාධ්‍ය |



6 මොඩියුලය

## අරමුණු හා අභිමතාර්ථ

යථාර්ථවාදී අරමුණු හා අභිමතාර්ථ සකසාගැනීම උද්දේශනයේදී වැදගත්ය. ප්‍රශ්නය තිරසර ලෙස විසඳනු ඇත්තේ පොදු ප්‍රතිපත්තිවල කුමන වෙනස විසින්ද? සමස්ත අරමුණ වෙත ළඟාවීම සඳහා උපකාරී වන්නේ කුමන අභිමතාර්ථ ද?

උද්දේශන අරමුණු සකසාගැනීම සඳහා සදා නිම කළ එක් ක්‍රමයක් නැත. පහත දැක්වෙන මෙවලම ඔබගේ අරමුණු පරීක්ෂා කරගැනීමේදී ප්‍රයෝජනවත් විය හැකිය.



## සිද්ධි අධ්‍යයනය 3

2016 අංක 12 දරණ ශ්‍රී ලංකා තොරතුරු දැනගැනීමේ හිමිකම් පනත 2017 පෙබරවාරි 3 දින බලාත්මක කරන ලදී. තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ සාකච්ඡාව 1994 සිට ඉදිරියට ආ එකකි. 1994 මැතිවරණයේදී පොදු පෙරමුණට සහාය දැක්වූ සිවිල් සමාජ සංවිධාන විසින් එවැනි පනතක අවශ්‍යතාව මතු කරන ලදී.

තොරතුරු දැනගැනීමේ පනත සම්බන්ධ පළමු සටහන පළකරනු ලැබුවේ 1994දීය. ඒ සංචාරක, තොරතුරු හා ගුවන් සේවා පිළිබඳ ඇමති ධර්මසිරි සේනානායක විසින් ඉදිරිපත් කරන ලද ‘රජයේ මාධ්‍ය ප්‍රතිපත්තිය’ නම් කැබිනට් පත්‍රිකාවෙහිය. ඉන් අනතුරුව, සිවිල් සමාජයේ හා රජයේ මෙහෙයුම්කරුවන් විසින් තොරතුරු දැනගැනීමේ අයිතිය බලාත්මක කිරීම සඳහා දැඩි අරගලයක් දශකයක් පුරා කරන ලදී.

### තොරතුරු දැනගැනීමේ අයිතිය සම්බන්ධ උද්දේශනයේ ඉතිහාසය

**1994** සංචාරක, තොරතුරු හා ගුවන් සේවා පිළිබඳ ඇමති ධර්මසිරි සේනානායක විසින් රජයේ මාධ්‍ය ප්‍රතිපත්තිය’ නම් කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කිරීම

**1995** මාධ්‍ය නිදහසට හා ප්‍රකාශනයේ නිදහසට බලපාන නීති සංශෝධනය කිරීම සඳහා රජයට උපදෙස් දීම පිණිස ජොෂ්ඨ නීතිඥ ආර්.කේ.ඩබ්ලිව් ගුණසේකර සභාපතිත්වය දරන කමිටුවක් පත්කිරීම. එම කමිටුව විසින් තොරතුරු නිදහස පිළිබඳ පනතක් කෙටුම්පත් කිරීමට නිර්දේශ කරන ලදී.

**1996** විනිසුරු ඒ.ආර්.බී. අමරසිංහ විසින් සභාපතිත්වය දරන ලද ශ්‍රී ලංකා නීති කොමිෂන් සභාව විසින් තොරතුරු නිදහස පිළිබඳ පනත කෙටුම්පත් කරන ලදී.

**1998** මාධ්‍ය නිදහස හා සමාජ වගකීම පිළිබඳ කොළඹ ප්‍රකාශය. මෙයට නායකත්වය දුන්නේ ශ්‍රී ලංකා වෘත්තීය පුවත්පත් කලාවේදීන්ගේ සංගමය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය, ශ්‍රී ලංකා පුවත්පත් සමාජය සහ ශ්‍රී ලංකා කර්තෘ සංසදයයි. එම ප්‍රකාශය මගින් ශ්‍රී ලංකාවේ තොරතුරු දැනගැනීමේ අයිතිය නීතිගත කිරීම අවධාරණය කරන ලදී.

**2000** 2000 වසරේදී කෙටුම්පත් කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි ද තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ වගන්තියක් අඩංගු විය. එහෙත්, මෙම කෙටුම්පත පාර්ලිමේන්තුවේදී සම්මත කිරීමට නොලැබිණි.

**2004** 2004දී අග්‍රාමාත්‍ය කමිටුවක් විසින් තොරතුරු නිදහස පිළිබඳ පනත කෙටුම්පත් කරන ලදී. එය කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරනු ලැබ පාර්ලිමේන්තුවේ සභාගත කරන ලදී.

**2010** අධිකරණ ඇමති මිලින්ද මොරගොඩ විසින් කරන ලද මූලපිරුමක් අනුව මෙම කෙටුම්පත 2010 වසරේදී සංශෝධනය කරන ලදී.

**2011** 2004දී කෙටුම්පත් කරන ලද තොරතුරු නිදහස පිළිබඳ පනත 2011 වසරේදී එවකට විපක්ෂ මන්ත්‍රීවරයකු වූ කරු ජයසූරිය විසින් පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ලෙස ඉදිරිපත් කරන ලදී. එහෙත්, එය පාර්ලිමේන්තුවේ විවාදය සඳහා නොගැනිණි. පසුව උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාව විසින් එහි අවසන් වාර්තාව මගින් තොරතුරු දැනගැනීමේ අයිතිය නීතිගත කිරීමට නිර්දේශ කරන ලදී.

**2013** එය 2013 උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාවේ ජාතික ක්‍රියාකාරී සැලැස්මෙහි සක්‍රිය ලක්ෂ්‍යයක් ලෙස ඇතුළත් කරන ලදී.

**2015** 19වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් සමග පුරවැසියන්ට තොරතුරු ලබාගැනීමේ අයිතිය සඳහා ව්‍යවස්ථාමය අයිතියක් ලැබිණි.

**2016** 2016 ජූනි 23 දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත සම්මත කරන ලද අතර එමගින් තොරතුරු දැනගැනීමේ පුරවැසි මූලික අයිතිවාසිකම අර්ථවත් විය.

ඉහත දක්වන ලද SMART ක්‍රමය අනුගමනය කරමින් අරමුණක් දිනාගැනීම පිළිබඳ උදාහරණයක් ලෙස මෙය සැලකිය හැකිය:

**SPECIFIC විශේෂිත වීම**: අනුගත නොවීම සම්බන්ධයෙන් පැමිණිලි පිළිබඳ විමර්ශනය කිරීමේ සහ වැරදිකාර නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග නිර්දේශ කිරීමේ බලය සහිත අධීක්ෂණ හා බලාත්මක කිරීමේ මධ්‍යම නියෝජිතායතනයක් ලෙස ව්‍යවස්ථාමය වශයෙන් ස්වාධීන ව්‍යූහයක් පිහිටුවීම.

**MEASURABLE මිනිය හැකි වීම**: තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිෂන් සභාවෙහි අභිමතාර්ථ සම්පාදනය කරනු ලැබුවේ මිනිය හැකි අවසන් අරමුණු පිළිබඳ පැහැදිලි දැක්මක් සහිතවය. ව්‍යවස්ථා සභාවේ නිර්දේශානුකූලව ජනාධිපතිවරයා විසින් පත්කරනු ලබන සභාපතිවරයකු හා සාමාජිකයන් සිව්දෙනෙකුගෙන් සමන්විත ස්වාධීන ව්‍යවස්ථාපිත කොමිෂන් සභාවක් පිහිටුවනු ලැබේ. ශ්‍රී ලංකා නීතිඥ සංගමය, මාධ්‍ය සංවිධාන සහ වෙනත් සිවිල් සමාජ සංවිධාන විසින් නම්කරන ලද එක් පුද්ගලයකු බැගින් ව්‍යවස්ථා සභාව විසින් නිර්දේශ කළ යුතුය. .

**ATTAINABLE අත්කරගතහැකි වීම:** සම්පත් කළමනාකරණය, සම්පත් වෙන්කිරීම, දේශපාලන බල විශ්ලේෂණය සහ සීමාවන් විනිවිද යමින් දැනුම බෙදාගැනීම යහභාවිතාවන්ට අයත් වේ. උද්දේශකවරුන් විසින් සොයාබලනු ලැබුවේ, ශ්‍රී ලංකාවේ මාධ්‍ය පරිසර පද්ධතිය තුළ ප්‍රායෝගිකව අත්කරගත හැකි අභිමතාර්ථ පමණි.

**RELEVANCE අදාළ වීම**: මෙම උදාහරණයෙහිදී අභිමතාර්ථ සකසාගැනීමේදී අදාළත්වය ඉතා වැදගත් භූමිකාවක් ඉටුකළේය. ගුණාත්මක තොරතුරු වෙත බාධා විරහිත ප්‍රවේශය තහවුරු කරගැනීම සඳහාත්, කූට නිලධාරීන්ට තොරතුරු වසන් කිරීමට නොහැකි වීම සඳහාත් තොරතුරු දැනගැනීමේ අයිතිය ජනමාධ්‍යවේදීන්ට ඉතා වැදගත්ය. දැනුවත් තීරණ ගැනීමේදී අවශ්‍ය වන තොරතුරු මහජනයා වෙත ලැබෙන බව තහවුරු කිරීම සඳහා එය උපකාරී විය. කොමිෂන් සභාව හා එය වටා සමස්ත යාන්ත්‍රණය තක්සේරු කරනු ලැබුවේ අරමුණු යථාර්ථවාදී ලෙස සාක්ෂාත් කරගන්නා බව තහවුරු කරනු පිණිසය.

**TIMELY කාලීන වීම:** තොරතුරු දැනගැනීමේ අයිතිය සඳහා අභිමතාර්ථ සැකසීම එම වකවානුවේදී අවශ්‍ය විය. සෑම ආණ්ඩුවක් යටතේම, තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ උද්දේශකවරුන් කටයුතු කළේ සකස් කරගන්නා ලද කාලසීමාවන් ඇතුළත සාක්ෂාත් කරගන්නා ලද ප්‍රගතිය තක්සේරු කරමින්, සංයුක්ත හා කාලීන අන්දමින් අභිමතාර්ථ සකසාගනිමින් අරමුණ කරා ළඟාවන පරිදිය. ඉහත දක්වන ලද තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ ඉතිහාස කාලසටහන මගින් එම ක්‍රියාවලිය කෙටියෙන් විස්තර කරනු ලැබේ.



## 7 මොඩියුලය

### ප්‍රතිපත්තිමය ස්ථාවරය හා ඉල්ලීම් පැහැදිලි කරගැනීම

මේ වන විට, අප විසින් ප්‍රශ්නයක් හඳුනාගෙන, එය විශ්ලේෂණය කර, මනාව ග්‍රහණය කරගෙන තිබේ. අප දැන් අපගේ ප්‍රතිපත්තිමය ස්ථාවරය සියුම් ලෙස විග්‍රහ කරගත යුතුය. අපගේ උද්දේශන **ඉලක්ක** හා **ඉල්ලීම්** ද සැලසුම් කරගත යුතුය. අපගේ දැක්ම මත පදනම් වෙමින්, අප විසින් දැනටමත් කලින් පියවර සාර්ථක කරගෙන තිබේ.

ඉලක්ක යනු වෙනස්කම් සිදුකළ හැකි ස්ථානවල සිටින පුද්ගලයන්ය. පරදු දරන්නන් හඳුනාගැනීමේ අභ්‍යාසය ඔස්සේ අප මේ වන විටත් ඔවුන් හඳුනාගෙන තිබිය හැකිය. බොහෝ විට, ඉලක්ක වන්නේ රාජ්‍ය ආයතන හෝ ජාත්‍යන්තර නියෝජිතායතනයි. සංස්කෘතික හේතු මත, ආගමික නායකයන් ද ඉලක්ක පුද්ගලයන් විය හැකිය. මේ පිළිබඳ අපට අපගෙන්ම පහත දැක්වෙන ප්‍රශ්න අසාගත හැකිය.

- අභිමතාර්ථය සම්බන්ධයෙන් ඉලක්කයෙහි බලපෑම් කිරීමේ හැකියාවේ මට්ටම කුමක්ද?
- ඉලක්කය වෙත ළඟාවීම සඳහා ක්‍රියාමාලාවට තිබෙන හැකියාවේ මට්ටම කුමක්ද?
- ප්‍රශ්නය භාරගැනීමට ඉලක්කය කෙතරම් දුරට සූදානම්ද?;
- වගවිය යුතු හෝ ප්‍රතිචාරාත්මක වන ඉලක්ක වන්නේ කවුරුද?

ප්‍රතිපත්තිමය ස්ථාවරය විසින් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ හැකියාව ඇති පුද්ගලයන් වෙතින් කරනු ලබන අභියාචනා **ඉල්ලීම්** ලෙස සැලකිය හැකිය. ඉල්ලීම් පැහැදිලි හා සංයුක්ත විය යුතුය. සාක්ෂි හා පර්යේෂණ මත පදනම්ව මනාව අර්ථ

නිරූපණය කර තිබිය යුතුය. අපගේ ඉල්ලීම් මනාව සකස්කරගැනීම සඳහා අපට **SMART** ක්‍රමය හා පරදු දරන්නන්ගේ විස්තර භාවිතා කළ හැකිය. හොඳම ඉල්ලීම් වන්නේ ඉලක්කයේ අභිමතාර්ථ හෝ ප්‍රමුඛතා සමග අනුගත වන ඒවාටය.

උදාහරණයක්

මේ සඳහා කදිම උදාහරණයක් අපහාස නීතිය ඉවත්කිරීමේ ඉහත දක්වන ලද උදාහරණයේදී හමුවේ. දශකයක පමණ උද්දේශන ප්‍රයත්නයන්ගෙන් පසුව, ක්‍රියාවලියේ වැදගත්ම තීරණය 2002දී ගන්නා ලදී. එම ප්‍රතිඵලය ලබාගත හැකි වූයේ ඉලක්ක හා ඉල්ලීම් මැනැවින් සැලසුම් කරගැනීමෙනි.

12වන පාර්ලිමේන්තු මැතිවරණය 2001 දෙසැම්බර් 5දා පැවැත්විණි. මෑතදී පිහිටුවන ලද සන්ධානයක් වූ එක්සත් ජාතික පෙරමුණ පාර්ලිමේන්තුවේ ආසන 225න් 109ක් දිනාගත් අතර ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයේ මන්ත්‍රීවරුන්ගේ සහායෙන් ආණ්ඩුවක් පිහිටුවීමට හැකි තත්වයකට පත්විය. ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය දිස්ත්‍රික් තුනක් හැර සෙසු දිස්ත්‍රික්කවල තරග කළේ එක්සත් ජාතික පෙරමුණ යටතේය.

2001 දෙසැම්බර් 9දා, ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග විසින් එක්සත් ජාතික පෙරමුණේ නායක රනිල් වික්‍රමසිංහ අගමැති ධුරයට පත්කරන ලදී. මෙම සංදර්භය තුළ ඉලක්කය වූයේ ඔහුය. මෑතදී ලද මැතිවරණ ජයග්‍රහණය හේතුවෙන් අභිමතාර්ථය සම්බන්ධයෙන් ඉලක්ක පුද්ගලයාගේ බලපෑම් කිරීමේ හැකියාව ඉතා ඉහළ විය. අගමැතිවරයා මාධ්‍ය නිදහස සම්බන්ධයෙන් දරන ලද ලිබරල් ස්ථාවරය හේතුවෙන් ඒ සම්බන්ධ උනන්දුව ද ඉහළ විය. මෙමගින් නිර්මාණය වූ අවස්ථාව උද්දේශකවරුන් විසින් භාවිතා කරන ලදී. මෙම නීතිය මගින් ඍජුවම බලපෑමට ලක්වූ පරදු දරන්නන් වූයේ ජනමාධ්‍යවේදීන් සහ පරදු දරන්නන්ගේ නියෝජිතයන් විය. දේශීය හා ජාත්‍යන්තර මාධ්‍ය උද්දේශන සංවිධාන ඒ අතර විය. ඔවුන් විසින් ඉලක්කය වූ අගමැතිවරයා වෙත ශක්තිමත් ඉල්ලීමක් ඉදිරිපත් කරන ලදී. එම ඉල්ලීම නම්, ඒ වන විට ක්‍රියාත්මක වෙමින් තිබුණු අපහාස නීතිය ඉවත් කිරීමයි.

## සිද්ධි අධ්‍යයන විශ්ලේෂණය

ඉහත දක්වන ලද උදාහරණය අධ්‍යයනය කරන්න. මෙහිදී වැදගත් පරදු දරන්නන් වන්නේ කවුරුද? ඉල්ලීම් මොනවාද? අදාළ පරදු දරන්නන් සම්බන්ධයෙන් විශ්ලේෂණයක් සිදුකර ඔබගේ ඉලක්ක සොයාගන්න. ඉලක්ක හා ඉල්ලීම් ලැයිස්තුවක් සකස් කරන්න. අප ඔබ වෙනුවෙන් එකක් සිදුකර තිබේ.

**ඉලක්කය:** රනිල් වික්‍රමසිංහ
**ඉල්ලීම:** සාපරාධී අපහාස නීතිය ඉවත් කිරීම මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශයට ඇතුළත් කරන්න.

පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න:

- ඉල්ලීම සමස්ත උද්දේශන අභිමතාර්ථය සමග අනුගත වේද?
- එය රටේ වර්තමාන ප්‍රතිපත්ති සහ අධිකරණ බලයට අයත් වේද? (එසේ නැතිනම්, අවශ්‍ය වෙනසට ඉවහල් වන වඩා භෞතික හා ප්‍රායෝගික ඉල්ලීමක් යෝජනා කරන්නේ කෙසේද?

- ඉල්ලීමෙහි දේශපාලනික කාලීනබව කුමක්ද? (උදාහරණයක් ලෙස, මැතිවරණයක් සමීපයේදී උද්දේශන සංවිධානවලට ඉල්ලීම් සම්බන්ධයෙන් වාසිදායක අවස්ථා ලැබේ.)
- ඉල්ලීමෙහි වෙනත් සැඟවුණු ප්‍රතිඵල තිබේද?

## 8 මොඩියුලය

### උපායමාර්ග තෝරාගැනීම

මේ වන විට ඔබට සාක්ෂාත් කරගැනීමට අවශ්‍ය දෙය ඔබ පැහැදිලි කරගෙන තිබිය යුතුය (අභිමතාර්ථ සහ ඉල්ලීම්). එසේම ඔබගේ ඉලක්ක ද හඳුනාගෙන තිබේ. උපායමාර්ග යනු, ඔබ යෝග්‍ය පණිවුඩ සමග තෝරාගත් ඉලක්ක වෙත සමීප වන ආකාරයයි. ඔබගේ බලපෑම් කිරීමේ හැකියාව වඩාත් ඵලදායී ලෙස වැඩිදියුණු කරගැනීම එහි අරමුණයි.

උද්දේශනයෙහිදී භාවිතා කළ හැකි උපායමාර්ග රැසක් තිබේ.

.

**උද්දේශන උපායමාර්ගවලට උදාහරණ කීපයක්**

- ඉහළපෙළේ නිලධාරීන් සමග සන්නිවේදනයන් (රැස්වීම්, ලියුම්, ඊමේල්)
- ජාලයන් හා සන්ධාන ගොඩනැගීම
- සිවිල් සමාජ සංවිධාන බලමුළුගැන්වීම
- සහයෝගය සැපයීමට තුන්වන පාර්ශ්වයන් පෙළඹවීම
- ඔබ ඉලක්ක කරන පුද්ගලයන් සහාය ලබාදෙයිද නැතිනම් ප්‍රතික්ෂේප
- කරයිද යන්න ගැන සැලකිලිමත් වීම



**සිද්ධි අධ්‍යයනය 4**

ශ්‍රී ලංකා මාධ්‍ය සේවක වෘත්තීය සමිති සම්මේලනය 2019 වසරේ තම උද්දේශන වැඩසටහනෙහි කොටසක් ලෙස පසුගිය දශකය පුරා කාලය තුළ ජනමාධ්‍යවේදීන් විසින් මතුකරමින් තිබුණු සේවා ප්‍රශ්න සම්බන්ධයෙන් තිරසාර හා ප්‍රායෝගික විසඳුමක් ප්‍රවර්ධනය කිරීම ආරම්භ කරන ලදී.

කම්කරු අයිතිවාසිකම් පිළිබඳ පුහුණුවක් සඳහා මාධ්‍ය සේවක වෘත්තීය සමිති සම්මේලනය ප්‍රාදේශීය ජනමාධ්‍යවේදීන්ට ආරාධනා කළේය. වෘත්තීය සමිතියක් පිහිටුවීම, සාමූහික කේවල් කිරීම හා වෙනත් ශ්‍රම මූලපිරුම් ද එයට ඇතුළත් විය. සෑම දිස්ත්‍රික්කයකින්ම එක් අයකු බැගින් ජනමාධ්‍යවේදීන් 25දෙනෙකු මෙම පුහුණුවට සහභාගී වූ අතර, ඔවුන් අතරින් 18දෙනෙකු පසුව වෘත්තීය සංගම් පිහිටවූහ. එයින් අනතුරුව, මාධ්‍ය සේවක වෘත්තීය සමිති සම්මේලනය විසින් වෘත්තීය සමිති පිළිගැනීම සඳහා අවශ්‍ය ලේඛනය කම්කරු මහ කොමසාරිස්වරයාටත්, වෘත්තීය සමිති ලේඛකාධිකාරිවරයාටත් භාරදෙන ලදී.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් කෙටුම්පත් කරන ලද පුහුණු මාර්ගෝපදේශ පොත 'වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංවිධානමය අත්පොත' නම් වූ අතර එය කම්කරු අමාත්‍යවරයාට භාරදීමේ අවස්ථාවේදී මාධ්‍ය සේවක වෘත්තීය සමිති සම්මේලනය විසින් පහත දැක්වෙන කරුණු ඉදිරිපත් කරන ලදී.

- ජනමාධ්‍යවේදීන්ගේ පඩි පාලක සභාවට 'ප්‍රාදේශීය ජනමාධ්‍යවේදීන්' යන තනතුර ද ඇතුළත් කිරීම
- මාධ්‍ය ආයතනවල හිමිකරුවන් සමග මිත්‍රශීලී රැස්වීමක් කැඳවා ප්‍රාදේශීය ජනමාධ්‍යවේදීන් සඳහා සේවක අර්ථසාධක අරමුදලේ හා සේවක භාරකාර අරමුදලේ දායකත්වය ඉල්ලා සිටින ලදී. මෙය ශ්‍රී ලාංකික ජනමාධ්‍යවේදීන් විසින් අවුරුදු ගණනාවක සිට කරන ලද ඉල්ලීමකි. මාධ්‍ය හිමිකරුවන් මෙම ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට අකැමැති නම්, රජය ඒවා නීතිගත කර ගැසට් නිවේදනයක් නිකුත් කළ යුතු බව ද මාධ්‍ය සේවක වෘත්තීය සමිති සම්මේලනය විසින් වැඩිදුරටත් ඉල්ලාසිටින ලදී. මාධ්‍ය සේවක වෘත්තීය සමිති සම්මේලනයේ ඉල්ලීම් ඇමතිවරයා පිළිගත් අතර එම ඉල්ලීම් ලබාදීම සඳහා සූදානම් වීම පිණිස වැඩිදුරටත් සාකච්ඡා කරන ලදී.



# ප්‍රාදේශීය ජනමාධ්‍යවේදීන් පුවත්පත් කලාවේදී පඩිපාලක සභාවට ඇතුළත් කළ යුතුයි

## ● කම්කරු ඇමැති නිමල් සිරිපාල ද සිල්වා

**අනුර ප්‍රේමලාල්**

මෙරට ජනමාධ්‍ය, ක්ෂේත්‍රයේ විශාල කාර්යභාරයක් ඉටු කරන ප්‍රාදේශීය ජනමාධ්‍යවේදීන් ද පුවත්පත් කලාවේදී පඩිපාලක සභාවට ඇතුළත් කළ යුතු බවට කම්කරු ඇමැති නිමල් සිරිපාල ද සිල්වා මහතා යෝජනා කරයි. ඒසේම පුවත්පත් කලාවේදී කර්මාන්තය පිළිබඳ පඩි පාලක සභාවට මෙතෙක් ඇතුළත් වී ඇත්තේ මුද්‍රිත මාධ්‍යට අයත් ජනමාධ්‍යවේදීන් පමණක් බැවින් රූපවාහිනී ගුවන් විදුලිය හා වෙබ් මාධ්‍යවේදීන් ද මීට ඇතුළත් වන ලෙසට පුවත්පත් කලාවේදී කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභා ව්‍යුහය වෙනස් කිරීමට අවශ්‍ය පියවර ගන්නා මෙන් ඇමැතිවරයා කම්කරු කොමසාරිස් ජනරාල් ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතාට දැනුම් දුන්නේය.

ඇමැතිවරයා මේ බව කියා සිටියේ මාධ්‍ය සේවක වෘත්තීය සමිති සම්මේලනයේ නියෝජිත පිරිසක් සමග පසුගියදා අමාත්‍යාංශයේ පැවති සාකච්ඡාවකදීය. මාධ්‍ය සේවක වෘත්තීය සමිති සම්මේලනය සම්මේලනයේ ප්‍රධාන ලේකම් ධර්මසිරි ලංකාපේලි මහතා ප්‍රමුඛ සෑම දිස්ත්‍රික්කයක්ම නියෝජනය කරමින් ප්‍රාදේශීය මාධ්‍යවේදී නියෝජිතයන්ගේ සහභාගිත්වයෙන් මෙම සාකච්ඡාව පැවැත්විණි.



මෙහිදී ප්‍රාදේශීය මාධ්‍යවේදීන් ඉල්ලා ඇමැතිවරයාගෙන් ඉල්ලා සිටියේ තමන්ට කිසියම් ආකාරයක වෘත්තීය තත්ත්වයක් ලබාදීම සඳහා රජයට මැදිහත් වන ලෙසත්, එසේම තමන්ගේ වෘත්තීය හා අනාගත ආර්ථික සුරක්ෂිතතාවය වෙනුවෙන් කිසියම් ආකාරයක සමාජ ආරක්ෂණ වැඩ පිළිවෙළක් ඇරඹීම සඳහා රජයට මැදිහත් වන ලෙසයි.

තවදුරටත් මෙහි දී කරුණු පැහැදිලි කළ මාධ්‍ය සේවක වෘත්තීය සම්මේලනයේ ප්‍රධාන ලේකම් ධර්මසිරි ලංකාපේලි මහතා කියා සිටියේ, ප්‍රාදේශීය මාධ්‍යවේදීන් මෙන්ම ආයතනගත මාණ්ඩලික මාධ්‍යවේදීන්ගේ ද විශේෂයෙන් පෞද්ගලික ජනමාධ්‍ය ආයතනවල සේවය කරන මාධ්‍යවේදීන්ගේ අනාගත සුරක්ෂිතතාවය සඳහා නිශ්චිත සමාජ ආරක්ෂණ වැඩ පිළිවෙලක් නොමැති බැවින් ඒ පිළිබඳවද අවධානය යොමු කරන ලෙසයි.

මෙම අවස්ථාවට කම්කරු අමාත්‍යාංශයේ ලේකම් මාපා පතිරණ මහතා, කම්කරු කොමසාරිස් ජෙනරාල් නීතිඥ ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතා, අමාත්‍ය මාධ්‍ය ලේකම් හා පුවත්පත් කලාවේදීන්ගේ පඩි පාලක සභාවේ නියෝජිත උපුල් ජනක ජයසිංහ මහතා සමඟ ජ්‍යෙෂ්ඨ ප්‍රාදේශීය මාධ්‍යවේදීන් වන කරුණාරත්න ගමගේ, ඩග්ලස් නානායක්කාර, පී.සසිකරන්, අසිත වීරවර්ධන, ක්‍රිෂ්නි ඉෆාම් මහත්මිය, සමන් දිසානායක, ඇතුළු ප්‍රාදේශීය මාධ්‍යවේදීහු රැසක්ම එක් වූහ.

### සිද්ධි අධ්‍යයන විශ්ලේෂණය

මෙම ක්‍රියාමාලාවේදී මාධ්‍ය සේවක වෘත්තීය සමිති සම්මේලනය විසින් අනුගමනය කරන ලද උපායමාර්ග ඔබට ලැයිස්තුගත කළ හැකිද? සාර්ථකත්වයට දායක වූයේ දේශපාලන සංදර්භයේ කුමන කාරණාද? වෙනස් ආකාරයකින් කටයුතු කරනවා නම්, ඔබ කරන්නේ කුමක්ද? මෙම ක්‍රියාමාලාව සිදුකළේ ඔබ නම්, ඔබ විසින් අනුගමනය කිරීමට ඉඩ ඇති අමතර උපායමාර්ග මොනවාද?

## සිද්ධි අධ්‍යයන විශ්ලේෂණය

සාපරාධී අපහාස නීතිය ඉවත්කිරීම සම්බන්ධ ඉහත දක්වන ලද උදාහරණය ඔස්සේ උද්දේශන සංවිධාන විසින් අනුගමනය කරනු ලබන උපායමාර්ග රැසක් අපට හඳුනාගත හැකිය. පහත දැක්වෙන උපුටාගැනීම ඔස්සේ අපට තවත් උපායමාර්ග උගත හැකිය.

**FMM welcomes repeal of criminal defamation law – IFEX**

(FMM/IFEX) – The following is an FMM press release: The Free Media Movement warmly congratulates the government of Prime Minister Ranil Wickremesinghe and the Sri Lankan parliament, who unanimously passed an act of parliament on June 18, 2002, that repealed criminal defamation laws from the statute books. This is the first major legislation in over [...]

(FMM/IFEX) – The following is an FMM press release:

The Free Media Movement warmly congratulates the government of Prime Minister Ranil Wickremesinghe and the Sri Lankan parliament, who unanimously passed an act of parliament on June 18, 2002, that repealed criminal defamation laws from the statute books.

This is the first major legislation in over two decades to strengthen freedom of expression in Sri Lanka. The FMM has been campaigning for nearly a decade to have the repressive legislation, introduced during the British colonial rule, abolished. The campaign was later supported by both the Editors' Guild and the Publishers' Association. International organisations such as the Commonwealth Press Union, The World Association of Newspapers, the International Press Institute, the Committee to Protect Journalists and ARTICLE 19 have strongly supported the campaign by the three Sri Lankan media organisations to repeal laws constraining freedom of expression and establish a legal and institutional framework that guarantees freedom of expression in a democratic environment.

Since the 1970s, successive governments have used this law to harass newspaper editors and impose serious constraints on the media.

At a meeting with Prime Minister Ranil Wickremesinghe in January, the government and representatives of the three media organisations, the FMM, the Editors' Guild and the Publishers' Association, reached an agreement on a wide ranging reform package to strengthen freedom of expression in the country. The package includes abolishing laws that curtail freedom of expression, introducing a right to information act, replacing the Press Council with an independent Press Complaints Commission and setting up an independent media training institute. Most of the details with regards to setting up the institutions have been finalised in subsequent meetings with the secretary to the prime minister and secretary to the Ministry of Mass Communications.

The Free Media Movement hopes that the government will implement the rest of the reform package without delay.

Sunanda Dshapriya
Convenor Free Media Movement
20 June 2002

එවැනි පාඩම් සමහරක්:

- ඇතැම් ඉහළපෙළේ නිලධාරීන් සමග සන්නිවේදනයන් (රැස්වීම, ලිපි, ඊමේල්). උදා: නීති සංශෝධන පිළිබඳ සාකච්ඡා කිරීමට මාධ්‍ය ඇමතිවරයා හමුවීම.
- තනි ආයතන වෙනුවට ජාල හා සන්ධාන ගොඩනැගීම මගින් උද්දේශන ඵලදායිතාව ඉහළ නංවාගැනීම.
- සමාන අරමුණු සහිත සිවිල් සමාජ සංවිධාන බලමුළුගන්වාගැනීම
- සහයෝගය සඳහා තුන්වන පාර්ශ්වයන් පොළඹවාගැනීම

## මොඩියුලය 9

### පණිවුඩ නිර්මාණය කිරීම



ඵලදායී උද්දේශන ක්‍රියාමාලා විසින් බහුවිධ ග්‍රාහකයන්ට පැහැදිලිව ආමන්ත්‍රණය කරනු ලැබේ: **පොදු පණිවුඩ** මගින් ක්‍රියාමාලාවේ අරමුණ හා ඉලක්ක පොදු සමාජයට සන්නිවේදනය කරනු ලැබේ. පණිවුඩය කෙටුම්පත් කිරීමට පෙර **ඉලක්ක පණිවුඩ** මගින් ඉල්ලීම් විශේෂිත පරදු දරන්නන් වෙත රැගෙන යයි. ඔබගේ **අභිමතාර්ථ** හා **ඉල්ලීම්** හඳුනාගත් බව ද, ඒවා පැවසිය යුත්තේ කාටද යන්න හෙවත් **ඉලක්ක** ද, ඉලක්ක සමග සම්බන්ධ වන ආකාරය හෙවත් **උපායමාර්ග** ද හඳුනාගත් බව තහවුරු කරන්න.

**ප්‍රාථමික** හා **ද්විතීයක** වශයෙන් පණිවුඩ වර්ග දෙකක් තිබේ.

### ප්‍රාථමික පණිවුඩ

ප්‍රාථමික පණිවුඩය යනු ප්‍රධාන පණිවුඩයයි. එය පුළුල්ය. සියලු ග්‍රාහකයන්ට ආකර්ශනීයය. සරලය. ඍජුය. ප්‍රාථමික පණිවුඩය මූලික ප්‍රශ්නවලට පිළිතුරු සපයයි:

- උද්දේශකයන් කවුරුද?
- ඔවුන් පෙනී සිටින්නේ කුමන වෙනස්කම් වෙනුවෙන්ද?
- ඔවුන් යෝජනා කරන විකල්පය කුමක්ද?

## ද්විතීයක පණිවුඩ

**ද්විතීයක පණිවුඩය මගින්** යෝජිත වෙනස පැහැදිලි කර සාධාරණීකරණය කරනු ලැබේ. ද්විතීයක පණිවුඩ මගින් ඉලක්ක කළ යුත්තේ ඉලක්ක ග්‍රාහකයන්ගේ අවශ්‍යතා, දැක්ම හා ප්‍රමුඛතා කෙරෙහිය.

## ප්‍රාථමික පණිඩුඩ සඳහා උදාහරණ

වාරණයේ හා දණ්ඩමුක්තියේ සංදර්භය තුළ අපට ප්‍රාථමික හා ද්විතීයක පණිවුඩ නිදර්ශන හමුවේ. අසාධාරණ වාරණයට හා දණ්ඩමුක්තියට එරෙහිව නීති ප්‍රතිසංස්කරණ ප්‍රවර්ධනය කිරීමේදී මාධ්‍ය උද්දේශන සංවිධාන උද්‍යෝගයෙන් කටයුතු කළහ. නිදහස් මාධ්‍ය ව්‍යාපාරය, ශ්‍රී ලංකා වෘත්තීය පුවත්පත් කලාවේදීන්ගේ සංගමය සමග එක්ව ජනමාධ්‍යවේදීන් සඳහා ආරක්ෂිත අවකාශයක් නිර්මාණය කිරීම සඳහා ප්‍රගාමී ලෙස කටයුතු කරමින් සිටියි. ජනමාධ්‍යවේදීන්ගේ ජාත්‍යන්තර සම්මේලනයේ වෙබ් අඩවියේ පළවූ පහත දැක්වෙන ලිපිය මගින් දණ්ඩමුක්තියට අදාළව ප්‍රගීත් එක්නැලිගොඩ සිදුවීම විස්තර කරයි.

මෙය ප්‍රාථමික පණිවුඩයකි. එහි අරමුණ වන්නේ ප්‍රශ්නය සම්බන්ධයෙන් දැනුවත් භාවය නිර්මාණය කිරීමයි.

10 November 2020

**Challenging impunity for crimes against media in Sri Lanka**

**Against the backdrop of killing, arrest and harassment of journalists, media freedom organisations continue to campaign against the scourge of impunity in Sri Lanka, writes Ruki Fernando.**




*Sandya Eknaligoda , a human right activist and wife of missing journalist Prageeth Eknaligoda along with other journalists protesting in front of the Fort Railway Station, marking 100 days of the disappearance of the journalist Prageeth Eknaligoda in 2010. Credit: Sarah Kellapatha*

Dozens of journalists have been killed, abducted or have disappeared in the past two decades in Sri Lanka, with 2005-2010 being the most dangerous. According to Journalists for Democracy in Sri Lanka (JDS) 44 journalists and media workers were killed or disappeared during this period. Disturbingly,

Challenging impunity for crimes against media in Sri Lanka - IFJ

## ද්විතීයක පණිවුඩ සඳහා උදාහරණ

ද්විතීයක පණිවුඩ මගින් ඉලක්ක කරනු ලබන්නේ විශේෂිත ග්‍රාහක පිරිසකි. එය කෙටුම්පත් කරනු ලබන්නේ එම නිශ්චිත කාර්යය වෙනුවෙනි.

පහත දැක්වෙන ලිපිය මගින් එම ආමන්ත්‍රණය කරනු ලබන්නේ ද දණ්ඩමුක්තිය පිළිබඳ ප්‍රශ්නයයි. එය ආමන්ත්‍රණය කරන ආකාරය හා එහි අරමුණ වෙනස්ය. ඇම්නෙස්ටි ජාත්‍යන්තරය විසින් දණ්ඩමුක්තිය පිළිබඳ සාකච්ඡා කරනු ලබන්නේ පුළුල් අර්ථයකිනි. මෙම ලිපිය වඩාත් සුදුසු වන්නේ ශ්‍රී ලංකාවේ සිදුවන දෙය හා දණ්ඩමුක්තිය පිළිබඳ මූලික අවබෝධයක් සහිත අයටයි.



AI Index: ASA 37/3541/2021
14 January 2021

THE UN HUMAN RIGHTS COUNCIL MUST STEP UP EFFORTS TO ADVANCE ACCOUNTABILITY FOR SERIOUS VIOLATIONS IN SRI LANKA

Amnesty International urges the United Nations (UN) Human Rights Council (HRC), when it meets for its 46th session (22 February – 19 March 2021), to establish an international accountability mechanism to continue to monitor and report on the human rights situation in Sri Lanka, and to collect, preserve and assess evidence of gross human rights violations.

As this paper details, such a mechanism is critical in the face of the continued deterioration of the human rights situation on the ground, including: increased attacks on human rights organizations, media, and members of the Muslim community; backsliding on the limited progress made on the implementation of HRC resolution 30/1, including on accountability; and Sri Lanka's announcement they are disengaging from the 30/1 process altogether.

We hope to see states work towards such an appropriate response, in line with the clear recommendations of the UN Office of the High Commissioner for Human Rights (OHCHR), when the HRC meets for its 46th session.

CONTINUED DETERIORATION OF THE HUMAN RIGHTS SITUATION ON THE GROUND
Over the past few years – and the past year in particular – we have witnessed an alarming crackdown on civic space in Sri Lanka, with increased targeting and intimidation of human rights defenders,[1] journalists,[2] and lawyers.[3] Among others, Amnesty International has documented the harassment of New York Times journalist Dharisha Bastians,[4] the arbitrary detention of blogger Ramzy Razeek (amid deteriorating health),[5] and lawyer Hejaaz Hizbullah,[6] and has followed the ongoing criminal investigation against writer Shakthika Sathkumara.[7] The real threat of reprisals is already having a chilling effect. Lawyers, journalists and criminal investigators who pursued accountability for human rights violations have already fled the country. Under new directives, law enforcement officers have arrested social media commentators for criticizing officials in relation to the government's COVID-19 response.

The Secretary-General's latest report on reprisals against human rights defenders cooperating with the United Nations noted that, "OHCHR received continued allegations of surveillance of civil society organizations, human rights defenders and families of victims of violations, including repeated visits by police and intelligence services, questioning organizations about, *inter alia*, their staff and activities related to the UN."[8] The report noted that a number of Sri Lankans who have travelled to Geneva to attend sessions of the HRC have been subjected to questioning and surveillance.

The issue of "reprisals against judicial and other professionals who try to prosecute human-rights related cases involving State officials," highlighted in the 2015 OHCHR Investigation on Sri Lanka report, also remains a huge challenge. More than 700 law enforcement officials with the Criminal

1

ඇම්නෙස්ටි ජාත්‍යන්තරය විසින් මෙම පණිවුඩය කෙටුම්පත් කරනු ලැබුවේ, ශ්‍රී ලංකාවේ මානව හිමිකම් තත්වය නිරීක්ෂණය කිරීම හා වාර්තා කිරීම සහ මහා පරිමාණ මානව හිමිකම් උල්ලංඝනයන් පිළිබඳ සාක්ෂි, එක්රැස් කිරීම, සංරක්ෂණය හා තක්සේරු කිරීම සඳහා ජාත්‍යන්තර වගවීමේ යාන්ත්‍රණයක් පිහිටුවීම සඳහා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිෂන් සභාවට බලකිරීම වෙනුවෙනි.

## ද්විතීයක පණිවුඩ නිර්මාණය කිරීමේදී පහත දැක්වෙන ප්‍රශ්න විමසන්න:

- ඉලක්කය වන්නේ කවුරුද? (නිශ්චිත පුද්ගලයකු හෝ කණ්ඩායමක් දක්වන්න)
- ඉලක්කයෙහි අභිලාෂයන් වන්නේ මොනවාද? ඒවා උද්දේශනයට අදාළ ප්‍රශ්නය සමග සම්බන්ධ කරගන්නේ කෙසේද?
- ප්‍රශ්නය සම්බන්ධයෙන් ඉලක්කයෙහි පූර්ව දැනුම කුමක්ද?
- ප්‍රශ්නය සම්බන්ධයෙන් ඉලක්කයෙහි සහයෝගයේ හෝ විරෝධයේ මට්ටම කුමක්ද?
- ප්‍රශ්නය සම්බන්ධයෙන් ඉලක්කයෙහි බලපෑම කෙතරම්ද?
- ඉලක්කයෙන් අපේක්ෂිත ක්‍රියාමාර්ගය (ඉල්ලීම) කුමක්ද?

**උපදෙසක්: අනතුරු ඇඟවීමයි**

කිසිදු උද්දේශන පණිවුඩයක් මුළුමනින්ම පෞද්ගලික වන්නේ නැත. පෞද්ගලිකව සන්නිවේදනය කරනු ලබන ඕනෑම තොරතුරක් පසු කලෙක ප්‍රසිද්ධ කළ හැකිය. එබැවින් ඉලක්ක පණිවුඩ පවා පුළුල් පොදු පණිවුඩය සමග අනුගත විය යුතුය. එය හැකි උපරිම තරමින් සාක්ෂි මත පදනම් විය යුතුය. අපේක්ෂිත ග්‍රාහකයන් හැර වෙනත් අය වෙත සන්නිවේදනය වුවහොත්, 'පෞද්ගලික' සංවාදයක් හා සන්නිවේදනයක් පවා ක්‍රියාමාලාවට බලපෑමක් සිදුකළ හැකිය. අතිශයෝක්තියෙන්, දත්ත වැඩිකර දැක්වීමෙන් හා ව්‍යාජ ප්‍රකාශ සිදුකිරීමෙන් වළකින්න.



## උද්දේශන උපායමාර්ගයක් නිර්මාණය කිරීම

උද්දේශන උපායමාර්ගයක් යනු, ක්‍රියාමාලාවක අරමුණු, ඉලක්ක සහ පණිවුඩය ඒකීය ප්‍රයත්නයක් ලෙස සම්බන්ධීකරණය කරන මූලෝපායයි. මනා ලෙස සංවිධානය කරන ලද උද්දේශන මූලෝපායක් මගින් අභිමතාර්ථ කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දිගු කාලීන වශයෙන් වර්ගීකරණය කර ඒ වෙනුවෙන් උපයෝගී කරගත හැකි උපායමාර්ග ඉදිරිපත් කළ හැකිය. ප්‍රබල උපායමාර්ග සැලසුම් කරනු ලබන්නේ තාර්කික පිළිවෙලකටයි. එහි අරමුණ වන්නේ මුල් අභිමතාර්ථ සාධනය මගින් බාධක අවම කරගැනීම සහ පසු අභිමතාර්ථ දිනාගැනීම සඳහා කාර්යයන් ජවයකින් යුතුව ආරම්භ කළ හැකි ස්ථානයක් සැකසීමයි. උද්දේශන උපායමාර්ගයේ අරමුණ වන්නේ, ක්‍රියාමාලාවේ අරමුණු, අභිමතාර්ථ, ඉලක්ක, ඉල්ලීම් හා පණිවුඩ පිළිබඳ තීරණ ගැනීම සඳහා මූලික ව්‍යුහයක් නිර්මාණය කිරීමයි. මෙම ව්‍යුහය දේශීය දේශපාලන සංදර්භය සම්බන්ධයෙන් වගවන අතර අවදානම අවම කිරීමට උපකාරී වේ. ගතික දේශපාලන සංදර්භයන් තුළදී ක්‍රියාමාලාව සම්බන්ධයෙන් මතුවිය හැකි බලාපොරොත්තු නොවූ අවදානම් දරාගැනීමට පැහැදිලිව නිර්වචනය කරන ලද උපායමාර්ගයක් උපකාරී වේ.



**සිද්ධි අධ්‍යයන විශ්ලේෂණය**

අපි දැන් කොංගෝ ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය සම්බන්ධ සිද්ධි අධ්‍යයනය නැවත අධ්‍යයනය කරමු. ඒ හා සම්බන්ධ ඉල්ලීම්, උපායමාර්ග සහ එම උපායමාර්ග හේතුවෙන් නිර්මාණය විය හැකි අවදානම් ඔබට නම් කළ හැකිද?

**කොංගෝ ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයේ සීමාකාරී නීතිවලට අභියෝග කිරීම**

2017 වසරේ සිට, කොංගෝ රාජ්‍යයේ සිවිල් සමාජ සංවිධානවල තත්වය කඩාවැටෙමින් තිබිණි. පොලිසිය හා ආරක්ෂක අංශ සිවිල් සමාජ සංවිධානවලට හා ක්‍රියාධරයන්ට පහරදීම, තර්ජනය කිරීම, සැලසුම් සහගත ලෙස අත්අඩංගුවට ගැනීම හා ඝාතනය සඳහා ඉලක්ක කිරීම පවා සිදුවිය. රජය විවේචකයන්ට එරෙහිව ක්‍රියාමාර්ග ශක්තිමත් කළ අතර, සිවිල් සමාජය වැඩිදුරටත් සීමාකරන නීති යෝජනා ගෙන ආවේය.

අරමුණ: තර්ජන, ප්‍රචණ්ඩත්වය හෝ රජයේ ඇඟිලිගැසීම්වලින් තොරව සිවිල් සමාජ සංවිධානවලට ක්‍රියාත්මක වීමට හැකි වාතාවරණයක් නිර්මාණය කිරීම.

මූලෝපාය: සිවිල් සමාජය සීමාවන්ට යටත් කරන නීති පරාජය කිරීමටත්, සිවිල් සමාජය සඳහා ප්‍රජා සහයෝගය දිනාගැනීමටත් මුලපිරුමක් දේශීය සිවිල් සමාජ සංවිධානයක් විසින් දියත් කරන ලදී. වේදිකා **48** ක් නිර්මාණය කිරීමට එම සංවිධානය සහයෝගය ලබාදුන් අතර එම නීතියට එරෙහි උද්දේශනය සම්බන්ධීකරණය කරන ලදී. රජයේ ඉලක්ක බවට පත්ව සිටි ක්‍රියාධරයන්ගෙන් තොරතුරු එක්රැස්කරගැනීම සඳහා ඔවුන් විසින් ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා හයක් පවත්වන ලදී. එසේ ලබාගන්නා ලද තොරතුරු මාධ්‍ය ප්‍රචාරණ ක්‍රියාමාලාවලදී සහ ප්‍රාදේශීය හා පළාත් ප්‍රතිපත්ති සම්පාදකයන් සමග රැස්වීම්වලදී යොදාගන්නා ලදී.

බලපෑම: සාපේක්ෂ වශයෙන් කෙටි කාලයක් තුළදී, පොලිස් නිලධාරීන්ගේ චර්යාව වෙනස් වූ අතර, සාමකාමී ලෙස සිවිල් සමාජ සංවිධාන අධීක්ෂණය කරනු දක්නට ලැබිණි. ඒවාට බාධාකිරීම අවම විය. මාධ්‍ය ක්‍රියාමාලාවේ ප්‍රතිඵලයක් ලෙස සිවිල් සමාජයට මහජන සහාය ද වර්ධනය විය. සිවිල් සමාජ සංවිධාන විසින් පවත්වන ලද අහිංසාවාදී පාගමන්වලට සහාය පිණිස බොහෝ පුරවැසියන් විසින් තම කාර්යාල හා සාප්පු වසාදමන ලදී. ප්‍රාදේශීය මට්ටම කෙරෙහි අවධානය යොමුකරමින් ඉලක්ක අරමුණු මත පිහිටා සිටීමෙන්, සිවිල් සමාජ සංවිධානවලට සැබෑ ප්‍රතිඵල ලබාගත හැකි විය. රාජ්‍ය නොවන සංවිධාන සීමාකරන නීති තර්ජනය තවමත් පවතී. එහෙත්, ඒ සඳහා දැරූ මුල් උත්සාහය පසුබැස්වීමට සිවිල් සමාජ සංවිධාන සමත් විය.

## ක්‍රියාමාලා කාලසටහන:

කෙටිකාලීන හා දිගුකාලීන වන්නේ කුමක්දැයි තෝරාගැනීම සඳහා නීතියක් නැත. වර්ගීකරණයන් මනෝමූලික වන අතර දේශපාලන පද්ධතියේ විවෘතභාවය, අභිමතාර්ථවල සංකීර්ණභාවය හා ලබාගත හැකි සම්පත් මත දැඩිව රඳාපවතී. මනඃකල්පිත කාලසටහනක් අනුව,



- දිගුකාලීන අභිමතාර්ථ අවුරුදු 3-5 අතරදී සාක්ෂාත් කරගත හැකිය.
  උදා: පරදු දරන්නන් පිළිබඳ විශ්ලේෂණයේ වැදගත් මෙහෙයුම්කරුවන්ට බලපෑම් කිරීම
- මධ්‍යම කාලීන අභිමතාර්ථ අවුරුදු 1-2 අතර කාලය තුළ සාක්ෂාත් කරගත හැකිය.
  උදා: උද්දේශන පණිවුඩ, සන්ධානවල සහ ජාලවල කොටස්කරුවන් වීම
- කෙටිකාලීන අභිමතාර්ථ මාස හය හා අවුරුද්දක් ඇතුළත සාක්ෂාත් කරගත හැකිය.
  උදා: ලේඛන මත පදනම්ව කරන අධ්‍යයන, ප්‍රධාන පරදු දරන්නන්ගෙන් උපදෙස් විමසීම

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත ක්‍රියාත්මක කරවාගැනීම සම්බන්ධ පහත දැක්වෙන ඉතිහාස කාලසටහන බලන්න. ඔබ ජීවත් වන්නේ 1995 වසරේ යයි සිතන්න. ඒ අනුව, කෙටිකාලීන, මධ්‍යකාලීන හා දිගුකාලීන අභිමතාර්ථ ඔබ හඳුනාගන්නේ කෙසේද?

1994 - සංචාරක, තොරතුරු හා ගුවන් සේවා පිළිබඳ ඇමති ධර්මසිරි සේනානායක විසින් රජයේ මාධ්‍ය ප්‍රතිපත්තිය’ නම් කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කිරීම

1995: මාධ්‍ය නිදහසට හා ප්‍රකාශනයේ නිදහසට බලපාන නීති සංශෝධනය කිරීම සඳහා රජයට උපදෙස් දීම පිණිස ජ්‍යෙෂ්ඨ නීතිඥ ආර්.කේ.ඩබ්ලිව් ගුණසේකර සභාපතිත්වය දරන කමිටුවක් පත්කිරීම. එම කමිටුව විසින් තොරතුරු නිදහස පිළිබඳ පනතක් කෙටුම්පත් කිරීමට නිර්දේශ කරන ලදී.

1996; විනිසුරු ඒ.ආර්.බී. අමරසිංහ විසින් සභාපතිත්වය දරන ලද ශ්‍රී ලංකා නීති කොමිෂන් සභාව විසින් තොරතුරු නිදහස පිළිබඳ පනත කෙටුම්පත් කරන ලදී.

1998: මාධ්‍ය නිදහස හා සමාජ වගකීම පිළිබඳ කොළඹ ප්‍රකාශය. මෙයට නායකත්වය දුන්නේ ශ්‍රී ලංකා වෘත්තීය පුවත්පත් කලාවේදීන්ගේ සංගමය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය, ශ්‍රී ලංකා පුවත්පත් සමාජය සහ ශ්‍රී ලංකා කර්තෘ සංසදයයි. එම ප්‍රකාශය මගින් ශ්‍රී ලංකාවේ තොරතුරු දැනගැනීමේ අයිතිය නීතිගත කිරීම අවධාරණය කරන ලදී.

2000- කෙටුම්පත් කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි ද තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ වගන්තියක් අඩංගු විය. එහෙත්, මෙම කෙටුම්පත පාර්ලිමේන්තුවේදී සම්මත කිරීමට නොලැබිණි.

2004: අග්‍රාමාත්‍ය කමිටුවක් විසින් තොරතුරු නිදහස පිළිබඳ පනත කෙටුම්පත් කරන ලදී. එය කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරනු ලැබ පාර්ලිමේන්තුවේ සභාගත කරන ලදී.

2010: අධිකරණ ඇමති මිලින්ද මොරගොඩ විසින් කරන ලද මුලපිරුමක් අනුව මෙම කෙටුම්පත 2010 වසරේදී සංශෝධනය කරන ලදී.

2011: 2004දී කෙටුම්පත් කරන ලද තොරතුරු නිදහස පිළිබඳ පනත 2011 වසරේදී එවකට විපක්ෂ මන්ත්‍රීවරයකු වූ කරු ජයසූරිය විසින් පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ලෙස ඉදිරිපත් කරන ලදී. එහෙත්, එය පාර්ලිමේන්තුවේ විවාදය සඳහා නොගැනිණි. පසුව උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාව විසින් එහි අවසන් වාර්තාව මගින් තොරතුරු දැනගැනීමේ අයිතිය නීතිගත කිරීමට නිර්දේශ කරන ලදී.

2013: උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාවේ ජාතික ක්‍රියාකාරී සැලැස්මෙහි සක්‍රිය ලක්ෂ්‍යයක් ලෙස තොරතුරු නිදහස පිළිබඳ පනත ඇතුළත් කරන ලදී.

2015: 19වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් සමග පුරවැසියන්ට තොරතුරු ලබාගැනීමේ අයිතිය සඳහා ව්‍යවස්ථාමය අයිතියක් ලැබිණි.

මොඩියුලය 11

## උද්දේශන සැලසුම්කරණය


උද්දේශන සැලසුම්කරණය යනු චක්‍රීය ක්‍රියාවලියකි. එය සාර්ථක වන්නේ තෝරාගත් මූලෝපායන් හා උපායමාර්ග මත වැඩිදුරටත් ක්‍රියාමාලා සංවිධානය කිරීමෙනි. අප විසින් අපගේ ක්‍රියාමාලා සැලසුම් කරද්දී අපගේ උපායමාර්ග අඛණ්ඩව තක්සේරු කර වැඩිදියුණු කළ යුතුය.

**පසුවිපරම් කිරීම, ප්‍රතිපෝෂණය, වැඩිදියුණු කිරීම**

ක්‍රියාමාලාවක් ඉදිරියට යන විට, ප්‍රායෝගිකව වාර්තාගත කළ හැකි සියලු අදාළ තොරතුරු වාර්තාගත කිරීම වැදගත් වේ. එයට හේතුවන ක්‍රියාමාලා ඒවායේ ස්වභාවයෙන්ම ක්‍රියාකාරකම් රැසක රාශිභූත වීමකි. අතීත ක්‍රියාකාරකම්වල තොරතුරු අනාගත ක්‍රියාමාර්ග දැනුමින් පෝෂණය කිරීමට හා මගපෙන්වීමට ඉවහල් වේ. ඔබගේ කාර්යයන්ගේ බලපෑම තක්සේරු කිරීම ද එයට අයත් වේ. බාධාවලට හා ක්‍රියාමාර්ගවල කරනු ලබන වෙනස්කම්වලට ප්‍රතිචාර දැක්වීමේදී විවෘත මනසකින් යුක්ත විය යුතු අතර, නම්‍යශීලී විය යුතුය. මුලින් අනුගමනය කරන ලද ක්‍රමවේද අසාර්ථක වූ විට, අලුත් ක්‍රියාමාර්ග වෙත යොමුවීමට සිදුවේ. එහිදී නිවැරදි ක්‍රමය වන්නේ, අදාළ වන්නේ කුමන තොරතුරුද, කොපමණ ප්‍රමාණයක් තොරතුරු එක්රැස් කරගත යුතුද යන්න අවබෝධ කරගැනීමයි. දත්ත එක්රැස් කිරීම හා සංවිධානය කිරීම කාලය හා සම්පත් වැයවන කාර්යයකි. එබැවින්, හුදු එකතු කළ යුතු නිසා දත්ත එකතු කිරීම අපි දැඩි ලෙස අධෛර්යවත් කරන්නෙමු. මෙම මෙවලම් කට්ටලයෙහි තුන්වන කොටසෙහි අදාළ තොරතුරු හඳුනාගැනීම සඳහා මාර්ගෝපදේශයක් අඩංගු වේ. දත්ත යෝග්‍ය පරිදි සමාලෝචනය කරන ආකාරය හා ඔබගේ උද්දේශන කටයුතු සමාලෝචනය කළ යුත්තේ කුමන අවස්ථාවේදී ද යන්න පිළිබඳ මාර්ගෝපදේශ එමගින් සපයනු ලැබේ.




.



උද්දේශන ක්‍රියාකාරකම් වාර්තාගත කිරීම සඳහා පහත දැක්වෙන සරල මාර්ගෝපදේශය භාවිතා කළ හැකිය

- කවුරුද: ඔබ හමුවුණේ කාවද? විරෝධය සංවිධානය කළේ හා එයට සහභාගී වුණේ කවුරුද? සමාජ මාධ්‍ය ක්‍රියාමාලාවලට සහභාගී වුණේ කවුරුද?
- කුමක්ද: සිදුවූයේ කුමක්ද? රැස්වීමේදී සාකච්ඡා කළේ කුමක්ද? විරෝධය දක්වන ලද්දේ කුමකටද?
- කවදාද: රැස්වීම හෝ ක්‍රියාකාරකම සිදුවූයේ කවදාද?
- කොහේද: රැස්වීම හෝ ක්‍රියාකාරකම සිදුවූයේ කොහේද?
- ඇයි: රැස්වීමේ, විරෝධතාවේ හෝ ක්‍රියාකාරකමේ අරමුණ කුමක්ද?
- කොහොමද: ක්‍රියාකාරකම සිදුවූයේ කෙසේද? රැස්වීමට පහසුකම් සැපයුවේ තුන්වන පාර්ශ්වයක්ද? විරෝධතාව හිටිහැටියේ පැනනැගුණ එකක්ද? නැතිනම් කලින් සැලසුම් කළ එකක්ද?

## ක්‍රියාමාලා කාලසටහන:

කෙටිකාලීන හා දිගුකාලීන වන්නේ කුමක්දැයි තෝරාගැනීම සඳහා නීතියක් නැත. වර්ගීකරණයන් මනෝමූලික වන අතර දේශපාලන පද්ධතියේ විවෘතභාවය, අභිමතාර්ථවල සංකීර්ණභාවය හා ලබාගත හැකි සම්පත් මත දැඩිව රඳාපවතී. මනඃකල්පිත කාලසටහනක් අනුව,



- දිගුකාලීන අභිමතාර්ථ අවුරුදු 3-5 අතරදී සාක්ෂාත් කරගත හැකිය.
  උදා: පරදු දරන්නන් පිළිබඳ විශ්ලේෂණයේ වැදගත් මෙහෙයුම්කරුවන්ට බලපෑම් කිරීම
- මධ්‍යම කාලීන අභිමතාර්ථ අවුරුදු 1-2 අතර කාලය තුළ සාක්ෂාත් කරගත හැකිය.
  උදා: උද්දේශන පණිවුඩ, සන්ධානවල සහ ජාලවල කොටස්කරුවන් වීම
- කෙටිකාලීන අභිමතාර්ථ මාස හය හා අවුරුද්දක් ඇතුළත සාක්ෂාත් කරගත හැකිය.
  උදා: ලේඛන මත පදනම්ව කරන අධ්‍යයන, ප්‍රධාන පරදු දරන්නන්ගෙන් උපදෙස් විමසීම

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත ක්‍රියාත්මක කරවාගැනීම සම්බන්ධ පහත දැක්වෙන ඉතිහාස කාලසටහන බලන්න. ඔබ ජීවත් වන්නේ 1995 වසරේ යයි සිතන්න. ඒ අනුව, කෙටිකාලීන, මධ්‍යකාලීන හා දිගුකාලීන අභිමතාර්ථ ඔබ හඳුනාගන්නේ කෙසේද?

1994 - සංචාරක, තොරතුරු හා ගුවන් සේවා පිළිබඳ ඇමති ධර්මසිරි සේනානායක විසින් රජයේ මාධ්‍ය ප්‍රතිපත්තිය' නම් කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කිරීම

1995: මාධ්‍ය නිදහසට හා ප්‍රකාශනයේ නිදහසට බලපාන නීති සංශෝධනය කිරීම සඳහා රජයට උපදෙස් දීම පිණිස ජ්‍යෙෂ්ඨ නීතිඥ ආර්.කේ.ඩබ්ලිව් ගුණසේකර සභාපතිත්වය දරන කමිටුවක් පත්කිරීම. එම කමිටුව විසින් තොරතුරු නිදහස පිළිබඳ පනතක් කෙටුම්පත් කිරීමට නිර්දේශ කරන ලදී.

1996; විනිසුරු ඒ.ආර්.බී. අමරසිංහ විසින් සභාපතිත්වය දරන ලද ශ්‍රී ලංකා නීති කොමිෂන් සභාව විසින් තොරතුරු නිදහස පිළිබඳ පනත කෙටුම්පත් කරන ලදී.

1998: මාධ්‍ය නිදහස හා සමාජ වගකීම පිළිබඳ කොළඹ ප්‍රකාශය. මෙයට නායකත්වය දුන්නේ ශ්‍රී ලංකා වෘත්තීය පුවත්පත් කලාවේදීන්ගේ සංගමය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය, ශ්‍රී ලංකා පුවත්පත් සමාජය සහ ශ්‍රී ලංකා කර්තෘ සංසදයයි. එම ප්‍රකාශය මගින් ශ්‍රී ලංකාවේ තොරතුරු දැනගැනීමේ අයිතිය නීතිගත කිරීම අවධාරණය කරන ලදී.

2000- කෙටුම්පත් කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි ද තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ වගන්තියක් අඩංගු විය. එහෙත්, මෙම කෙටුම්පත පාර්ලිමේන්තුවේදී සම්මත කිරීමට නොලැබිණි.

2004: අග්‍රාමාත්‍ය කමිටුවක් විසින් තොරතුරු නිදහස පිළිබඳ පනත කෙටුම්පත් කරන ලදී. එය කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරනු ලැබ පාර්ලිමේන්තුවේ සභාගත කරන ලදී.

2010: අධිකරණ ඇමති මිලින්ද මොරගොඩ විසින් කරන ලද මූලපිරුමක් අනුව මෙම කෙටුම්පත 2010 වසරේදී සංශෝධනය කරන ලදී.

2011: 2004දී කෙටුම්පත් කරන ලද තොරතුරු නිදහස පිළිබඳ පනත 2011 වසරේදී එවකට විපක්ෂ මන්ත්‍රීවරයකු වූ කරු ජයසූරිය විසින් පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ලෙස ඉදිරිපත් කරන ලදී. එහෙත්, එය පාර්ලිමේන්තුවේ විවාදය සඳහා නොගැනිණි. පසුව උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාව විසින් එහි අවසන් වාර්තාව මගින් තොරතුරු දැනගැනීමේ අයිතිය නීතිගත කිරීමට නිර්දේශ කරන ලදී.

2013: උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාවේ ජාතික ක්‍රියාකාරී සැලැස්මෙහි සක්‍රිය ලක්ෂ්‍යයක් ලෙස තොරතුරු නිදහස පිළිබඳ පනත ඇතුළත් කරන ලදී.

2015: 19වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් සමග පුරවැසියන්ට තොරතුරු ලබාගැනීමේ අයිතිය සඳහා ව්‍යවස්ථාමය අයිතියක් ලැබිණි.

## ප්‍රතිපත්ති සම්පාදනය

## හැඳින්වීම

උද්දේශන සංවිධාන වැදගත් කාරණා සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය ස්ථාවර නිර්මාණය කරගත යුතුය. පරදු දරන්නන්ගෙන් හා මහජනතාවගෙන් අදහස් හා දැනුම ලබාගනිමින් සංවිධාන විසින් ප්‍රායෝගික ප්‍රතිපත්ති නිර්මාණය කරගත යුතුය. තම පරිසරය සක්‍රිය ලෙස තක්සේරු කිරීමෙන්, සංවිධානවලට තම සාමාජිකයන්ට හෝ ප්‍රජාවට බලපාන ප්‍රශ්නය අවබෝධ කරගත හැකිය. ක්‍රියාමාර්ග සඳහා නිසි අවස්ථාව හඳුනාගත හැකිය.

මෙම කොටසෙහිදී අප අධ්‍යයනය කරනු ලබන්නේ පහත දැක්වෙන නිශ්චිත සාධක පිළිබඳවයි. අභ්‍යන්තර ප්‍රතිපත්තිමය ස්ථාවරයන් නිර්මාණය කරගැනීමේදී සංවිධාන විසින් ඒ කෙරෙහි අවධානය යොමුකළ යුතුව තිබේ.

- තොරතුරු එක්රැස් කිරීම - මෙමගින් සංවිධානවලට තම ප්‍රතිපත්තිමය ස්ථාවරයන් පිළිබඳ වඩා හොඳ විනිශ්චයන් සිදුකිරීමට අවස්ථාව ලැබේ.
- එම තොරතුරු කාර්යක්ෂම අන්දමින් කළමනාකරණය කරමින් භාවිතා කිරීම සඳහා ක්‍රමවේදයන් සැකසිය හැකිය.
- සියල්ලන් ඇතුළත් කරගනිමින්, කාලීන අන්දමින් උපදෙස් විමසීමක් පවත්වන ආකාරය

### මොඩියුලය 1

#### තොරතුරු එක්රැස් කිරීම

කාලීන ප්‍රශ්න පිළිබඳ දැනුවත් වීමේදී තොරතුරු එක්රැස් කිරීම ප්‍රධාන භූමිකාවක් ඉටුකරයි. සෑම උද්දේශන සංවිධානයක් විසින්ම තොරතුරු එක්රැස් කිරීම සම්බන්ධයෙන් තත්කාර්යවාදී හා ප්‍රායෝගික ප්‍රවේශයක් අනුගමනය කළ යුතුය.

**ගුණාත්මක දත්ත එක්රැස් කිරීමේ මෙවලම්**

විස්තරාත්මක (සංඛ්‍යාත්මක නොවන) දත්ත මගින් චර්යා, අත්දැකීම් හෝ විශ්වාසයන්, කෙසේද හා ඇයි යන ප්‍රශ්නවලට පිළිතුරු ලෙස දැක්ම සපයයි.

මෙවලම්: සම්මුඛ සාකච්ඡා, ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා

**දත්ත එකතු කිරීමේ මෙවලම්**

මේවා සංඛ්‍යාත්මකය. ප්‍රමාණාත්මකව ගණනය කළ හැකිය. සංඛ්‍යාත්මකව විශ්ලේෂණය කළ හැකිය. සාධක අතර සම්බන්ධතා නිර්මාණය කරයි. කුමක්ද, කොපමණද හෝ කවුරුද යන ප්‍රශ්නවලට පිළිතුරු සපයයි.

මෙවලම්: තක්සේරු, පරීක්ෂණ, සමීක්ෂණ

**අභ්‍යාසය**

තොරතුරු එක්රැස් කිරීමේදී ඔබගේ සංවිධානය වර්තමානයේදී භාවිතා කරන ක්‍රම පහක් ලියන්න. එම එක් එක් ක්‍රමයේදී ඔබ මුහුණදෙන ප්‍රායෝගික අභියෝග සටහන් කරන්න. ඔබට එම අභියෝග පරාජය කළ හැක්කේ කෙසේදැයි ඔබගේ සගයන් සමග සාකච්ඡා කරන්න.



**පහත දැක්වෙන්නේ ප්‍රයෝජනවත් තොරතුරු මූලාශ්‍රයි:**

1. රජයේ නිල වාර්තා හා ප්‍රකාශන
2. ගැසට් නිවේදන
3. ජාත්‍යන්තර ප්‍රවෘත්ති
4. පොලිස් වාර්තා
5. පුවත්පත් හා විද්‍යුත් මාධ්‍ය
6. ජාත්‍යන්තර සංවිධාන හා රාජ්‍ය නොවන සංවිධානවල වාර්තා



ඔබගේ ප්‍රතිපත්තිමය තීරණවලට අදාළ වන අන්තර්ගතයන්, දත්ත හා සංඛ්‍යාලේඛන ප්‍රවණතා සම්බන්ධයෙන් මෙම මූලාශ්‍ර වැදගත් වේ. කෙසේ වෙතත්, ඒවා මුල් මූලාශ්‍රවලින් ලබාගන්නා දත්ත මගින් තහවුරු විය යුතුය. එම දත්ත ලබාගත යුත්තේ ප්‍රතිපත්ති හේතුවෙන් බලපෑමට ලක්වූ ජනයාට කෙළින්ම කතාකිරීමෙනි. ඔබගේ සංවිධානයේ සාමාජිකයන් සහ පොදු ජනතාව අතර ඒ පිළිබඳ සැලකිලිමත් පුද්ගලයන් සමග එසේ සාකච්ඡා කළ හැකිය. මුල් මූලාශ්‍රවලින් දත්ත ලබාගැනීම හේතු ගණනාවක් නිසා වැදගත් වේ.

1. කරුණු පරීක්ෂා කිරීම සඳහා (ඇතැම් නිල මූලාශ්‍ර වැඩි විශ්වාසවන්තභාවයකින් යුක්තය)
2. ප්‍රතිපත්ති ජනතාවට බලපාන ආකාරය සහ එමගින් ඔවුන් මුහුණදෙන ප්‍රශ්නවල කුමන වෙනසක් ඇතිකරන්නේද යන්න අවබෝධ කරගැනීම සඳහා
3. සංදර්භය හා ප්‍රයෝජනවත් සිද්ධි අධ්‍යයන සැපයීම සඳහා. ඔබගේ ප්‍රතිපත්තිමය ස්ථාවරය වෙනුවෙන් බලපෑම් කිරීමේදී මේවා ප්‍රයෝජනවත් විය හැකිය.

ඔබගේ වත්මන් මූලාශ්‍ර ලක්ෂ්‍ය නැවත අධ්‍යයනය කරන්න. එහි කෙතරම් මුල් මූලාශ්‍ර අඩංගු වේද?

දත්ත එක්රැස් කිරීමේ විකල්ප ක්‍රම ද තිබේ.

මානව හිමිකම් සම්බන්ධ අලුත් උපායමාර්ග මගින් ඇතැම් විකල්ප ක්‍රම සම්බන්ධ සුවිශේෂ උදාහරණ සැපයේ.

- සිතියම්:
- ජංගම දුරකථන හා කෙටි පණිවුඩ සේවා
- අන්තර්ජාලය හා ජංගම දුරකථන ක්‍රීඩා




## මොඩියුලය 2

### තොරතුරු සංවිධානය හා බෙදාගැනීම

ඔබ තොරතුරු එක්රැස් කරන විට, ඒවා සංවිධානය කිරීම, බෙදාගැනීම හා අභ්‍යන්තරව භාවිතා කිරීම සඳහා ඔබට ක්‍රමවේදයක් තිබිය යුතුය. එමගින් ඔබට තොරතුරු ඵලදායී ලෙස භාවිතා කිරීමේ හැකියාව ලැබේ. විවෘත අන්දමින් තොරතුරු බෙදාගැනීම ඔබගේ සාමාජිකයන් අතර තොරතුරු බෙදාගැනීම සඳහා නිර්මාණාත්මක ක්‍රමවේදයකි. විවෘත තොරතුරු බෙදාගැනීමෙන් අදහස් කරනු ලබන්නේ නිදහස් හුවමාරුව දිරිගන්වන සංවිධානමය හා තාක්ෂණික යටිතලයක් නිර්මාණය කිරීමයි. එහෙත්, වගකීම් විරහිතව තොරතුරු භාවිතා කරන්නන් සම්බන්ධයෙන් පාලනයන් ද එහි අඩංගු වේ.



ගබඩාකර තබාගැනීම වටින්නේ කුමන තොරතුරුද?

- නිල මූලාශ්‍රවලින් රැස්කරන ලද දත්ත හා වාර්තා - මේවා ඔබගේ ප්‍රතිපත්ති සඳහා සාක්ෂි ලෙස භාවිතා කළ හැකිය
- ක්ෂේත්‍ර කාර්යාලවල වාර්තා
- සිද්ධි අධ්‍යයන හා සාමාජිකයන්ගේ, පුරවැසියන්ගේ හෝ පොදු ජනතාවගේ සම්බන්ධතා - ඡායාරූප හා වීඩියෝ ඇතුළුව
- සන්නිවේදනයේදී හා උපදෙස් විමසීමේදී ඔබ විසින් ප්‍රයෝජනවත් ලෙස සලකනු ලබන පරදූ දරන්නන්ගේ දත්ත පදනමක්

තොරතුරු ගබඩා කර තබාගැනීමේදී සැලකිය යුතු මූලධර්ම කිහිපයක්:

**1. අන්තර්ගතය දැනටමත් ප්‍රසිද්ධ කර තිබේද?** රාජ්‍ය නොවන සංවිධාන විසින් ප්‍රසිද්ධ කරන ලද නිල වාර්තා, ප්‍රවෘත්ති වාර්තා සහ දත්ත වෙනත් අයට ද පරිහරණය කළ හැකි පොදු ගොනුවල ගබඩා කළ හැකිය. එම දත්ත සංවිධානය කිරීමේ, යාවත්කාලීන කිරීමේ සහ ඒවා වෙත ප්‍රවේශය පාලනය කිරීමේ වගකීම එක් පුද්ගලයකුට පැවරිය හැකිය. සංවිධානයේ අදාළ සෑම පුද්ගලයකුටම මෙම දත්ත ලබාගෙන තම කටයුතු සඳහා භාවිතා කළ හැකි විය යුතුය. එම දත්ත නිරතුරුව යාවත්කාලීන කළ යුතුය. සටහන: දත්ත හා වාර්තා ඔබගේ ප්‍රතිපත්ති ස්ථාවරයන්ට සහයෝගී වේ නම්, ඔබගේ වෙබ් අඩවියේ මුල් අන්තර්ගතයන්ගේ සබැඳි පළකිරීම ද ප්‍රයෝජනවත් විය හැකිය.

**2. අප දත්ත ගබඩා කරන්නේ කොහිද?** සෙසු අය සමග හවුලේ භාවිතා කරනු ලබන දත්ත ගබඩා කරනු ලබන Google, Dropbox, Box, Diligent සහ Teams වැනි විවිධ ක්‍රම තිබිය හැකිය. මෙම ගොනු පද්ධති ආරක්ෂිත බව තහවුරු කරන්න. සෑම ෆෝල්ඩරයකටම හිමිකරුවකු සිටින අතර එම අන්තර්ගතය පවත්වාගෙන යාම සහ එය වෙත ප්‍රවේශය කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් එම පුද්ගලයා වගකිව යුතුය. අන්තර්ගතයන්ගේ පිටපත් තබාගැනීම පිළිබඳ සලකා බලන්න. ක්ලවුඩ් ගබඩා භාවිතා කරන්නේ නම්, ආරක්ෂක ප්‍රොටොකෝල අනුගමනය කරනු ලබන බව තහවුරු කරන්න.

**3. තොරතුරු අතර ආරක්ෂිත දත්ත තිබේද?** මුල් මූලාශ්‍රවලින් තොරතුරු එක්රැස් කිරීම ප්‍රශ්න තේරුම්ගැනීමේදී ඉතා වැදගත්ය. ප්‍රචාරණ ප්‍රකාශන සැලසුම් කිරීමේදී ද ඒවා ඉතා ප්‍රයෝජනවත්ය. එමගින් ක්‍රියාමාලාවන්ට ජීවයක් ලැබේ. කෙසේ වෙතත්, මෙම තොරතුරු ගබඩා කර තබාගැනීමේදී වගකීම් සහගත විය යුතුය. ඒවා වෙනත් අය සමග බෙදාගත යුත්තේ මුල් ප්‍රකාශකවරයාගේ අවසරය සහිතවය. තම තොරතුරු බෙදාගැනීමට අකැමැත්තක් දක්වන මුල් ප්‍රකාශකයන්ගේ කැමැත්තට ගරුකළ යුතුය.

පුද්ගලයන්ගෙන් හා සංවිධානවලින් වාර්තා එක්රැස් කරගන්නා විට, බෙදාගනු ලබන්නේ කුමන තොරතුරුද, ඒවා බෙදාගන්නේ ඇයි, බෙදාගන්නේ කා සමගද යන්න විවෘතව පවසන්න. ඒ සඳහා ඔවුන්ගේ එකඟතාව ලබාගන්න. වාර්තාව ලබාදුන් පුද්ගලයන් හෝ සංවිධාන නියෝජිතයන් සමග ඒ පිළිබඳ කරන ලද සාකච්ඡාව පැවැත්වූ ඔබ සංවිධානයේ සාමාජිකයාගේ නම, සාකච්ඡාව පැවැත්වූ දිනය සහිත සටහනක් ඇතුළු කරුණු පරීක්ෂක ලැයිස්තුවක් තබාගැනීම හොඳ භාවිතාවකි. පසු දිනකදී විමසීමට අවශ්‍ය වුවහොත්, එසේ කිරීම සඳහා අදාළ පුද්ගලයාගේ සම්බන්ධතා විස්තර ගබඩා කර තබාගැනීමට මතක තබාගන්න.

සිද්ධි අධ්‍යයන භාවිතා කිරීමේදී, ඔවුන්ගේ කතාව බෙදාහදාගැනීම සම්බන්ධයෙන් ඔවුන් තවමත් සතුටුද යන්න නැවත පරීක්ෂා කරගැනීම සඳහාත්, අදාළ තොරතුරු යාවත්කාලීන කරගැනීම සඳහාත් අදාළ පුද්ගලයා හෝ සංවිධානය වෙත යොමුවීම ද මනා භාවිතාවකි.

ඊමේල් ලිපිනයන්, දුරකථන අංක, වයස හා ලිපිනය වැනි පෞද්ගලික තොරතුරු ගබඩා කිරීමේදී ආරක්ෂක ප්‍රොටොකෝල අනුව කටයුතු කිරීමට වගබලාගන්න. විශේෂයෙන්ම, අදාළ පුද්ගලයා නිර්නාමිකව සිටීමට අවශ්‍ය බව ප්‍රකාශ කර තිබේ නම් එයට ගරුකරන්න.



**ක්‍රියාකාරකම**

ඔබගේ සංවිධානය වෙනුවෙන් යෝග්‍ය තොරතුරු එක්රැස් කිරීමේ, ගබඩා කිරීමේ හා බෙදාගැනීමේ සැලැස්මක් සකස් කරන්න. එහි එක් එක් වගකීම සඳහා සංවිධාන සාමාජිකයන් නම්කරන්න.

.

## මොඩියුලය 3

### උපදෙස් විමසීම

ප්‍රතිපත්ති නිර්මාණය කිරීම සඳහා අභ්‍යන්තරික හා බාහිර උපදෙස් විමසීම් අඩංගු පැහැදිලි ක්‍රියාවලියක් අවශ්‍යය. නායකත්ව විලාසය හා සංවිධානයක සංස්කෘතිය ප්‍රතිපත්ති නිර්මාණය අධ්‍යයනය කිරීමේදී වැදගත් සාධක වේ.

### 2.3.1 අභ්‍යන්තර උපදෙස් විමසීම - මනා භාවිතාවන්

1. ඔබගේ සංවිධානය තුළ ප්‍රතිපත්ති සංවර්ධනය සම්බන්ධයෙන් වගකිව යුත්තේ කවුරුද යන්න පැහැදිලි විය යුතුය. සාමාජිකයන්ට/ කාර්ය මණ්ඩලයට/ ස්වේච්ඡා සේවකයන්ට ඒ වෙනුවෙන් අදහස් ඉදිරිපත් කිරීමට තිබෙන ක්‍රියාවලිය කුමක්ද යන්න ද පැහැදිලි විය යුතුය. එහිදී ඇසිය යුතු ප්‍රශ්න කීපයක්:

- නිරන්තර රැස්වීම් තිබේද?
- සියලු සාමාජිකයන්ගෙන් උපදෙස් විමසනවාද?
- වෙනත් අයගේ යෝජනා සාකච්ඡා කරන ක්‍රියාවලිය කුමක්ද?
- තම අදහස් පිළිනොගැනීමට හේතු පිළිබඳ ප්‍රතිපෝෂණය පුද්ගලයන්ට ලැබෙනවාද? තම අදහස් මත ක්‍රියාත්මක වුවහොත් ප්‍රශංසා ලැබෙනවාද?

2. ඔබ පුද්ගලයන්ගෙන් උපදෙස් විමසන විට, ප්‍රතිපත්ති නිර්මාණය කිරීම සම්බන්ධයෙන් ඔබ විසින් ළඟාවී තිබෙන මට්ටම පිළිබඳ පැහැදිලිව තේරුම්ගන්න. එය ඔබ විසින් නිර්මාණාත්මක සහ සාධනීය අදහස් සොයමින් සිටින බුද්ධි කලම්බනයක්ද? නැතිනම්, එය වනාහි නිර්මාණය කරගෙන තිබෙන ප්‍රතිපත්තියක් සම්බන්ධයෙන් ඉතා නිශ්චිත අන්දමින් උපදෙස් විමසීමක්ද?

3. වෙනත් අය වෙත ළඟාවීමේදී ඔබ විසින් අත්පත් කරගැනීමට බලාපොරොත්තු වන දේ ඔබටම පැහැදිලි කරගන්න. ඔවුන්ගේ ප්‍රතිචාර සම්බන්ධයෙන් ඔබ අව්‍යාජවම විවෘත මනසකින් යුක්තද? ඔබට ප්‍රතිපත්තිමය ස්ථාවරය සම්බන්ධයෙන් සහයෝගය ලබාගැනීමට සිදුවේවිද? යෝජිත ප්‍රතිපත්තියක් සම්බන්ධයෙන් ඔබ සහාය අපේක්ෂා කරනවාද? සෑම අවස්ථාවකදීම වෙනස් ප්‍රවේශයක් හා සන්නිවේදන මාදිලියක් අවශ්‍ය වේ.

### 2.3.2 බාහිර උපදෙස් විමසීම

**පහත දැක්වෙන්නේ ප්‍රතිපත්ති උපදෙස් විමසීම්වල ප්‍රධාන අභිමතාර්ථයි**

- අපගේ දැනුම වර්ධනය කිරීම
- වැදගත් ප්‍රශ්න නිර්ණය කිරීම
- අපගේ ප්‍රතිපත්තිමය තීරණ සම්බන්ධයෙන් දැනුම ලබාගැනීම
- පරදු දරන්නන් වෙත තොරතුරු සැපයීම සඳහා උපකාර කිරීම





### ඵලදායී ප්‍රතිපත්ති උපදෙස් විමසීම් සඳහා මූලධර්ම

පහත දැක්වෙන්නේ තම ප්‍රතිපත්ති සංවර්ධන ක්‍රියාවලිය වෙනුවෙන් Volunteering Australia සංවිධානය විසින් හඳුනාගෙන තිබෙන මූලධර්මයි. මෙවැනි පැහැදිලි මාර්ගෝපදේශ මගින් සංවිධානයකට තම උපදෙස් විමසීමේ ක්‍රියාවලිය පටු කරගත හැකිය. .

උපදෙස් විමසීම් පහත දැක්වෙන ලක්ෂණවලින් යුක්ත විය යුතුය:

**ප්‍රගාමී** – උපදෙස් විමසීම මගින් අලුත් ප්‍රශ්න හඳුනාගැනීමට උත්සාහ කරනු ලැබේ. එසේම, තිබෙන ප්‍රශ්න සම්බන්ධයෙන් දැනුම වර්ධනය කරගනු ලැබේ..

**කාලීනබව** – උපදෙස් විමසීම පැවැත්වෙන්නේ කාලරාමුවකට අනුවය. එමගින්, ප්‍රතිදානවලට බලපෑම් කිරීමේලා සංවිධානවලට එම ප්‍රතිඵල මැනැවින් භාවිතා කළ හැකිය. උපදෙස් විමසීමේ ක්‍රියාවලිය පිළිබඳ තොරතුරු කාලානුරූප හා වෘත්තිකමය අන්දමින් බෙදාගත යුතුය.

**සිදුවෙමින් පැවතීම** – අපගේ පරදු දරන්නන්ගේ දැනුම හා අත්දැකීම් වෙනස් වේ. එම නිසා, ප්‍රතිපත්ති සම්බන්ධයෙන් උපදෙස් විමසීම ඉදිරියට යන ක්‍රියාවලියකි.

**සාක්ෂාත් කරගත හැකි** – අපගේ පරදුදරන්නන්ගෙන් උවමනාවට වඩා දේ බලාපොරොත්තු වන ආකාරයට අපගේ ක්‍රියාවලි හැඩගස්වාගත යුතුය.

**අගය කිරීම** – උපදෙස් විමසීම්වලට සහභාගී වීම සුදුසු පරිදි ඇගයීමට ලක්විය යුතුය.

**සන්නිවේදනය කිරීම** – ප්‍රතිපත්ති ක්‍රියාකාරකම්වල ප්‍රතිදාන පිළිබඳ ප්‍රතිපෝෂණය උපදෙස් විමසීමට සහභාගී වූ පරදු දරන්නන්ට සපයනු ලැබේ.

## 2.3.3 උපදෙස් විමසීමේ ක්‍රියාවලියක් සංවිධානය කරන ආකාරය

ඔබට අවශ්‍ය පරිදි ඔබගේම උපදෙස් විමසීමේ ක්‍රියාවලියක් නිර්මාණය කළ හැකිය.

**දීර්ඝ කාලරාමුවක් (මාසයක් දක්වා) ගතවන උපදෙස් විමසීමේ ක්‍රියාවලි**

- වැදගත් ප්‍රධාන ප්‍රශ්න සම්බන්ධයෙන් පරදු දරන්නන් වෙතින් ලිඛිත උපදෙස් විමසීම් කැඳවන්න.
- කෙටි සමීක්ෂණයක් පවත්වන්න (පරදු දරන්නන් වෙනුවෙන් මෙම තොරතුරු ඉල්ලීම් කළමනාකරණය කරගත හැකි මට්ටමක තබාගැනීම සඳහා සමීක්ෂණ පවත්වන කාලාන්තරයන් අධීක්ෂණය කරන්න)
- ප්‍රශ්න සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීම හා ප්‍රතිපත්තිමය ප්‍රතිචාර සංවර්ධනය කිරීම සඳහා පරදු දරන්නන් අතර වගකීම් කණ්ඩායම් ගොඩනගන්න.

**වඩා ඉක්මන් තීරණ ගැනීම සඳහා පැවැත්විය හැකි උපදෙස් විමසීම්:**

- වැදගත් ප්‍රශ්න සකස් කරගැනීම/ ගැටලු තෝරාගැනීම සඳහා අන්තර්ජාල සමීක්ෂණ පවත්වන්න.
- අදාළ පරදු දරන්නන් හඳුනාගෙන දුරකථන මගින් ඔවුන්ගේ උපදෙස් ලබාගන්න.

• ප්‍රශ්නය යම් අංශයකට අදාළ විටදී, ඉලක්කගත ආකාරයකින් එම ක්ෂේත්‍රය තුළ පවතින විවිධ දැක්ම පරාසයක් ගොනුකරගන්න. කුඩා සංවිධාන, විශාල (ජාතික සංවිධාන ද ඇතුළු) සංවිධාන හා උද්දේශන ක්‍රියාවලියක් සහිත සංවිධාන වශයෙන් එසේ ගොනුකරගත හැකිය.

උපදෙස් විමසීමේ ක්‍රියාවලියට සම්බන්ධ කරගත හැකි සම්ප්‍රදායික උපායමාර්ග රැසක් තිබේ. ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා **(focus group discussions - FGDs)** හා වැදගත් තොරතුරු සපයන්නන් සමග සම්මුඛ සාකච්ඡා **(key informant interviews - KIIs)** උදාහරණ වේ.

**ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාවක් සැලසුම් කරන ආකාරය**

නිශ්චිත මාතෘකාවක් හෝ උනන්දු වන කාරණයක් ගැන සාකච්ඡා කිරීම සඳහා සමාන පසුබිම් හෝ අත්දැකීම්වලින් යුත් පිරිස් ඒකරාශී කිරීම ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාවකි. එය ගුණාත්මක පර්යේෂණ ස්වරූපයකි. එහිදී ප්‍රශ්න අසනු ලබන්නේ දැක්ම, ආකල්ප, විශ්වාසයන්, මතවාද හෝ අදහස් පිළිබඳවයි. ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාවලදී සහභාගී වන්නන්ට කණ්ඩායමේ වෙනත් සාමාජිකයන් සමග නිදහසේ කතා කළ හැකිය. සාමාන්‍යයෙන් එයට සහභාගී වන්නේ කුඩා කණ්ඩායමකි (8-12 අතර). මැදිහත්කරුවකු හෙවත් සම්මුඛ සාකච්ඡා මෙහෙයවන්නකු විසින් එය හසුරුවනු ලැබේ. සාකච්ඡාව ලිහිල් ලෙස ව්‍යූහගත කර තිබේ. උනන්දු වන විවිධ මාතෘකා එහි අඩංගුය.

වැඩිදුර හදාරන්න මෙතනින්.

වැදගත් තොරතුරු සපයන්නන් සමග සම්මුඛ සාකච්ඡා යනු ගුණාත්මක, ගැඹුරු සම්මුඛ සාකච්ඡා වේ. වැදගත් මාතෘකාවක් සම්බන්ධයෙන් ඔවුන් සතු විශේෂ දැනුමක් ඇති අය මේ සඳහා තෝරාගනු ලැබේ.

වැඩිදුර හදාරන්න මෙතනින්



සිද්ධි අධ්‍යයනය - 5

මානව හිමිකම් පිළිබඳ **ASEAN** අන්තර් රාජ්‍ය කොමිෂන් සභාව **(AICHR)**

ගිනිකොණදිග ආසියානු ජාතීන්ගේ සංවිධානය (ASEAN) විසින් මානව හිමිකම් පිළිබඳ කොමිෂන් සභාවක් (AICHR) 2009දී පිහිටුවන ලදී. එය යහපත් මුලපිරුමක් ලෙස පෙනුණද, සිවිල් සමාජ සංවිධාන එහි ස්වාධීනත්වය පිළිබඳ සැලකිලිමත් වූහ. එයට හේතුව, එම කොමිෂන් සභාවේ නියෝජිතයන් දහදෙනා තෝරාගනු ලබන්නේ සාමාජික රාජ්‍යවල ආණ්ඩු විසින් වීමයි. උපදෙස් විමසීම් මත පදනම් වූ, විනිවිද පෙනෙන තෝරාගැනීමේ යාන්ත්‍රණයකට ASEAN රාජ්‍ය කැමැත්තක් දැක්වූයේ නැත. එහි ප්‍රතිඵලයක් ලෙස, AICHR නියෝජිතයන් විශ්වාස කරන්නේ ඔවුන් වගකිව යුත්තේ ඔවුන් තෝරාගත් ආණ්ඩුවලට මිස ජනතාවට නොවන බවයි. මේ දක්වාම, AICHR නියෝජිතයන් කලාපයේ බරපතලම මානව හිමිකම් ප්‍රශ්නවලට අතගසා නැත. මියන්මාරයේ රෝහින්ග්‍යා අර්බුදය හා පිලිපීනයේ අනීතික ඝාතන ඒ අතර වේ. එහිදී කොමිෂන් සභා සාමාජිකයන් පවසන්නේ ඔවුන්ට වෙනත් සාමාජික රාජ්‍යවල ස්වෛරීත්වයට බලපෑම් කළ නොහැකි බවයි. මෙමගින් මානව හිමිකම් කොමිෂන් සභාවේ ඵලදායීතාවට බලපෑමක් සිදුවේ. වැදගත්ම මානව හිමිකම් ප්‍රශ්න එයට මගහැරී යාම එයට හේතුවයි.

**අරමුණ:** කලාපීය යාන්ත්‍රණය මගින් ආසියාවේ මානව හිමිකම් ගැටලු කෙරෙහි ප්‍රමාණවත් අවධානය යොමු කරන බව තහවුරු කිරීම

**මූලෝපාය:** AICHR ස්වාධීනත්වය පුළුල් කරන්නට සහ මානව හිමිකම් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් වඩා අරුත්බර ක්‍රියාමාර්ග ගැනීමට ASEAN රාජ්‍යයන්ට බලකිරීම

**උපායමාර්ග:** FORUM-ASIA, යනු බැංකොක් කේන්ද්‍ර කරගත් සාමාජිකත්වය මත පදනම් වූ මානව හිමිකම් සංවිධානයකි. AICHR සඳහා තෝරාගැනීමේ යාන්ත්‍රණයක් සැකසීම සඳහා අපේක්ෂකයන්ගේ ස්වාධීනත්වය මැනීම සඳහා සංයුක්ත නිර්ණායක සැකසීම පිණිස FORUM-ASIA විසින් සිවිල් සමාජ සංවිධානවලට උපකාර කරන ලදී. සිවිල් සමාජ සංවිධාන විසින් ASEAN විදේශ අමාත්‍යාංශය, ASEAN ලේකම් කාර්යාංශය සහ AICHR සමග සංවාදයක් ආරම්භ කරන ලදී. ඉන්දුනීසියාවේ, මැලේසියාවේ හා තායිලන්තයේ මාධ්‍ය ආයතන සමග එක්ව ස්වාධීන තෝරාගැනීමේ පටිපාටියක් සම්පාදනය කිරීම සඳහා එම රටවල ආණ්ඩුවලට බලපෑම් කිරීම ආරම්භ කරන ලදී. එයට අමතරව, අදාළ විදේශ කටයුතු අමාත්‍යාංශ සමග එක්ව රටවල් ඉලක්ක කරගත් සන්නිවේදනයන් ද ආරම්භ කරන ලදී. FORUM-ASIA සහ එහි හවුල්කරුවන් විසින් උද්දේශන ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. එය පදනම් වූයේ AICHR පිළිබඳ FORUM-ASIAහි වාර්ෂික කාර්යසාධන ඇගයීම මතය. AICHR නියෝජිතයන් සඳහා විවෘත හා ස්වාධීන තෝරාගැනීමේ පටිපාටියක් සඳහා අඛණ්ඩව නිර්දේශ කරන ලදී. එය ක්‍රියාත්මක කර තිබුණේ ඉන්දුනීසියාව විසින් පමණි.

**බලපෑම:** මැලේසියාවේ ප්‍රතිසංස්කරණ රැල්ල සහ තායිලන්තයේ හා ඉන්දුනීසියාවේ මාධ්‍ය බලපෑම භාවිතා කරමින්, AICHR නියෝජිතයන් තෝරාගැනීම සඳහා වඩා විනිවිද පෙනෙන හා සිවිල් සමාජ වෙත යොමුවූ තෝරාගැනීමේ ක්‍රියාවලියක් සම්පාදනය කිරීමට FORUM-ASIA සහ එහි සාමාජික සංවිධාන විසින් ASEAN සංවිධානයේ ආණ්ඩුවලට සාර්ථක ලෙස බලපෑම් කරන ලදී. එම ප්‍රයත්නයන් ඔස්සේ තරමක් ස්පර්ශනීය ප්‍රතිඵල ලැබිණි. මේ වන විට, AICHR නියෝජිතයන්ගෙන් 30%ක් තෝරාගනු ලබන්නේ මෙම විනිවිද පෙනෙන පටිපාටිය ඔස්සේය. ඔවුන් විසින් සිවිල් සමාජ සංවිධානවල උවමනාවන් ස්වාධීන ලෙස නියෝජනය කරනු ලැබේ. 2019 වර්ෂයේදී, රෝහින්ග්‍යා අර්බුදය සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ආරක්ෂණ යාන්ත්‍රණය ශක්තිමත් කිරීමට අදාළ AICHR සේවා කොන්දේසි (ToR) ASEAN විදේශ ඇමතිවරුන් විසින් සම්මත කරන ලදී. තම සේවා කොන්දේසි සමාලෝචනය කිරීම සඳහා පටිපාටියක් සම්පාදනය කරගැනීම සඳහා අවසානයේදී AICHRට අවුරුදු දහයක් ගතවිය. එයට අමතරව, 2019දී, ඉන්දුනීසියාවේ හා මැලේසියාවේ AICHR නියෝජිතයන් විසින් ප්‍රකාශනයේ නිදහස පිළිබඳ කලාපීය සංවාදයක් සංවිධානය කරගැනීම සඳහා එක්සත් ජාතීන්ගේ යාන්ත්‍රණයෙහි උපදෙස් විමසන ලදී. මෙම ක්‍රියාමාලාවට පෙර එවැනි සාකච්ඡාවක් ලබාගැනීම දුෂ්කර කාර්යයක් විය..

සිද්ධි අධ්‍යයන විශ්ලේෂණය

පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු දීම සඳහා ඉහත දක්වන ලද සිද්ධි අධ්‍යයනය භාවිතා කරන්න. විය හැකි පරදු දරන්නන් කල්තබා හඳුනාගැනීමට මතක තබාගන්න. ඉන්පසු පහත දැක්වෙන ආකාරයට ඔවුන් විශ්ලේෂණය කරන්න.

1. ඔවුන්ගේ අරමුණු මොනවාද?
2. ඔබගේ කාර්යයන් සම්බන්ධයෙන් ඔවුන් උනන්දු වන්නේ ඇයි? ඒ ගැන ඔබට කළ හැක්කේ කුමක්ද?
3. ඔබගේ සංවිධානය ගැන ඔවුන් සිතන්නේ කුමක්ද?
4. ප්‍රශ්නයට සම්බන්ධ ගැටලුව පිළිබඳ ඔවුන්ගේ දැක්ම කුමක්ද?
5. ඔබගේ පරදු දරන්නාගේ දැක්මට බලපෑම් කරන්නේ කවුරුද? කුමක්ද?
6. ඔවුන් බලපෑම් කරන්නේ කාටද?
7. ඔබගෙන් ඔවුන්ට අවශ්‍ය කුමන තොරතුරුද? ඔබ ලබාදීමට කැමති කුමන තොරතුරුද? ඒවා ලබාදෙන ක්‍රමය කුමක්ද?
8. පරදු දරන්නකු ඒ ගැන සාධනීය ලෙස සිතන්නේ නම්, ප්‍රශ්නය සමග සෘජුව සම්බන්ධ වීම සඳහා ඔවුන්ට තිබෙන උනන්දුව කුමක්ද? ඔවුන් විසින් කළ යුතු යයි ඔබ සිතන්නේ කුමක්ද?
9. පරදු දරන්නන් සාධනීය ප්‍රතිචාර දක්වන්නේ නැතිනම්, ඔවුන් පොළඹවාගත හැකි යම් ක්‍රමයක් තිබේද?
10. ඔබට ඔවුන් පොළඹවාගත නොහැකි නම්, ඔබට ඔවුන් කළමනාකරණය කරගෙන ඔවුන්ගේ විරෝධය අවම කරගත හැකි ආකාර මොනවාද?
11. ඔබේ තර්කය සඳහා පරදු දරන්නන් කොතරම් වැදගත්ද?

## සම්පත් කළමනාකරණය

### මොඩියුලය 1

#### සම්පත් වර්ග

උද්දේශන සංවිධාන ඒවායේ ප්‍රමාණය අනුව වෙනස් වේ. ඇතැම් ඒවායේ පූර්ණකාලීන කාර්ය මණ්ඩල සිටින අතර සමහර ඒවා පවත්වාගෙන යන්නේ තනිකරම ස්වේච්ඡා සේවකයන්ගෙනි. සංවිධානයේ ප්‍රමාණය කුමක් වුව ද, සම්පත් සැලසුම් කිරීම හා ප්‍රමුඛතාකරණය යථාර්ථවාදී අරමුණු සකසාගැනීමේදී වැදගත් වේ. මනා සැලසුම්කරණය හා නිර්මාණශීලී ප්‍රවේශය හේතුවෙන් කුඩාම උද්දේශන සංවිධානයකට පවා අරමුදල් සම්පාදනය කරගෙන සහයෝගය දිනාගැනීමේදී සාර්ථක විය හැකිය.

උද්දේශන සංදර්භයේදී වර්ග කීපයකට අයත් සම්පත් අවශ්‍ය වේ.

**ශ්‍රමය:** සෑම සංවිධානයකටම මානව ශ්‍රමය අවශ්‍යය. ස්වේච්ඡා වුවද, වැටුප් ශ්‍රමය වුවද, ඔබගේ ආයතනය සඳහා අවශ්‍ය වන සමස්ත ශ්‍රමය මෙහිදී අදාළ වේ.

**කළමනාකරණය:** මග පෙන්වීමකින් තොර වූ විට බොහෝ සංවිධානවලට අත්පත් කරගත හැක්කේ සුළු ප්‍රතිඵලයකි. එම නිසා කළමනාකරණ කුසලතා සහ ඒවා ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය මූලාශ්‍රයකි.


**විශේෂඥභාවය:** සංවිධානයකට සැබැවින්ම සාර්ථක වීම සඳහා ශ්‍රමය හා කළමනාකරණය විශේෂඥභාවයකින් යුතුව සිදුවිය යුතුය. ඔබගේ ක්ෂේත්‍රය හා භාවිතාවන් පිළිබඳ දැනුම සාර්ථකත්වය සඳහා ඉතා වැදගත්ය.

**උපකරණ:** තම කාර්යයන් සිදුකිරීම සඳහා සංවිධානවලට විශේෂඥ මෙවලම් අවශ්‍යය. එය විශේෂ කාර්යයක් වෙනුවෙන් නිෂ්පාදිත දෘඪාංගයක්, මෘදුකාංගයක් හෝ යන්ත්‍රයක් විය හැකිය.

**මූල්‍ය:** සංවිධානයක අරමුදල් වෙනත් සම්පත් භාවිතා කිරීමට ද අවස්ථාව ලබාදෙයි. ආදායම් මූලාශ්‍ර අතරට සාමාජික ගාස්තු ද ඇතුළත් වේ.

**කාලය:** කිසිදු ව්‍යාපාරයකට තම අරමුණු ක්ෂණිකව සාක්ෂාත් කරගත නොහැකිය. සෑම ව්‍යාපාරයක් විසින්ම කාලය සම්පතක් ලෙස සැලකිය යුතුය.

ඔබගේ ව්‍යාපාරය විසින් භාවිතා කරනු ලබන සම්පත් පිළිබඳ සිතන විට, දෛනිකව හෝ දීර්ඝකාලීනව දිගටම කරගෙන යා යුතු දේ පිළිබඳ සලකා බලන්න.





**ක්‍රියාකාරකම**

ඔබගේ සංවිධානය සතුව තිබෙන සම්පත් සමහරක ලැයිස්තුවක් සකසන්න.
ඉහත දක්වන ලද මාර්ගෝපදේශය භාවිතා කරන්න.

මොඩියුලය 2

## සම්පත් කළමනාකරණ උපායමාර්ග සහ තාක්ෂණයන්: වාර්ෂික සැලැස්මක් සැකසීම

සම්පත් කළමනාකරණය සම්බන්ධ අභියෝග කීපයක් තිබේ. එම දුෂ්කරතා ජයගෙන කාර්යක්ෂම සම්පත් සැපයුමක් සහතික කිරීම සඳහා උපකාරී වන තාක්ෂණයන් හා උපායමාර්ග තිබේ.

එවැනි එක් තාක්ෂණයක් වන්නේ වාර්ෂික සැලැස්මක් සකස්කිරීමයි. එය වනාහි සිදුවීම් හා ක්‍රියාකාරකම් කල්තබා දැක්විය හැකි දිනපොතකි. එහි පහත සඳහන් කාරණා වැනි දේ අඩංගු විය හැකිය. .

- සාමාජිකයන්ට, ආධාරකරුවන්ට හා පරදු දරන්නන්ට යවනු ලබන පුවත් හසුන් (සතිපතා, මාසිකව)
- වාර්ෂික වාර්තා
- අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්
- වාර්ෂික සාමාජිකත්ව රැස්වීම්
- ස්වේච්ඡා බඳවාගැනීම්
- සම්මේලනවලට සහභාගී වීම
- ව්‍යවස්ථාපිත කාලසටහන්
- ප්‍රචාරණ ක්‍රියාමාලා
- ආධාරකරුවන්ට වාර්තා සැපයීම
- අරමුදල් චක්‍ර



වසර තුළදී සිදුවිය හැකි සියලු ක්‍රියාකාරකම් හා සිදුවීම් ලැයිස්තුගත කිරීමෙන් අනතුරුව, ප්‍රමාණවත් සම්පත් තිබෙන්නේ මොනවාටද, වැඩිපුර සම්පත් සැපයීමෙන් වාසි ලැබිය හැක්කේ කුමන ඒවාටදැයි සලකා බැලිය හැකිය. ක්‍රියාකාරකම් එකට යෙදෙන අවස්ථා තිබේද? එසේ නම්, ක්‍රියාකාරකම් අතර කාල පරතරයක් තැබිය හැකිදැයි බලන්න. නැතිනම්, වගකීම් නැවත බෙදාහැරිය හැකිදැයි බලන්න.

ඵලදායී වාර්ෂික සැලැස්මක අවසන් දින හා එක් එක් ක්‍රියාකාරකම සඳහා නම්කරන ද වගකිවයුතු පුද්ගලයන්ගේ නම් දැක්වේ.

.





## මෙහෙයුම් සැලැස්මක් සඳහා උදාහරණයක්

| වාර්ෂික මෙහෙයුම් සැලැස්ම | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ක්‍රියා | වගකිවයුතු පුද්ගලයාල | මෙවලම/ ආකෘතිය | Mar | Apr | May | Jun | Jul | Aug | Sep | Oct | Nov | Dec | Mar | Apr | May |
| වැඩසටහන සඳහා පරදු දරන්නන් හඳුනාගැනීම | වැඩසටහන් නිලධාරි | රැස්වීම් සහ කණ්ඩායම් සාකච්ඡා, පූර්ව තක්සේරු | ■ | ■ | ■ | | | | | | | | | | |
| අවදානම් කළමනාකරණය | ව්‍යාප්ති ප්‍රධානී | අවදානම් තක්සේරු පිරික්සුම් ලේඛනය | | | ■ | ■ | ■ | ■ | | | | | | | |
| සංවිධාන අයැදුම් | වැඩසටහන් නිලධාරි | අත්සන් සමග අයදුම්පත් | | | | | | | ■ | ■ | ■ | | | | |
| සංවිධාන වෙත කොන්ත්‍රාත් පිරිනැමීම | ප්‍රදාන නිලධාරි | ගිවිසුම්, අභ්‍යන්තර නියාමන | | | | | | | | | | ■ | ■ | ■ | |

## මොඩියුලය 3

### 3.3.1 සම්පත් සැලසුම් කිරීම

අභිමතාර්ථ වෙනුවෙන් කාලරාමු සටහනක් සකස් කරගන්නා ලෙස අපි පළමු කොටසෙහිදී ඔබට උපදෙස් දුන්නෙමු. උපකල්පිත කාලරාමු සටහනක පහත දැක්වෙන ලක්ෂණ තිබිය යුතු බව අපි කීවෙමු. :

- දිගුකාලීන අභිමතාර්ථ - වසර 3–5 අතර කාලයකදී සාක්ෂාත් කරගත හැකිය
- මධ්‍යකාලීන අභිමතාර්ථ - වසර 1–2 අතර කාලයකදී සාක්ෂාත් කරගත හැකිය
- කෙටිකාලීන අභිමතාර්ථ - මාස 6-වසර 1 අතර කාලයකදී සාක්ෂාත් කරගත හැකිය



බොහෝ මූලෝපායන් ක්‍රියාත්මක කිරීමේ අදියරේදී අසාර්ථක වේ. එයට හේතුව සම්පත් යථාර්ථවාදී ලෙස සම්පාදනය නොකිරීමයි. ඔබගේ මූලෝපාය ක්‍රියාත්මක කිරීමේදී, සෑම අභිමතාර්ථයක්ම සලකමින් අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග සලකා බලන්න. පහත දැක්වෙන ප්‍රශ්න අසන්න:

- **කළ යුත්තේ කුමක්ද?**
- **අවශ්‍ය වනු ඇත්තේ කුමන සම්පත්ද?**
  - **ජනතාව**
  - **තාක්ෂණය**
  - **කාලය**
  - **මුදල්**
  - **කාර්යාල අවකාශය**
  - **පුහුණුව**
  - **සහාය (නායකත්ව හෝ වෙනත්)**
- **එක් එක් ක්‍රියාකාරකමක හිමිකාරීත්වය ලබාගන්නේ කවුරුද?**
- **ක්‍රියාකාරකම සම්පූර්ණ කරන්නේ කවදාද?**



ඉඟි:

- සෑම ක්‍රියාකාරකමකම 'හිමිකරුවකු' සිටින බව තහවුරු කරන්න. 'සියලුදෙනා' වගකිව යුතු නම්, සාමාන්‍යයෙන් කිසිවකු වගකියන්නේ නැත.
- ක්‍රියාකාරී සැලැස්මක් සම්පාදනය කිරීමේදී හා සම්පත් ලබාදීමේදී එම කාර්යය සිදුකිරීම සම්බන්ධයෙන් වගකිවයුතු පුද්ගලයන් සම්බන්ධ කරගැනීමට වගබලාගන්න. තීරණ ගැනීමේ ක්‍රියාවලියට පුද්ගලයන් සම්බන්ධ කරගත් විට ක්‍රියාත්මක කිරීම සාර්ථක වීමේ අවස්ථාව වැඩිය.
- ාර්යයන් සරල හා සාක්ෂාත් කරගත හැකි ඒවා බවට පත්කරන්න. ඕනෑවට වඩා උන්නතිකාමී වීමෙන් හා මුල් අදියරේදීම අසාර්ථක වීමෙන් ධෛර්යය සිඳී යයි. එමගින් ඔබගේ මූලෝපාය පරාජය විය හැකිය. කුඩා පියවරවලින් ආරම්භ කරන්න. සාර්ථකත්වයන් සමරන්න.


## 3.3.2 Risk Management

### 3.3.2 අවදානම් කළමනාකරණය

ක්‍රියාත්මක කරන අතරතුරදී මතුවිය හැකි අනපේක්ෂිත සිදුවීම් හේතුවෙන් සම්පත් කළමනාකරණය සම්බන්ධ අභියෝග මතුවිය හැකිය. සැලසුම් කිරීමේ මට්ටමේදීම මතුවිය හැකි අවදානම් පිළිබඳ සැලකිලිමත් වීමෙන් කිසියම් දුරකට ඒවා මගහැරගත හැකිය. ඇතැම් සාධක ඔබගේ පාලනයෙන් පරිබාහිරය (උදා: රජයේ නීති, ගෝලීය වසංගත ආදිය). එහෙත්, කාර්ය මණ්ඩල සේවයට වාර්තා නොකිරීම හෝ වියදම් අධික වීම වැනි අනෙක් ඒවා ගැන පුරෝකථනය කළ හැකිය. ඔබට ලබාදිය හැකි විසඳුම් කෙරෙහි අවධානය යොමුකරන්න. විශේෂයෙන්ම ඔබගේ මූලෝපායේ සාර්ථකත්වය සඳහා ඉතා වැදගත් අභිමතාර්ථ සම්බන්ධයෙන් ඒවා වැදගත්ය.

**භාවිතා කිරීම සඳහා මෙවලමක්**

අවදානම් තක්සේරුවක් යනු, ක්‍රියාකාරකමක්, ව්‍යාපෘතියක් හෝ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් මතුවිය හැකි අවදානම් පිළිබඳ කරනු ලබන විධිමත් තක්සේරුවකි. අවදානමක විය හැකියාව (likelihood) හා එසේ සිදුවුවහොත් ඇතිවන බලපෑමේ බරපතලකම අනුව අවදානම් හඳුනාගෙන ඒවා ප්‍රමුඛතාව අනුව පෙළගස්වනු ලැබේ. අවදානම් තක්සේරු කිරීමේ වැඩසටහන් ඇතැම්විට අවදානම් විශ්ලේෂණය හෝ අවදානම් සිතියම්ගත කිරීම ලෙස හැඳින්වේ. අවදානම් ඇස්තමේන්තුගත කිරීම මගින් ක්‍රියාමාලාවට නිශේධාත්මක ලෙස බලපෑ හැකි උපද්‍රව, අවදානම් හැකියාව හා තර්ජන හඳුනාගැනීමට අවස්ථාව ලැබේ. මෙම තොරතුරු භාවිතා කරමින්, සංවිධානයකට වියදම සහ අවදානම් අවම කිරීමේ හා පාලනය කිරීමේ මූලෝපායන්ගේ ප්‍රමුඛකරණය සිදුකළ හැකිය.



සිද්ධි අධ්‍යයන විශ්ලේෂණය

මීට ඉහත සිද්ධි අධ්‍යයනය වෙත අපි නැවත යොමුවෙමු. ඔබට මෙම ක්‍රියාමාලාව සම්බන්ධ අවදානම් තක්සේරුවක් සිදුකළ හැකිද?

මානව හිමිකම් පිළිබඳ **ASEAN** අන්තර් රාජ්‍ය කොමිෂන් සභාව **(AICHR)**

ආසියානු ජාතීන්ගේ සංවිධානය (ASEAN) විසින් මානව හිමිකම් පිළිබඳ කොමිෂන් සභාවක් (AICHR) 2009දී පිහිටුවන ලදී. එය යහපත් මුලපිරුමක් ලෙස පෙනුණද, සිවිල් සමාජ සංවිධාන එහි ස්වාධීනත්වය පිළිබඳ සැලකිලිමත් වූහ. එයට හේතුව, එම කොමිෂන් සභාවේ නියෝජිතයන් දහදෙනා තෝරාගනු ලබන්නේ සාමාජික රාජ්‍යවල ආණ්ඩු විසින් වීමයි. උපදෙස් විමසීම මත පදනම් වූ, විනිවිද පෙනෙන තෝරාගැනීමේ යාන්ත්‍රණයකට ASEAN රාජ්‍ය කැමැත්තක් දැක්වූයේ නැත. එහි ප්‍රතිඵලයක් ලෙස, AICHR නියෝජිතයන් විශ්වාස කරන්නේ ඔවුන් වගකිව යුත්තේ ඔවුන් තෝරාගත් ආණ්ඩුවලට මිස ජනතාවට නොවන බවයි. මේ දක්වාම, AICHR නියෝජිතයන් කලාපයේ බරපතලම මානව හිමිකම් ප්‍රශ්නවලට අතගසා නැත. මියන්මාරයේ රෝහින්ග්‍යා අර්බුදය හා පිලිපීනයේ අනීතික ඝාතන ඒ අතර වේ. එහිදී කොමිෂන් සභා සාමාජිකයන් පවසන්නේ ඔවුන්ට වෙනත් සාමාජික රාජ්‍යවල ස්වෛරීත්වයට බලපෑම් කළ නොහැකි බවයි. මෙමගින් මානව හිමිකම් කොමිෂන් සභාවේ ඵලදායීතාවට බලපෑමක් සිදුවේ. වැදගත්ම මානව හිමිකම් ප්‍රශ්න එයට මගහැරී යාම එයට හේතුවයි.

**අරමුණ:** කලාපීය යාන්ත්‍රණය මගින් ආසියාවේ මානව හිමිකම් ගැටලු කෙරෙහි ප්‍රමාණවත් අවධානය යොමු කරන බව තහවුරු කිරීම

**මූලෝපාය:** AICHR ස්වාධීනත්වය පුළුල් කරන්නට සහ මානව හිමිකම් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් වඩා අරුත්බර ක්‍රියාමාර්ග ගැනීමට ASEAN රාජ්‍යයන්ට බලකිරීම

**උපායමාර්ග:** FORUM-ASIA, යනු බැංකොක් කේන්ද්‍ර කරගත් සාමාජිකත්වය මත පදනම් වූ මානව හිමිකම් සංවිධානයකි. AICHR සඳහා තෝරාගැනීමේ යාන්ත්‍රණයක් සැකසීම සඳහා අපේක්ෂකයන්ගේ ස්වාධීනත්වය මැනීම සඳහා සංයුක්ත නිර්ණායක සැකසීම පිණිස FORUM-ASIA විසින් සිවිල් සමාජ සංවිධානවලට උපකාර කරන ලදී. සිවිල් සමාජ සංවිධාන විසින් ASEAN විදේශ අමාත්‍යාංශය, ASEAN ලේකම් කාර්යාංශය සහ AICHR සමග සංවාදයක් ආරම්භ කරන ලදී. ඉන්දුනීසියාවේ, මැලේසියාවේ හා තායිලන්තයේ මාධ්‍ය ආයතන සමග එක්ව ස්වාධීන තෝරාගැනීමේ පටිපාටියක් සම්පාදනය කිරීම සඳහා එම රටවල ආණ්ඩුවලට බලපෑම් කිරීම ආරම්භ කරන ලදී. එයට අමතරව, අදාළ විදේශ කටයුතු අමාත්‍යාංශ සමග එක්ව රටවල් ඉලක්ක කරගත් සන්නිවේදනයන් ද ආරම්භ කරන ලදී. FORUM-ASIA සහ එහි හවුල්කරුවන් විසින් උද්දේශන ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. එය පදනම් වූයේ AICHR පිළිබඳ FORUM-ASIAහි වාර්ෂික කාර්යසාධන ඇගයීම මතය. AICHR නියෝජිතයන් සඳහා විවෘත හා ස්වාධීන තෝරාගැනීමේ පටිපාටියක් සඳහා අඛණ්ඩව නිර්දේශ කරන ලදී. එය ක්‍රියාත්මක කර තිබුණේ ඉන්දුනීසියාව විසින් පමණි.

**බලපෑම:** මැලේසියාවේ ප්‍රතිසංස්කරණ රැල්ල සහ තායිලන්තයේ හා ඉන්දුනීසියාවේ මාධ්‍ය බලපෑම භාවිතා කරමින්, AICHR නියෝජිතයන් තෝරාගැනීම සඳහා වඩා විනිවිද පෙනෙන හා සිවිල් සමාජ වෙත යොමුවූ තෝරාගැනීමේ ක්‍රියාවලියක් සම්පාදනය කිරීමට FORUM-ASIA සහ එහි සාමාජික සංවිධාන විසින් ASEAN සංවිධානයේ ආණ්ඩුවලට සාර්ථක ලෙස බලපෑම් කරන ලදී. එම ප්‍රයත්නයන් ඔස්සේ තරමක් ස්පර්ශනීය ප්‍රතිඵල ලැබිණි. මේ වන විට, AICHR නියෝජිතයන්ගෙන් 30%ක් තෝරාගනු ලබන්නේ මෙම විනිවිද පෙනෙන පටිපාටිය ඔස්සේය. ඔවුන් විසින් සිවිල් සමාජ සංවිධානවල උවමනාවන් ස්වාධීන ලෙස නියෝජනය කරනු ලැබේ. 2019 වර්ෂයේදී, රෝහින්ග්‍යා අර්බුදය සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ආරක්ෂණ යාන්ත්‍රණය ශක්තිමත් කිරීමට අදාළ AICHR සේවා කොන්දේසි (ToR) ASEAN විදේශ ඇමතිවරුන් විසින් සම්මත කරන ලදී. තම සේවා කොන්දේසි සමාලෝචනය කිරීම සඳහා පටිපාටියක් සම්පාදනය කරගැනීම සඳහා අවසානයේදී AICHRට අවුරුදු දහයක් ගතවිය. එයට අමතරව, 2019දී, ඉන්දුනීසියාවේ හා මැලේසියාවේ AICHR නියෝජිතයන් විසින් ප්‍රකාශනයේ නිදහස පිළිබඳ කලාපීය සංවාදයක් සංවිධානය කරගැනීම සඳහා එක්සත් ජාතීන්ගේ යාන්ත්‍රණයෙහි උපදෙස් විමසන ලදී. මෙම ක්‍රියාමාලාවට පෙර එවැනි සාකච්ඡාවක් ලබාගැනීම දුෂ්කර කාර්යයක් විය..

### 3.3.3 තක්සේරු කිරීම හා පුරෝකථනය

ඇගයීම යනු ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන කොටසක් බව අපි පළමු කොටසෙහිදී පෙන්

මෙහිදී පෙන්වා දිය යුතු වැදගත් කරුණක් වන්නේ තක්සේරු කිරීම හා පුරෝකථනයයි. ඵලදායී සම්පත් බෙදාහැරීමක් සඳහා, අදාළ සම්පතකින් කොපමණ තරමක් අවශ්‍ය වේද යන්න කළමනාකාරවරුන් විසින් නිවැරදිව අවබෝධ කරගත යුතුව තිබේ. උදාහරණයක් ලෙස, කාර්ය මණ්ඩලය විසින් සේවය කළ යුතු දින ගණන සැලකිය හැකිය. මෙවැනි තොරතුරු පරිපූර්ණව ලබාගත හැක්කේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් පසුව පමණි.

එබැවින්, අවශ්‍ය විය හැකි සම්පත් ප්‍රමාණය තක්සේරු කිරීම හා භාවිතා කරන ලද සැබෑ සම්පත් ප්‍රමාණය හඳුනාගැනීම යහපත් භාවිතාවකි. සරල ස්ප්‍රෙඩ්ෂීට් එකක් භාවිතයෙන් මෙය සිදුකළ හැකිය. සම්පත් භාවිතය සතිපතා හෝ මාසික පදනමින් පරීක්ෂා කළ හැකිය. මේ ආකාරයෙන් වැඩ කිරීමෙන් වාසි ගණනාවක් ලැබේ:

- භාවිතා කරනු ලැබුවේ කුමන සම්පත් ද යන්න අවබෝධ කරගැනීමට එය උපකාර වේ.
- ාර්යය වෙනස් ආකාරයකින් කළ හැකිව තිබිණිද යන්න පිළිබඳ සාකච්ඡාවකට එමගින් මගපෑදේ.
- ඊළඟ වතාවේ වඩා නිවැරදිව පුරෝකථනය කිරීමේ හැකියාව ලැබේ.
- එමගින් ආධාරකරුවන් සමග සාකච්ඡාවලට අවශ්‍ය තොරතුරු ලැබේ. ව්‍යාපෘතිවලට සම්පත් ලැබෙන ආකාරය පිළිබඳ ඔවුන් ප්‍රශ්න මතුකළ යුතුද?

**සම්පත් බෙදාහැරීමේ ආකෘතියක් සඳහා උදාහරණයක්**

| සම්පත් | Project | 01 Jan | 02 Jan | 03 Jan | 04 Jan | 05 Jan | 06 Jan | 07 Jan | 08 Jan | 09 Jan |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| වැඩසටහන් නිලධාරි 01 | Project A | √ | | | √ | √ | √ | | | |
| | Project B | | | | | | | | | |
| | Project C | | | | | | | | | |
| | Project D | | | | | | | | | |
| | Project E | | | | | | | | | |
| වැඩසටහන් නිලධාරි 02 | Project A | | | | | | | | | |
| | Project B | √ | | | √ | √ | √ | √ | √ | |
| | Project C | | | | | | | | | |
| | Project D | | | | | | | | | |
| | Project E | | | | | | | | | |
| වැඩසටහන් නිලධාරි 03 | Project A | | | | | | √ | √ | | |
| | Project B | | | | | | | | | |
| | Project C | | | | | | | | | |
| | Project D | | | | | | | | | |
| | Project E | | | | | | | | | |
| වැඩසටහන් නිලධාරි 04 | Project A | | | | | | | | | |
| | Project B | | | | | | | | | |
| | Project C | | | | | | | | | |
| | Project D | √ | | | √ | √ | √ | √ | √ | |
| | Project E | | | | | | | | | |
| වැඩසටහන් නිලධාරි 05 | Project A | | | | | | | | | |
| | Project B | | | | | | | | | |
| | Project C | | | | | | | | | |
| | Project D | | | | | | | | | |



## මොඩියුලය 4

### 3.4.1 අරමුදල් එක්රැස් කිරීම

උද්දේශන සංවිධාන සම්ප්‍රදායිකව රඳාපවතින්නේ පුද්ගලයන් හෝ සංවිධාන මට්ටමේ සාමාජිකත්ව දායකත්වයන් මතය. ඇතැම් සංවිධානවලට ආධාරකරුවන්ගේ අරමුදල් ද ලැබේ. ආධාරකරුවන් ජාත්‍යන්තර, කලාපීය, ප්‍රාදේශීය රාජ්‍ය නොවන සංවිධාන, පෞද්ගලික පදනම් සහ විදේශ තානාපති කාර්යාල ඇතුළු රාජ්‍ය සංවිධාන විය හැකිය. ඇතැම් රාජ්‍ය නොවන සංවිධාන විසින් රාජ්‍ය සංවිධාන වෙතින් අරමුදල් ලබාගනු ලැබේ. එබැවින් ඔබ කටයුතු කරන්නේ අතරමැදි සංවිධානයක් සමගයි.

මෑත වකවානුවේදී වෙනත් ස්වරූපවල මූල්‍යාධාර ද මතුවී තිබේ. ඒ අතරට පහත දැක්වෙන වර්ග අයත් වේ:



- සිදුවීම් හා පුවත් හසුන් සඳහා වානිජ අනුග්‍රහ දැක්වීම්
- අන්තර්ජාල ප්‍රචාරණය
- GoFundMe සහ KickStarter වැනි අන්තර්ජාල වේදිකා භාවිතා කරමින් සිදුකරනු ලබන සාමූහික අරමුදල් රැස්කිරීම්
- සෘජුව හෝ Patreon වැනි වේදිකා මගින් කළමනාකරණය කරනු ලබන පරිත්‍යාග. විදෙස්ගත ප්‍රජාවේ සහයෝගය ලබාගැනීමේදී මෙය ප්‍රයෝජනවත් විය හැකිය.
- සන්නාම සහිත ටීෂර්ට්, බෑග් හා ලිපිද්‍රව්‍ය වැනි වෙළඳ භාණ්ඩ

ඇතැම් සංවිධාන විසින් අර්ධකාලීන හෝ නිදහස් පදනමින් ව්‍යාපාර සංවර්ධන කළමනාකරුවන් යොදවනු ලැබේ. ඔවුන් තම වැටුපෙන් කොටසක් උපයාගන්නේ ආදායම් ඉලක්ක සපිරීමෙනි. මෙම ඇතැම් තනතුරුවලට ආධාරකරුවන්ගේ අරමුදල් සැපයේ. සංවිධානවල තිරසරභාවය වර්ධනය කිරීම සඳහා උපකාර කිරීමට ආධාරකරුවෝ දැන් දැන් කැමැත්තක් දක්වති.

### 3.4.2 ප්‍රදාන සඳහා අයදුම් කිරීම

මාධ්‍ය උද්දේශන සංවිධානවලට ප්‍රදාන අරමුදල්වලින් වාසි සලස්වාගත හැකිය. ආධාර අරමුදල් කලාපයෙන් කලාපයට හා රටින් රටට වෙනස් වේ. ඇතැම් අරමුදල් සම්පාදකයෝ විශේෂිත කලාප වෙත අවධානය යොමුකරති (උදා: පශ්චාත් සෝවියට් අවකාශය). ඇතැම්විට ඔවුන්ට නිශ්චිත තේමා තිබේ (දුස්තොරතුරුවලට ප්‍රතිරෝධය දැක්වීම හෝ සිවිල් සමාජය ගොඩනැගීම වැනි).

බොහෝ අයදුම්පත් කැඳවීම්වලදී ඔබ 'සංකල්ප පත්‍රිකාවක්' ලිවීම අවශ්‍ය වේ. ඔබට සහාය අවශ්‍ය වන්නේ ඇයිද, අරමුදල් සපයනු ලබන්නේ කුමන කාර්යයන්ටද, අපේක්ෂිත ප්‍රතිදාන මොනවාද වැනි ප්‍රශ්නවලට එහිදී පිළිතුරු ලබාදිය යුතුය. ඇතැම් ආධාරකරුවන් ඔබගෙන් යම් නිශ්චිත තොරතුරු ඉල්ලා සිටිනු ඇත. ඔබට ආයතනික හිංසනයට එරෙහි ප්‍රතිපත්ති තිබෙනවාද, මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ ප්‍රතිපත්ති තිබෙනවාද ආදිය එවැනි තොරතුරු වේ. පොදුවේ ඉල්ලාසිටින තොරතුරු මොනවාදැයි අවබෝධ කරගැනීම සහ ඒ සම්බන්ධ ප්‍රතිපත්ති ගොඩනගාගැනීම ප්‍රයෝජනවත්ය. ඇතැම් අවස්ථාවලදී ආධාරකරුවෝ අවශ්‍ය ප්‍රතිපත්ති නිර්මාණය කරගැනීම සඳහා ඔබට උපකාර කරති.

### 3.4.3 ප්‍රදාන කළමනාකරණය

ඇතැම්විට, නිසි ලෙස මූල්‍ය සම්පත් කළමනාකරණය යනු මාධ්‍ය උද්දේශන සංවිධානයක සාර්ථකත්වය හෝ අසාර්ථකත්වය තීරණය කරන සාධකය වේ.

| | |
|---|---|
| ලබාගත හැකි ප්‍රදාන වර්ග | • ස්ථාවර වටිනාකම් ප්‍රදාන - Fixed Amount Award (FAA): මෙහිදී රනු ලබන්නේ පූර්ව නිශ්චිත අයවැයක් නිශ්චිත ප්‍රතිදාන වෙනුවෙන් වෙන්කිරීමයි. ගෙවීම් කරනු ලබන්නේ ප්‍රතිදාන සම්පූර්ණ කිරීමෙන් හා ඉල්ලා සිටිනු ලබන ලිඛිත සාක්ෂි සැපයීමෙන් පසුවයි.<br><br>• සරල කරන ලද ප්‍රතිදාන Simplified Grant (SiG): මෙහිදී වියදම් ගිනුම්ගත කර තිබෙන්නේ ක්‍රියාකාරකම් අනුවයි. උප ප්‍රදානයන්ට අදාළව ගෙවීම් ලබාගැනීම සඳහා ප්‍රදාන ලබන්නා විසින් බිල්පත් හා ආධාර ලේඛන ඉදිරිපත් කළ යුතුය.<br><br>• මූලික අරමුදල් සඳහා සරල කරන ලද ප්‍රදාන වඩා සුදුසුය. ස්ථාවර වටිනාකම් ප්‍රදාන වඩා සුදුසු වන්නේ ප්‍රතිදාන පහසුවෙන් හඳුනාගත හැකි වැඩසටහන් ප්‍රදාන සඳහාය. |
| ප්‍රදාන පිළිබඳ තොරතුරු සොයාගන්නේ කෙසේද? | ආධාරක සංවිධාන විසින් පුවත්පත් හා ඔවුන්ගේ වෙබ් අඩවිවල දැන්වීම් පළකරමින් ඔවුන් ආධාර කිරීමට අපේක්ෂා කරන වැඩසටහන් ක්‍රියාකාරකම් සඳහා හවුල්කාර සංවිධාන වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ. |
| ආධාරකරුවන් අයදුම්පතකින් අපේක්ෂා කරන්නේ මොනවාද? | ආධාර ලබන්නාගේ කීර්තිය, අතීත කාර්යසාධනය, සංවිධාන ව්‍යුහය, නිලතල දරන්නන්, අයදුම්පතේ ගැටලු ප්‍රකාශය, ක්‍රියාකාරකම්වල ප්‍රායෝගිකත්වය, අතීතයේ සාර්ථකත්ව අනුපාතිකය සහ අයවැය ආධාරකරුවන්ගේ නිරීක්ෂණයට ලක්වේ. |
| සාමාන්‍ය ක්‍රියාවලිය කුමක්ද? | • අයදුම්පත් කැඳවීමෙහි දැන්වීමෙහි සඳහන් කරන ලද නිර්ණායක මත පදනම්ව කටයුතු කරන මණ්ඩලයක් විසින් අයදුම්පත් සමාලෝචනය කරනු ලැබේ.<br><br>• මණ්ඩලයේ ඇගයීම මත පදනම්ව යෝග්‍ය අයදුම්කරුවන්ගේ කෙටි ලැයිස්තුවක් සකස් කරනු ලැබේ.<br><br>• අයදුම්පත ව්‍යාපෘති යෝජනාවක් බවට පත්කිරීමේ හා ඒ හා සම්බන්ධ අයවැයක් සම්පාදනය කිරීමේ අරමුණින් අපේක්ෂක අයදුම්කරුවන් සමග සවිස්තර සාකච්ඡා පැවැත්වේ.<br><br>• නිසි උද්‍යෝගීමත්භාවය (Due diligence) පිළිබඳ තොරතුරු අයදුම්කරු වෙතින් ලබාගනු ලැබේ. .<br><br>• නිසි උද්‍යෝගීමත්භාවය සම්බන්ධ ලේඛන මගින් සපයන ලද තොරතුරු මත පදනම්ව ප්‍රදානයට පෙර විගණනයක් පවත්වනු ලැබේ.<br><br>• අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනාව හා අයවැය මත පදනම්ව, වැඩසටහන් ක්‍රියාකාරකම් පිළිබඳ සාකච්ඡා සහ අයවැය කේවල් කිරීම් සිදුවේ.<br><br>• ගිවිසුම අවසන් කරනු ලැබේ. |

| | |
|---|---|
| සාමාන්‍ය ගැටලු මොනවාද? | • ගැටලු ප්‍රකාශය සම්බන්ධයෙන් කටයුතු නොකිරීම: ගැටලු ප්‍රකාශය සම්බන්ධයෙන් ඍජුවම ක්‍රියාකරන ප්‍රායෝගික විසඳුම් අයදුම්පතෙහි අඩංගු විය යුතුය.<br><br>• යථාර්ථවාදී නොවන ක්‍රියාකාරකම් සහ ඉලක්ක: ක්‍රියාකාරකම් හා ඉලක්ක යථාර්ථවාදී හා ව්‍යාපෘතියට අදාළ කාලසීමාව තුළදී සාක්ෂාත් කරගත හැකි ඒවා විය යුතුය.<br><br>• යථාර්ථවාදී නොවන අයවැය: අයවැය යථාර්ථවාදී හා සාධාරණ විය යුතුය.<br><br>. |

**ඉඟි:**

**ආධාරක සංවිධානවල අරමුදල් පරීක්ෂාවට ලක්වන බව මතක තබාගන්න. උදාහරණයක් ලෙස, විදේශ ආධාර වියදම් කිරීම් රජය, මාධ්‍ය සහ පුරවැසියන් විසින් සමීපව නිරීක්ෂණය කරන බව අපේක්ෂා කළ යුතුය. එම නිසා, ආධාර ලබාගන්නන් වෙතින් ආධාරකරුවෝ ඉහළ මූල්‍ය විනයක් හා විනිවිදභාවයක් අපේක්ෂා කරති. එයට පහත දැක්වෙන කරුණු අඩංගු වේ:**

- **ස්ථාවර වාර්තාකරණය (සාමාන්‍යයෙන් මාසිකව)**
- **ඉලක්ක සාක්ෂාත් කරගැනීම (ඔබගේ ගිවිසුමෙහි බොහෝවිට ප්‍රතිදාන - deliverables ලෙස දැක්වේ)**
- **මුල් ගිවිසුමෙහි එකඟවූ කාරණාවලට වැය සම්පාදනය කරනු ලබන බව තහවුරු කිරීම. උදාහරණයක් ලෙස, ආධාරකරු විසින් අරමුදල් සම්පාදනය කරනු ලබන ව්‍යාපෘතිය සඳහා කාර්ය මණ්ඩල සාමාජිකයකු යෙදවීමට ඔබ ගිවිසගෙන ඇත්නම්, එම සේවකයා වෙනත් කාර්යයකට යොදවා තිබේ නම්, ඔබ කරන්නේ ගිවිසුම උල්ලංඝනය කිරීමකි.**

මූල්‍ය කළමනාකරණ පටිපාටි ක්‍රියාවේ යෙදවීම අරමුදල් සපයන්නන් ඔබගෙන් බලාපොරොත්තු වන කාරණයකි. උදා:

- ඔබගේ සංවිධානයේ භාණ්ඩාගාරික වැනි තනතුරු නම්කර තිබීම
- ව්‍යාපාර බැංකු ගිනුමක් සතුවීම
- සංවිධානමය හා ව්‍යාපෘති පදනමින් ආදායම හා වියදම ගිනුම්ගත කිරීම
- ස්ථාවර, ස්වාධීන විගණනයන් සඳහා ගිනුම් ඉදිරිපත් කිරීම

## මොඩියුලය 5

## ස්වේච්ඡා බඳවාගැනීම්

බොහෝ උද්දේශන සංවිධාන තම මෙහෙයුම්වලදී ස්වේච්ඡා සේවකයන්ගේ දායකත්වය කෙරෙහි විශ්වාසය තබති. සංවිධාන තමන් සේවය කරන සමාජයන්ට අදාළව සිටීම වැදගත් වේ. ඔවුන් අලුත් ස්වේච්ඡා සේවකයන් සෙවීම අඛණ්ඩව සිදුකළ යුතුය. එසේම, ඔවුන් කාර්යක්ෂම ලෙස සේවයේ යෙදවිය යුතුය. කාන්තාවන්, තරුණ ජනයා හා සුළුතර කණ්ඩායම් ඇතුළු පුළුල් පරාසයක ආධාරකරුවන්ගේ සහාය ලබාගැනීමට වගබලාගන්න.

***පුද්ගලයන් ස්වේච්ඡා කටයුතු සඳහා ඉදිරිපත් වන්නේ ඇයි?*** ඔවුන් කිසියම් අරමුණක් වෙනුවෙන් කැපවූ, එයට කාලය හා සහයෝගය සැපයීමට කැමති අය විය හැකිය. ඔවුන් අලුත් කුසලතා ගොඩනගාගැනීමට කැමැත්තක් දක්වනවා විය හැකිය. තම වෘත්තීය හැකියාවන් උසස් කරගන්නට අපේක්ෂා කරනවා විය හැකිය.

ස්වේච්ඡා සේවකයන් විසින් ඉටුකරනු ලබන භූමිකාව සලකාබැලීමේදී අනුගමනය කළ යුතු මනා පළමු පියවරක්: ඔබ සොයමින් සිටින්නේ අලෙවිකරණ විශේෂඥභාවය ඇති කෙනෙකු, සමාජ මාධ්‍ය දැනුම ඇති අයෙකු, ග්‍රැෆික් සැලසුම්කරුවකු, ව්‍යාපාර සංවර්ධන විශේෂඥයකු හෝ සිනමා නිර්මාණකරුවකුද? ඉතා කෙටි ස්වේච්ඡා සේවක භූමිකා විස්තරයක් ලියන්න (ඡේදයක පමණ).

දැන් ඔබට බඳවාගැනීමට අවශ්‍ය ස්වේච්ඡා සේවකයා අනුව එය සංස්කරණය කරන්න.

ස්වේච්ඡා සේවකයන් බඳවාගන්නා ආකාර:

- අධ්‍යාපනික ආයතනවලින්
- ඔබගේ වෙබ් අඩවිය හා සමාජ මාධ්‍ය වේදිකා හරහා (නිර්මාණාත්මක වන්න)
- ප්‍රාදේශීය පුවත්පත් හා ගුවන් විදුලි ආයතනවල විශේෂාංග හා සම්මුඛ සාකච්ඡා
- ප්‍රජා උත්සව අවස්ථාවලදී ප්‍රදර්ශන කුටියක් හරහා
- ප්‍රාදේශීය කාර්යාල, සාප්පු, සායන ආදියෙහි ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීම් හා පත්‍රිකා මගින්
- ප්‍රජා කණ්ඩායම් සමග සාකච්ඡා හරහා



## අපේක්ෂා සකස්කරගැනීම

සෑම ස්වේච්ඡා සේවකයකුම සංවිධානයේ සෙසු සාමාජිකයන්ට හඳුන්වාදීමට සහ ඔවුන්ගේ කාර්යයන් හා සේවයට වාර්තාකරන කාලයන් දැනුම්දීම සඳහා කාලයක් වෙන්කිරීම යහපත් භාවිතාවකි. එමගින් ඔවුන්ට කණ්ඩායම් හැඟීමක් ඇතිවේ.එසේම පහත දැක්වෙන ප්‍රතිඵල ද ලැබේ:

- විශ්වාසවන්තභාවය, ආරක්ෂාව, ඇතුළත් කරගැනීම හා සේවා ස්ථානයේ හිංසනයට ලක්නොකිරීම වැනි ඔබගේ ප්‍රතිපත්තිවලට ඔවුන් අනුගත වේ.
- ඔවුහු ඔබගේ සංවිධානය මැනැවින් නියෝජනය කරති. කාර්ය මණ්ඩලයට හා පරදු දරන්නන්ට ගෞරවනීය වේ.

ඇතැම් සංවිධාන සතුව සරල, අන්‍යෝන්‍ය වශයෙන් එකඟ වන නීති හා වගකීම් පද්ධතියක් තිබේ. ඒවා ඇතුළත් කර ස්වේච්ඡා සේවක ගිවිසුමක් අත්සන් කරනු ලැබේ.

- ස්වේච්ඡා සේවකයකු ඔබෙන් බලාපොරොත්තු වනු ඇත්තේ මොනවාද?

පුහුණු අවස්ථා සහ සහාය

ප්‍රතිපෝෂණය හා මාර්ගෝපදේශ

ස්තුතිය



**ඉඟිය:**

ස්වේච්ඡා සේවකයන් පැමිණෙන්නේ ඔබ ඔවුන්ට මුදල් ගෙවන නිසා නොව, ඔවුන්ට ක්‍රියාත්මක වීමට අවශ්‍ය නිසා බව මතක තබාගන්න. තම කාලය නොමිලේ ලබාදෙන පුද්ගලයන් සමග 'මානසික ගිවිසුම' ඉතා වැදගත්ය. ඔවුන්ගේ කාලය බුද්ධිමත් ලෙස භාවිතා කරන්න. ඔවුන්ට ස්තුති කරන්නට මතක තබාගන්න.

## මොඩියුලය 6

## වාර්තා කිරීම හා ඇගයීම

උද්දේශන සැලසුම්කරණ චක්‍රයේදී සාකච්ඡා කළ ආකාරයට, ඔබගේ ක්‍රියාමාලාවේ කාර්යක්ෂමතාව සමාලෝචනයේදී හා අවශ්‍ය පරිදි ඔබගේ ක්‍රියාමාර්ගය සංශෝධනය කිරීමේදී දත්ත එක්රැස් කිරීම උපකාරී වේ. බොහෝ ක්‍රියාමාලා මගින් එක්රැස් කළ යුතු තොරතුරු වර්ගය සම්බන්ධයෙන් මාර්ගෝපදේශ සැපයේ. ඒ අනුව, කාර්ය මණ්ඩලයේ සෑම උද්දේශකයකු/සාමාජිකයකුම තම දත්ත වාර්තා කළ යුතුය. ඔබ විසින් එක්රැස් කරනු ලබන තොරතුරු පහත දැක්වෙන වර්ගවලට අයත් විය හැකිය.

- ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම් පිළිබඳ වාර්තාවක් (අත්සන් ලේඛන, රැස්වීම් වාර්තා ආදිය)

- ක්‍රියාකාරකමේ බලපෑම පිළිබඳ මිනුම්: ප්‍රතිඵලය ලෙස සිදුවූ වෙනස කුමක්ද? (පූර්ව/ පශ්චාත් පරීක්ෂණ, පදනම් සමීක්ෂණ ආදිය)
- සාර්ථකත්වයේ කතා වැනි සිද්ධි අධ්‍යයන (ගුණාත්මක, වාර්තාමය සාක්ෂි)
- ක්‍රියාත්මක නොවූ දේ හා ඒවාට හේතු (විශ්ලේෂණය)
- ක්‍රියාත්මක වීම සිදුවන ආකාරය අධීක්ෂණය කිරීම - උදාහරණයක් ලෙස, නව නීතියක් සාර්ථක ලෙස සම්මත කරගෙන තිබේ නම්, එය ක්‍රියාත්මක වන ආකාරය සහ එය ක්ෂේත්‍රයේදී කෙතරම් හොඳින් ක්‍රියාත්මක වේද යන්න අධීක්ෂණය කිරීම (ක්‍රියාත්මක කිරීමේ මුලපිරුම්, ප්‍රතිපෝෂණය)
- අනාගතයේදී ප්‍රයෝජනවත් විය හැකි සම්බන්ධතා හා හවුල්කාරීත්වයන් ගොඩනගාගැනීම (ජාලගත වීම)



වාර්තා තබාගැනීම සම්බන්ධයෙන් වගකිව යුතු ප්‍රධානීන් විසින් ක්ෂේත්‍රයෙන් දත්ත එක්රැස් කර ආරක්ෂිත ලෙස ගබඩා කර තබාගත යුතු වේ. ඒවා භාවිතා කළ හැකි ස්වරූපයකින් තිබීම ද අවශ්‍යය. විධායක හා මෙහෙයුම් ප්‍රොටොකෝලයන්ට යටත්ව, ඒවා අභ්‍යන්තර මෙන්ම බාහිර වශයෙන් ද පහත දැක්වෙන අවශ්‍යතා සම්බන්ධයෙන් භාවිතා කළ හැකිය.

- ආධාරකරුවන්ට වාර්තා කිරීමට
- සාමාජිකත්වය, පරදු දරන්නන් හා පොදු ජනතාව පුවත්හසුන් හෝ වාර්ෂික වාර්තා මගින් යාවත්කාලීන කිරීමට
- ප්‍රචාරණය හා ක්‍රියාමාලා අරමුණු වෙනුවෙන්
- අභ්‍යන්තර ඇගයීම හා ඉගෙනීම: ඊළඟ වතාවේ වෙනස් ආකාරයකින් කුමක් කළ හැකිද?

### ක්‍රියාකාරකම

ඔබේ සංවිධානයේ වාර්තා තබාගැනීම සම්බන්ධයෙන් වර්තමානයේදී වගකිවයුත්තේ කවුරුද?

වඩා කාර්යක්ෂම වාර්තා තබාගැනීමේ ව්‍යුහයක් හඳුන්වා දීමට ඔබට හැකිද?



## සක්‍රිය ක්‍රියාමාලා

### මොඩියුලය 1

### උද්දේශන සන්නිවේදනය

උද්දේශනයේදී සන්නිවේදනය අතිශය වැදගත්ය. ඉහළ කාර්ය සාධනයක් සහිත උද්දේශන සංවිධාන රාජ්‍ය නිලධාරීන් හා නීති සම්පාදකයන් වැනි තීරණ ගැනීමේ වගකීම සහිත පුද්ගලයන් සමග ඍජුව සම්බන්ධතා පවත්වති. ඒ රැස්වීම් හෝ ලිපි ලිවීම වැනි කාර්යයන් හරහාය. වෙනත් අයට ද එසේ කිරීමට දිරිගන්වනු ලැබේ. සමාජ හෝ පොදු ප්‍රතිපත්තිමය අභිමතාර්ථ ඉදිරියට ගැනීමේදී හෝ වැදගත් පොදු කාරණාවක් සම්බන්ධ ආකල්පවලට බලපෑම් කිරීමේදී ඩිජිටල් මාධ්‍ය හා සමාජ මාධ්‍ය ඇතුළු විවිධ මාධ්‍ය වේදිකා භාවිතා කරමින් ඔවුන් විසින් ක්‍රියාමාලා සිදුකරනු ලැබේ.

මාධ්‍ය උද්දේශන සන්නිවේදනයේදී සම්ප්‍රදායික මාධ්‍ය මෙන්ම නව මාධ්‍ය ද වැදගත් භූමිකාවක් ඉටුකරයි.

**සම්ප්‍රදායික මාධ්‍ය**

- **මුද්‍රිත (පුවත්පත්, සඟරා, ජර්නල, පුවත්හසුන්)**
- **රූපවාහිනිය**
- **රේඩියෝ**
- **චිත්‍රපට (වාර්තා, විචිත්‍රාංග)**
- **අන්තර්ජාල මාධ්‍ය සංවිධාන (අන්තර්ජාල ආරම්භක මාධ්‍ය මෙන්ම දැනටමත් වෙබ් අඩවි, සමාජ මාධ්‍ය ගිනුම් හා පොඩ්කාස්ට් වැනි ඩිජිටල් නිෂ්පාදන සිදුකරන පැරණි මුද්‍රිත හා විකාශන සංවිධාන ඇතුළුව)**

ක්‍රියාමාලා විසින් මාධ්‍ය ග්‍රාහකයන්ට වැදගත් වන තොරතුරු ලබාදෙන බැවින් ඒ හරහා සම්ප්‍රදායික මාධ්‍ය ආයතන සමග සම්බන්ධතා ගොඩනගාගත හැකිය.

කෙසේ වෙතත්, රාජ්‍ය ස්ථාවරයන්ට පටහැණි තොරතුරු ප්‍රසිද්ධ කරන මාධ්‍ය සංවිධාන වෙත රජයන් විසින් දැඩි සීමා හා දණ්ඩනයන් පැනවිය හැකිය. මේ හේතුවෙන්, මාධ්‍ය ආයතයනක් ක්‍රියාමාලාවකට කෙතරම් දුරට ප්‍රයෝජනවත් වේදැයි නිර්ණය කිරීමේදීත්, එම මාධ්‍ය ආයතනය වෙත තොරතුරු සම්පාදනය කිරීමේදීත් එය කෙසේ කළ යුතුද යන්න පිළිබඳවත් ගැඹුරින් අධ්‍යයනය කිරීමට සිදුවේ.

**සම්ප්‍රදායික මාධ්‍ය**

මාධ්‍ය සංවිධාන වෙත ප්‍රවර්ධනය සඳහා මුදාහැරීම පිණිස අන්තර්ගතයන් සකස් කිරීමේදී පහත දැක්වෙන කරුණු කෙරෙහි සැලකිලිමත් විය යුතුය:

- අදාළ මාතෘකාව කෙරෙහි නාභිගත වන්න. පැහැදිලිව පණිවුඩය සකස්කරන්න. ජනමාධ්‍යවේදීන් ක්ෂණිකව තොරතුරු ග්‍රහණය කරගත යුතුය.
- ජනමාධ්‍යවේදීන් සොයමින් සිටින්නේ ප්‍රවෘත්ති තේමාවකි. නව ප්‍රවණතා, අලුත් තොරතුරු හෝ උනන්දුව ඇතිකරන මානුෂීය කතා කෙරෙහි ඔවුන්ගේ අවධානය යොමුකරන්න.



## සම්ප්‍රදායික මාධ්‍ය

- සෘජු උපුටාගැනීම්, රූප සටහන්, ඡායාරූප, සිතියම් ආදිය ඇතුළත් කරමින් ඔබගේ අන්තර්ගතය ආකර්ශනීය ලෙස ඉදිරිපත් කරන්න.
- ජනමාධ්‍යවේදීන්ට ඕනෑවට වඩා නිරතුරුව ස්පෑම් ස්වරූපයේ පණිවුඩ යවන්නට එපා.
- ඔබගේ අන්තර්ගතයන් පළවිය හැකි අවකාශයන් ගැන සිතන්න. මැනැවින් ස්ථානගත වූ සම්මුඛ සාකච්ඡාවක්, පොඩ්කාස්ට් එකක් හෝ විශේෂාංගයක් ප්‍රවෘත්ති වාර්තාවක් තරම්ම ඵලදායී විය හැකිය.

## නව මාධ්‍ය

වෙබ් අඩවි, සමාජ මාධ්‍ය (ෆේස්බුක්, ට්විටර් වැනි), සජීවී හා පටිගත කරන ලද වීඩියෝ (යූටියුබ්) සහ ජංගම දුරකථන තාක්ෂණය (වට්ස්ඇප්) විසින් පසුගිය දශකය තුළදී සන්නිවේදන භූමි දර්ශනය සම්පූර්ණයෙන්ම වෙනස් කරන ලදී. එමගින් ඔබට ග්‍රාහකයන් සමග සෘජුවම සංවාදයේ යෙදිය හැකිය. ඒ සඳහා ජනමාධ්‍යවේදීන් වැනි අතරමැදියන් අවශ්‍ය නොවේ. දත්ත හා තාක්ෂණය වෙත පිවිසීම මෙන්ම ඒ සඳහා අවශ්‍ය කුසලතා සහිත කාර්ය මණ්ඩලයක් හෝ ස්වේච්ඡා සේවකයන් සිටීම බලපෑම් සහගත ඩිජිටල් අන්තර්ගතයන් පළකිරීමේදී අතිශය වැදගත්ය. ඔබගේ ඉලක්ක ග්‍රාහකයන් තුළ ද තාක්ෂණය වෙත ප්‍රමාණවත් ප්‍රවේශය හා කුසලතා තිබිය යුතුය. මෙම මූලික අවශ්‍යතා සපුරාගත හැකිනම්, නව මාධ්‍ය භාවිතයෙන් ලැබිය හැකි වාසි අති විශාලය.

EGi
Editors Guild of India



August 13, 2020

The Editors Guild of India has unequivocally condemned recent attacks on journalists while they were on duty.

Three journalists working with *The Caravan* were allegedly assaulted while they were in northeast Delhi's North Ghonda neighbourhood on August 11 to report on a complainant in the recent communal violence case in the Capital. They also say they were subjected to communal slurs, threatened with murder and sexually harassed.

On the same day in Bengaluru, as many as four journalists belonging to *India Today*, *The News Minute* and *Suvarna News 24X7* were reportedly attacked by the city police. These journalists at that time were on duty, reporting on the vandalism and police shooting in the wake of a mob violence in the city.

Both attacks are reprehensible. The freedom of the media to discharge its responsibilities without fear or harassment is an important and indispensable attribute of a functioning democracy. The case of assault on journalists working with *The Caravan* shows a dangerous trend where communally inspired people can assault and harass journalists with impunity in the presence of an indifferent police. The Bengaluru incident also highlights the failure of the law enforcement agencies in maintaining an environment where the media can function freely and without fear.

The Editors Guild of India demands that the police authorities in Delhi and Bengaluru take cognizance of both the cases and quickly take necessary steps to initiate action against the guilty.

| Shekhar Gupta<br>President | AK Bhattacharya<br>General Secretary | Sheela Bhatt<br>Treasurer |
|---|---|---|

## ඔබ උද්දේශනය සඳහා සමාජ මාධ්‍ය භාවිතා කළ යුත්තේ ඇයි?

- එය ජාලගත වීම සඳහා දැවැන්ත වේදිකාවකි.
- පොදු අරමුණක් වෙනුවෙන් අනෙක් අය සමග සමග සම්බන්ධ වීම සඳහා අඩු වියදම් ක්‍රමයක් එමගින් සැපයේ.
- මව්පියන්, ගුරුවරුන් හා ප්‍රජාව දැනුවත් කිරීමට හා ඔවුන්ගේ සහාය ලබාගැනීම සඳහා
- සමාජ මාධ්‍ය සමග සම්බන්ධ සෑම නීති සම්පාදකයකු සමගම ඔබට සම්බන්ධ විය හැකිය. එය උද්දේශනය සඳහා තවත් මාර්ගයකි.
- සමාජ මාධ්‍ය සමග සම්බන්ධ සෑම ජනමාධ්‍යවේදියකු සමගම ඔබට සම්බන්ධ විය හැකි අතර, එය උද්දේශනයේදී වාසිදායකය.

එක්සත් ජනපදයේ Black Lives Matter වැනි ව්‍යාපාරවලට ජාතික වශයෙන් ප්‍රමුඛ තත්වයකට පත්වන්නට හැකි වූයේ සමාජ මාධ්‍ය ප්‍රචාරණයේ ප්‍රබලත්වය නිසාය. එම ක්‍රියාමාලාව සියලු මාධ්‍ය වේදිකාවන් භාවිතා කරමින් මිලියන් ගණනක් ජනතාව ආකර්ශනය කරගත්තේය.

#MeToo ව්‍යාපාරය ජාත්‍යන්තර වශයෙන් ප්‍රසිද්ධිය අත්පත් කරගත්තේ ද සමාජ මාධ්‍ය ඔස්සේය.

එම ව්‍යාපාර දෙක එතරම් සාර්ථකත්වයක් අත්කරගැනීමට හේතු වූයේ කුමක් නිසාදැයි ඔබට අනුමාන කළ හැකිද? මේ දක්වා ඔබ විසින් ගොනුකරගත් දැනුම භාවිතා කරමින් ඔබට පරදු දරන්නන්, මූලෝපාය හා උපායමාර්ග විශ්ලේෂණය කර එම ප්‍රශ්නයට පිළිතුර සොයාගත හැකිය. මෙම පාඩම් ඔබගේ සංවිධානයටත් අදාළ වන්නේද?

### සමාජ මාධ්‍ය උද්දේශනය සඳහා මූලික විකල්

- උපරිම අක්ෂර 140කින් ඔබගේ අදහස් අනුගාමිකයන් සමග බෙදාගැනීමේ වේදිකාවකි.
- (@) භාවිතා කර පුද්ගලයන් අන්තර්ගතය සමග කෙළින්ම සම්බන්ධ කළ හැකිය. හැෂ්ටැග් (#) භාවිතා කර ඇතැම් විෂයයන් සම්බන්ධයෙන් පොදු ව්‍යාපාර නිර්මාණය කිරීම හෝ ඒවා සමග සම්බන්ධ වීම සිදුකළ හැකිය. වෙනත් පුද්ගලයන්/ කණ්ඩායම් අනුගමනය කළ හැකිය. අලුත් දේ උගත හැකිය. වෙනත් අය කරන දේ කෙරෙහි අවධානය යොමුකළ හැකිය. වෙනත් අයගේ පළකිරීම් නැවත පළකර ඔබගේ අනුගාමිකයන් සමග බෙදාහදාගත හැකිය.
- ඔබ ට්විටර් භාවිතා කරන තරමට ඔබගේ අනුගාමි පදනම පුළුල් වේ. ඔබගේ පණිවුඩ විශාල පාඨක පිරිසක් වෙත සන්නිවේදනය වේ.

- මෙය ඔබගේ අදහස් මිතුරන් හා අනුගාමිකයන් සමග බෙදාහදාගැනීම සඳහා වේදිකාවකි. බොහෝ සංවිධාන වෙනත් අය සමග සන්නිවේදනය කිරීමට හා ව්‍යාපාර සඳහා සහයෝගය ලබාගැනීමට භාවිතා කළ හැකි සාමූහික වේදිකාවක් එහි තිබේ.
- ඔබගේ තත්වය පිළිබඳ යාවත්කාලීන කිරීම්, වෙබ් අඩවි සම්බන්ධතා, නිවේදන, ඡායාරූප, ලේඛන ආදිය මෙහි බෙදාගත හැකිය.
- මෙහි ද ට්විටර් හා සමාන හැෂ්ටැග් ක්‍රමයක් තිබේ. ඇතැම් විෂයයන් සම්බන්ධයෙන් ඒකාබද්ධ ව්‍යාපාරයක් නිර්මාණය කිරීමේ හැකියාව එයින් ලැබේ.
- වෙනත් ඕනෑම වේදිකාවකට වඩා සක්‍රිය භාවිතා රන්නන් පිරිසක් මෙහි සිටිති.

- වීඩියෝ, ඡායාරූප සහ සංවිධාන යාවත්කාලීන කිරීම් බෙදාහදාගැනීම සඳහා හොඳ මූලාශ්‍රයකි.

## සමාජ මාධ්‍යවලදී කළ යුතු දේ ලැයිස්තුව

විවිධ සමාජ මාධ්‍යවල සියලු මට්ටම්වලදී **ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ අන්තර්ගතයන්ට දායක වන්න.** ඔබගේ ප්‍රතිපත්ති සම්පාදකයන් සමාජ මාධ්‍යවල කියන දේ අවබෝධ කරගැනීම හරහා ඔබට ඔවුන් සමග ප්‍රශ්න සම්බන්ධයෙන් සන්නිවේදනය කිරීම සඳහා කරුණු හා පණිවුඩ නිර්මාණය කරගත හැකිය. ඔවුන් කරන දේ සම්බන්ධයෙන් අවධානය යොමුකරන්න. ඔවුන් කතාකිරීමට/ ප්‍රකාශ කිරීමට කැමති දේ මොනවාද, ඔවුන්ගේ ස්ථාවර මොනවාද යන්න හඳාරන්න.

**ෆේස්බුක් කණ්ඩායම් නිර්මාණය කරන්න.** ඔබට උද්දේශන සංවිධාන ගොඩනැගීමටත්, බිම් මට්ටමේ සහයෝගය වර්ධනය කරගැනීමටත්, වෙනත් පරදු දරන්නන් සමග සම්බන්ධ වීමටත් මේවා භාවිතා කළ හැකිය.

**මාධ්‍ය සාමාජිකයන් සමග සම්බන්ධතා ගොඩනගාගැනීම සඳහා සමාජ මාධ්‍ය (විශේෂයෙන් ට්විටර්) භාවිතා කරන්න.** වාර්තාකරුවන්ට විශාල අනුගාමික සංඛ්‍යාවක් සිටිති. හැමවිටම තම අනුගාමිකයන් සංඛ්‍යාව වැඩි කරගත හැකි කතා වාර්තා කිරීමට ඔවුහු උත්සාහ කරති. ඔබගේ කතාව ප්‍රජාවට කීම සඳහා සහ යහපත් ප්‍රවෘත්ති සහ/ හෝ ගැටලු ප්‍රජාව සමග බෙදාගැනීම සඳහා මෙම සම්බන්ධතා භාවිතා කරන්න

## උදාහරණ

2011 අරාබි වසන්ත සමයේ මැද පෙරදිග විරෝධතා සංවිධානය කිරීමේදී ට්විටර් වැදගත් භූමිකාවක් ඉටුකළේය. එය දූෂිත රජයන්ට එරෙහි සාමූහික ප්‍රතිරෝධයක් විය. ඊජිප්තුව හා සිරියාව වැනි රටවල ක්‍රියාධරයන් විසින් මෙම ක්ෂුද්‍ර බ්ලොග් වේදිකාව භාවිතා කරමින් තම ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු බෙදාගන්නා ලදී. ඒ සඳහා තවත් ජනතාව ඒකරාශී කරගන්නා ලදී. රාජ්‍ය දූෂණ පිළිබඳ දැනුවත්භාවය නැංවීම සඳහා ද සමාජ මාධ්‍ය භාවිතා කරන ලදී.



## ශ්‍රී ලංකාවේ සාර්ථක අන්දමින් සමාජ මාධ්‍ය භාවිතා කිරීම පිළිබඳ උදාහරණ

**Hashtag Generation** හැෂ්ටැග් ජෙනරේෂන්


හැෂ්ටැග් ජෙනරේෂන් යනු ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන් මූලික කරගත් ව්‍යාපාරයකි. එහි අරමුණ වන්නේ, ජාතික, පළාත් හා අන්තර්ජාතික මට්ටම්වලදී ප්‍රතිපත්ති සම්පාදනයේදී, ක්‍රියාත්මක කිරීමේදී හා ඇගයීමේදී තරුණ ජනයාගේ පූර්ණ හා ඵලදායී සහභාගීත්වය වෙනුවෙන් උද්දේශනය කිරීමයි.

සමාජ මාධ්‍ය වේදිකා:

| | |
|---|---|
| Web | http://www.hashtaggeneration.org/ |
| Facebook | (1) Hashtag Generation \| Facebook |
| Instagram | Hashtag Generation (@hashtaglka) • Instagram photos and videos |


**කෙටි සහ සෘජු වීම**

බොහෝ අවස්ථාවලදී, නායකයන් පෙළඹෙන්නේ පළමු පේළිය හෝ මුල් වචන කීපය කියවීමටයි. වැඩිදුර අධ්‍යයනය කර තම අවශ්‍යතා හා අභියෝග සන්නිවේදනය කිරීම සඳහා ඔබගේ ග්‍රාහක ප්‍රජාව භාවිතා කරන භාෂාව ඉගෙනගන්න. ඔබගේ අන්තර්ගතයන් ඔබගේ ග්‍රාහකයන් අතර පැතිරීම තහවුරු කරගැනීම සඳහා අන්තර්ගතයන් සැකසීමේදී එම භාෂාව භාවිතා කරන්න. එමගින් ඔබ ඔවුන්ගේ අභියෝග සැබැවින්ම තේරුම් ගන්නා බව නිරූපණය වේ.




**දත්ත හා කතා භාවිතා කරන්න**

හැෂ්ටැග් ජෙනරේෂන් රූප සටහන් භාවිතා කරමින් අර්ථවත් ලෙස දත්ත ඉදිරිපත් කරයි. https://fb.watch/6MZ5KDwdZG/




**ප්‍රබල, ගෞරවනීය හා සංගත හඬක් භාවිතා කිරීම**

සියලු සමාජ මාධ්‍ය පළකිරීම් හා සියලු සමාජ මාධ්‍ය වේදිකාවලදී සංවිධානය විසින් ප්‍රබල හඬක් නැංවිය යුතුය.






## කාලසටහන් හා සහභාගීත්වය










**ඉඟිය: මෙම සමාජ මාධ්‍ය චර්යා නීති මතක තබාගන්න**

- ඔබට මතයක් දැරිය හැකිය. කෙසේ වෙතත්, ඕනෑම ට්විටර් පණිවුඩයකදී, ට්විටර් පණිවුඩයක් නැවත බෙදාගැනීමේදී හෝ පළකිරීමකදී එය පැහැදිලි කරන්න.
- පෞද්ගලික ගිනුම් අධ්‍යාපනි කටයුතු වෙනුවෙන් ද, ව්‍යාපාර ගිනුම් වෘත්තීය කටයුතු වෙනුවෙන් ද භාවිතා නොකළ යුතුය.
- කිසියම් අවස්ථාවකදී නිශේධාත්මක ප්‍රතිඵලයක් ඇතිවේ නම්, ඒ හා සම්බන්ධ වීම නවත්වා දැමීමෙහි වරදක් නැත.

අධික ලෙස නිශේධාත්මක වන හෝ මතභේදාත්මක වන අන්තර්ගතයක් පළකිරීමට පෙර නැවත සිතන්න.!

ජාලගත වීම

රාජ්‍ය නිලධාරීන්, සහෝදර රාජ්‍ය නොවන සංවිධාන, සිවිල් සමාජ සංවිධාන හා ආධාරකරුවන් වැනි විවිධ පරදු දරන්නන් කණ්ඩායම් සමග ජාලගත වීම මගින් ප්‍රතිපත්ති උසස් කළ හැකි අතර ඔබගේ සංවිධානයේ පොදු ප්‍රතිරූපය නංවාගත හැකිය.

සංවිධාන සම්පත්, සම්බන්ධතා සහ පර්යේෂණ වැනි උපාංග බෙදාගැනීම සඳහා ක්‍රමයක් ලෙස ද ජාලගත වීම යොදාගත හැකිය. ජාලගත වීම හා සන්ධාන ගොඩනැගීම මගින් උද්දේශන සංවිධානවල හඬට ද බරක් ලබාදෙයි.

සංවිධාන විසින් හවුල්කරුවන් සමග ජාලයන් හෝ සන්ධාන ගොඩනැගීමට උත්සාහ කරන ඇතැම් අවස්ථාවලදී, ඔවුන්ට විවිධ අභියෝගවලට මුහුණදීමට සිදුවේ. උදාහරණයක් ලෙස ඇතැම් සංවිධානවල සියලු අභිමතාර්ථවලට සන්ධාන හවුල්කරුවන් එකඟ නොවීම බාධාවක් විය හැකිය.

සිද්ධි අධ්‍යයන විශ්ලේෂණය

සාපරාධී අපහාස නීතිය සම්බන්ධ ශ්‍රී ලංකාවේ ක්‍රියාමාලාව වෙත නැවත යොමුවෙමු.:

> 2002 වසරේදී, අගමැති රනිල් වික්‍රමසිංහගේ නායකත්වයෙන් යුත් රජය විසින් ඉවත්කරනු ලබන තෙක්ම, අපහාසය සාපරාධී වරදක් ලෙස සලකන ලදී. එම වරද සිදුකළ පුද්ගලයන් දණ්ඩ නීති සංග්‍රහය යටතේ වසර දෙකක සිර දඬුවමකට ලක්කරන ලදී. සාපරාධී අපහාස නීතිය අහෝසි කරදැමූ දකුණු ආසියාවේ පළමු හා එකම රට ශ්‍රී ලංකාවයි.
>
> මාධ්‍ය සංවිධාන හා බලපෑම් කණ්ඩායම් විසින් දශකයක් පුරා සිදුකරන ලද අරගලකාරී ක්‍රියාමාලා රැසකින් පසුව, 2002 ජූනි 18 දින සාපරාධී අපහාස නීතිය නීති පොතෙන් ඉවත් කරන ලදී. මෙම ක්‍රියාමාලාවට ජාත්‍යන්තර සංවිධාන කීපයක සහයෝගය ලැබිණි. ඒ අතර International Press Institute (IPI), International PEN, World Association of Newspapers, Commonwealth Press Union (CPU), Committee to Protect Journalists (CPJ), Article XIX සහ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිෂන් සභාවේ ප්‍රකාශනයේ නිදහස පිළිබඳ විශේෂ වාර්තාකරු ද සිටියහ.

දේශීය මාධ්‍ය උද්දේශන සංවිධාන කීපයක් අපරාධ නීතිය අහෝසි කිරීම වෙනුවෙන් උද්දේශනය සඳහා ඒකරාශී වූහ. මෙම සන්ධානය රජයට බලපෑම් කිරීම සඳහා ප්‍රගාමී ලෙස තම ජාත්‍යන්තර ජාලයන් භාවිතා කළේය. දේශීය මාධ්‍ය සංවිධානවලට පාර්ශ්වකරුවන් විය හැකි ජාත්‍යන්තර මාධ්‍ය උද්දේශන ජාලයන්ගේ ලැයිස්තුවක් සැකසීමට ඔබට හැකියාව තිබේද?

## පවත්නා සන්ධානයක් සමග සම්බන්ධ වීම

පහත දැක්වෙන්නේ සන්ධාන සමග එක්වීමේ වාසි කීපයකි.

1. සියලු උද්දේශන ක්‍රියාකාරකම්වලදී මනාව සම්බන්ධීකරණය කරන ලද සන්ධානවලට සිය බලපෑම ගුණනය කිරීමේ හැකියාව තිබේ. එක් ක්‍රියාමාලාවක ප්‍රයත්නයන් ශක්තිමත් කිරීම වෙනත් සංවිධානයකට සිදුකළ හැකිය.

2. විවිධ කණ්ඩායම් එක්ව එක් අභිමතාර්ථයක් වෙනුවෙන් එක් හඬක් නගන විට ඔවුන්ගේ දේශපාලනික ප්‍රාග්ධනය බොහෝවිට වෙන වෙනම එක් එක් කණ්ඩායමේ ශක්තියට වඩා විශාලය.

3. වඩා පුළුල් ග්‍රාහක ප්‍රජාවක් වෙත ළඟාවීමට සන්ධානවලට හැකිය. ජනගහනයෙන් වඩා විශාල ප්‍රතිශතයක් නියෝජනය කළ හැකිය.



4. සාමාජික සංවිධානවලට විවිධ විශේෂඥභාවයන් හෝ සුවිශේෂ කුසලතා ඩිටලයන් තිබේ. ඒවා බෙදාහදාගනිමින් සන්ධානය තුළ ඉගැන්විය හැකිය.

5. දුෂ්කර අවස්ථාවලදී, සහෝදර සංවිධානවලට ක්‍රියාමාලා සඳහා සදාචාරාත්මක සහයෝගය සැපයිය හැකිය. කාර්ය මණ්ඩල හා ස්වේච්ඡා සේවකයන් දිරිගැන්විය හැකිය.

6. සන්ධානයක් ලෙස සම්බන්ධීකරණය වීමෙන්, උද්දේශන ක්‍රියාමාලාවන්ගේ එකම ප්‍රයත්නයන් විවිධ කණ්ඩායම් විසින් දැරීම, තරගකාරීත්වය හා හරස් අතට සන්නිවේදනය වීම වළක්වාගත හැකිය.

සිද්ධි අධ්‍යයනය

**මාධ්‍ය නිදහස පිළිබඳ සන්ධානය: ගෝලීය හවුල්කාරීත්වය පිළිබඳ සාරාංශයක්**

මාධ්‍ය නිදහස පිළිබඳ සන්ධානය පිහිටුවනු ලැබුවේ 2019 ජුලි මස මාධ්‍ය නිදහස සඳහා ගෝලීය සමුළුවේදීය. එය මාධ්‍ය නිදහස වෙනුවෙන් හා තම වෘත්තිය හේතුවෙන් අවදානමට ලක්වන ජනමාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව සඳහා උද්දේශනය කරන රටවල හවුල්කාරීත්වයකි. මෙම සන්ධානයේ මූලික කාර්යය වන්නේ තර්ජනයට ලක්වන අවස්ථාවලදී මාධ්‍ය නිදහස ආරක්ෂා කිරීමයි.

සන්ධානයේ සාමාජිකයන් විසින් මාධ්‍ය නිදහස පිළිබඳ ගෝලීය ප්‍රතිඥාවකට අත්සන් තබා තිබේ. එහි අරමුණ වන්නේ දේශීය වශයෙන් මාධ්‍ය නිදහස ආරක්ෂා කිරීම හා ජාත්‍යන්තර වශයෙන් එක්ව ක්‍රියා කිරීමයි.

එක් එක් සිදුවීම සම්බන්ධයෙන් බලපෑම් කිරීම මගින් සන්ධානය විසින් මාධ්‍ය නිදහස ප්‍රවර්ධනය කරනු ලැබේ. එමගින් අපයෝජකයන් වගවීමට සලස්වනු ලැබේ. සන්ධානයේ සාමාජික හා වෙනත් රටවලට මාධ්‍යවල ආරක්ෂාව වැඩිදියුණු කිරීමටත්, බහුපාර්ශ්වීය සංසදවලදී සාමූහික නිවේදන සිදුකිරීමටත් උපකාර කරනු ලැබේ.

සන්ධානයේ සියලු සාමාජික රටවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ පළමු පූර්ණ රැස්වීම 2020 ජනවාරි 29-30 දිනවල ජිනීවාහිදී පැවැත්විණි. එහිදී සේවා කොන්දේසි (සන්ධානයට බැඳීමේ යාන්ත්‍රණය ඇතුළුව), බලපෑම් කිරීමේ යාන්ත්‍රණයන් සහ ප්‍රමුඛතා පිළිබඳ එකඟතා ඇතිකරගන්නා ලදී. සන්ධානයේ සාමාජිකයන් විසින් අවසාන නිවේදනයකට එකඟ වී තිබේ.

කොරෝනා වයිරස් වසංගතය මතුවූ විට, මාධ්‍ය නිදහස පිළිබඳ සන්ධානයේ විධායක කණ්ඩායමේ බ්‍රිතාන්‍යය ඇතුළු සාමාජික රටවල් විසින් 2020 අප්‍රේල් 6දා නිවේදනයක් නිකුත් කරන ලදී. මාධ්‍ය නිදහසෙහි මූලික වැදගත්කම නැවතත් අවධාරණය කරනු ලබන එය විසින් නිදහස් මාධ්‍ය වෙත ප්‍රවේශය ආරක්ෂා කරන ලෙස සියලු රාජ්‍යවලින් ඉල්ලා සිටියි.

සාමාජිකයන්:

මේ වන විට, රටවල් 47ක් මාධ්‍ය නිදහස පිළිබඳ සන්ධානයේ සාමාජිකත්වය ලබාගෙන තිබේ. එම සියලු සාමාජිකයන් විසින් මාධ්‍ය නිදහස පිළිබඳ ප්‍රතිඥාවට අත්සන් තබා තිබේ. .

මාධ්‍ය නිදහස පිළිබඳ සන්ධානය: an overview - GOV.UK (www.gov.uk)

**සන්ධාන සම්බන්ධ අවදානම් තිබේද?**

සන්ධාන හැමවිටම මැනැවින් සංවිධානය වූ ව්‍යුහයන් නොවේ. සංවිධානවල අනන්‍යතා වෙනස් විය හැකි අතර සංවිධානවල ප්‍රතිපත්තිමය ස්ථාවරයන්ට ද එය සිදුවිය හැකිය. ක්‍රියාමාලාවන්වලදී පහසුවෙන් පොදු සන්ධාන සමග සම්බන්ධ විය හැකිය. ඒවා සාමාන්‍යයෙන් සහයෝගය දක්වන මුත්, ක්‍රියාමාලාව විසින් අපේක්ෂා කරන මට්ටමින් තම ඇපකැපවීම නොදැක්වීමට ඉඩ තිබේ.

සන්ධාන සම්බන්ධ අවදානම සඳහා උදාහරණයක්

**දේශගුණික විපර්යාසය:**

**එක්සත් ජනපදය නිල වශයෙන් පැරිස් සම්මුතියෙන් ඉවත්වීම**

2015දී පැරිස් සම්මුතිය කෙටුම්පත් කරනු ලැබුවේ දේශගුණික විපර්යාස මගින් ඇතිකරනු ලබන තර්ජන සම්බන්ධයෙන් ගෝලීය ප්‍රතිචාර ශක්තිමත් කිරීම සඳහාය. එහි අරමුණ වන්නේ මෙම සියවස තුළදී ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම කර්මාන්ත විප්ලවයට පෙර යුගයේ තිබුණු මට්ටමට වඩා සෙල්සියස් දෙකක උපරිම මට්ටමකින් පවත්වාගැනීමයි. මෙම මට්ටම සෙල්සියස් 1.5 දක්වා වැඩිදුරටත් සීමාකරගැනීමේ ප්‍රයත්නයක් ද තිබේ. පැරිස් දේශගුණික සම්මුතියෙන් ඉවත් වූ පළමු රාජ්‍යය බවට එක්සත් ජනපදය පත්විය. 2017 ජුනි මාසයේදී ජනාධිපති ට්‍රම්ප් විසින් ඒ බව නිවේදනය කරන ලදී. මෙම 'සන්ධානය' බිඳවැටීමේ බලපෑම වන්නේ දේශගුණික ක්‍රියාමාර්ග අනුගමනය කිරීම සම්බන්ධයෙන් සෙසු රාජ්‍ය අඩු උනන්දුවක් දැක්වීමට ඉඩ තිබීමයි. එක්සත් ජනපදය ලොව දේශගුණික විපර්යාසවලට වැඩියෙන්ම දායක වන රට වීම එයට හේතුවයි. එසේම, දේශගුණික විපර්යාස ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් බල රික්තයක් ද එමගින් නිර්මාණය වේ.

## බලපෑම් කිරීම (Lobbying)

**ලොබි කිරීම යනු**

ලොබි කිරීම යනු, දේශපාලකයන්ට හෝ වෙනත් රාජ්‍ය නිලධාරීන්ට ඍජුවම බලපෑම් කිරීමේ ක්‍රියාවකි. පොදු ප්‍රතිපත්ති සම්පාදකයන් රාජ්‍ය නිලධාරීන් වන විට ලොබි කිරීම රාජ්‍ය සම්බන්ධතාවන්හි කොටසක් බවට පත්වේ.

ප්‍රාදේශීය, පළාත් හෝ ජාතික මට්ටම්වලදී තීරණ ගන්නන් සමග ඍජු සන්නිවේදනය හරහා සංවාද ගොඩනගාගැනීම ලොබි කිරීමට අයත් වේ. එය බලවත් උද්දේශන මෙවලමක් විය හැකිය. එහෙත්, සම්පත් අධික ලෙස අවශ්‍ය වන උපායමාර්ගයකි. සම්බන්ධතා ගොඩනගාගැනීම බලපෑම් ප්‍රයත්නයෙහි ප්‍රධාන කොටසක් බවට පත්වේ. එහෙත්, එය සංකීර්ණ වන අතර සාර්ථක වීම සඳහා කාලය හා ශක්තිය අවශ්‍ය වේ.

ලොබි කිරීම්වල යෙදෙන විට ඔබ විසින් සලකා බැලිය යුතු කරුණු කීපයක් තිබේ.

**අන්‍යෝන්‍ය විශ්වාසය (Trust):** පෞද්ගලික, වෘත්තීය හෝ දේශපාලනික ආදී සියලු සම්බන්ධතා විශ්වාසවන්තභාවය මත රඳාපවතී. තමන් පාවිච්චි කිරීමට අනෙක් පාර්ශ්වය උත්සාහ කරන්නේ යයි එක් පාර්ශ්වයකට සිතේ නම්, එම පාර්ශ්වය සහයෝගය නොදැක්වීමට බෙහෙවින් ඉඩ තිබේ. උද්දේශකයන් බලපෑම් ඉලක්ක සමග ගනුදෙනු කරන හැමවිටම අවංක විය යුතුය. කිසි විටෙකත් බොරු නොකිවයුතුය. තොරතුරු සැඟවීම හෝ ප්‍රබන්ධ කිරීම නොකළ යුතුය. උද්දේශකවරයා විසින් සපයනු ලබන තොරතුරු ඉලක්ක පාර්ශ්වය විසින් විශ්වාස කළ යුතුය. එම තොරතුරු හැකි තරම් ඉහළ මට්ටමේ සාක්ෂි මත පදනම් විය යුතුය. ලොබි කිරීම අතරතුර විශ්වාසය ගොඩනගාගන්න. එය වෙනත් ඕනෑම වෘත්තීය පසුබිමකදී විශ්වාසය ගොඩනගාගන්නා ආකාරයමය. ප්‍රතිචාරාත්මක වන්න. ආචාරශීලී වන්න. ප්‍රශ්නය පිළිබඳ දැනුවත්භාවයෙන් යුක්ත වන්න.

**විශ්වසනීයත්වය** (Credibility): ක්‍රියාමාලා නීත්‍යානුකූල විය යුතුය. එමගින් තීරණ ගන්නන් උද්දේශනය සමග සාධනීය සම්බන්ධතාවක් නිර්මාණය කරගැනීම සඳහා පොළඹවනසුලු තර්ක ඉදිරිපත් කළ යුතුය. ක්‍රියාමාලාවේ යුක්තියුක්තභාවය (Legitimacy) නිර්මාණය වන්නේ එහි ප්‍රජා හිමිකාරීත්වයෙන් හා පීඩිත ප්‍රජාවෙන් මතුවන නායකත්වයෙනි. ක්‍රියාමාලාවේ නායකත්වය පිටස්තර උද්දේශකයන් විසින් පාලනය කරනු ලබන්නේ යයි අවබෝධ වුවහොත්, පීඩිත ප්‍රජාවේ අව්‍යාජ නියෝජනයක් නොමැති කණ්ඩායමක් සමග සම්බන්ධතා පවත්වන්නට තීරණ ගන්නන් අකැමැති වන්නට පුළුවන.

ලොබි කිරීමට ඉලක්ක වන පුද්ගලයාගේ හෝ ආයතනයේ අරමුණ ද උද්දේශනයට අනුකූල විය යුතුය. ක්‍රියාමාලාවක ඉල්ලීම අතාර්කික වුවහොත් හෝ ඉලක්ක පුද්ගලයාට හෝ ආයතනයට පවත්නා දේශපාලන සංදර්භය තුළ කළ නොහැක්කක් නම්, ඉලක්කය විසින් එම ක්‍රියාමාලාව නිසි තොරතුරු මත පදනම් නොවූ ක්‍රියාමාර්ගයක් ලෙස සලකා ප්‍රතික්ෂේප කරනු ඇත. විශ්වසනීයත්වය ගොඩනැගීම සඳහා, ක්‍රියාමාලාවේ ඉල්ලීම් පැහැදිලි හා සංක්ෂිප්ත විය යුතුය. ඉල්ලීම එය පසුබිමෙහි තිබෙන ප්‍රශ්නයට තිබෙන පුළුල් විසඳුමෙහි කොටසක් වන්නේ කෙසේදැයි අවබෝධ වන පරිදි ඉදිරිපත් කළ යුතුය.

**විශ්වසනීයත්වය වර්ධනය කිරීම සඳහා, අදාළ ප්‍රජාව වෙතින් නිර්මාණය වන හා පොළඹවනසුලු පණිවුඩ ඉලක්ක පුද්ගලයා වෙත යොමුකිරීමට මතක තබාගන්න. පණිවුඩය සන්නිවේදනය වන්නේ කෙසේදැයි සලකා බලන්න.**

**දේශපාලන ප්‍රාග්ධනය:** ක්‍රියාමාලා විසින් ගරුත්වය හා සාර්ථකත්වය දිනාගන්නා විට, එමගින් දේශපාලනික ප්‍රාග්ධනය උකහාගැනීමට පටන්ගනියි. එමගින් නව සම්බන්ධතා ගොඩනැගෙනු ඇත. තිබෙන ඒවා ශක්තිමත් වනු ඇත. දේශපාලනඥයෝ හා රාජ්‍ය නිලධාරීහු දේශපාලන ශක්තිය ඇති ආයතන සමග සම්බන්ධතා පවත්වන්නට කැමැත්තක් දක්වති. එසේම, දුර්වල ඒවායින් ඈත්වෙති. දේශපාලනික බලය ගොඩනගාගැනීමේදී විශ්වසනීය ආයතනයක් ලෙස කීර්තිය ගොඩනගාගැනීම කෙරෙහි අවධානය යොමුකරන්න.



## සිද්ධි අධ්‍යයනය -5: සාර්ථක ලෙස ලොබිකිරීම

උනන්දුවක් දැක්වූ පාර්ශ්ව විසින් වසර ගණනක් තිස්සේ සිදුකළ උද්දේශනය හා ලොබිකිරීම මගින් තොරතුරු වෙත ප්‍රවේශය මූලික මානව අයිතිවාසිකමක් ලෙස ශ්‍රී ලංකා රජය විසින් පිළිගන්නා ලදී. එමගින් සංකේතවත් වන්නේ, රට විනිවිදපෙනෙනසුලුබව, ඇතුළත්කාරීබව හා සහභාගී පාලනය වෙත යොමුකිරීම සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය පාර්ශ්වයේ හා එහි ජනතාවගේ ඇපකැපවීමයි.

ශ්‍රී ලංකාවේ තොරතුරු දැනගැනීමේ හිමිකම සම්බන්ධ නීතිමය රාමුව කැනඩාවේ නීතිය හා ප්‍රජාතන්ත්‍රවාදය සඳහා මධ්‍යස්ථානයේ ගෝලීය තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ ශ්‍රේණිගත කිරීමෙහි තුන්වන ස්ථානයට පත්විය. මෙම නීතිමය රාමුවෙහි සාර්ථකත්වය රඳාපවතින්නේ රජය හා පනත මගින් ආවරණය කරනු ලබන වෙනත් ආයතන විසින් කාර්යක්ෂම හා ඵලදායී ලෙස තොරතුරු සැපයීම මතය. එසේම, රාජ්‍ය පාලනය සම්බන්ධයෙන් විනිවිදභාවය හා වගවීම ඉල්ලා සිටීම සඳහා මහජනයා විසින් එය භාවිතා කිරීම ද එහිදී වැදගත් වේ.

තොරතුරු දැනගැනීමේ හිමිකම ව්‍යවස්ථාවෙන් පිළිගෙන නීතිගත කිරීමෙන් අනතුරුව පවා, එම නීතිමය රාමුව සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා කළ යුතු බොහෝ දේ තිබේ. එහිදී කැපීපෙනෙන අභියෝගයක් වන්නේ තොරතුරු දැනගැනීමේ හිමිකම් පනත සමග ප්‍රතිරෝධී වන නීති රැසක් භාවිතයේ පැවතීමයි. එම ඇතැම් නීති මගින් මෙම හිමිකමෙහි පරාසය සීමාකිරීමට ඉඩ තිබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14වන වගන්තිය සමග සහ තොරතුරු දැනගැනීමේ හිමිකම් පනත සමග පරස්පර වීමට ඉඩ ඇති නීතිමය විධිවිධාන පිළිබඳ විශ්ලේෂණයක් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනෙහි වාර්තාවක අඩංගු වේ. තොරතුරු දැනගැනීමේ හිමිකම පිළිබඳ අධිකරණමය ප්‍රවේශය ද, මතුවියහැකි දුෂ්කරතා සහ තොරතුරු දැනගැනීමේ හිමිකම සමග සම්බන්ධ නඩුවලදී අධිකරණයට ප්‍රතිචාර දැක්වීමට සිදුවිය හැකි ගැටලු ද මෙම වාර්තාවෙහි සංක්ෂිප්තව ඉදිරිපත් කර තිබේ.

**www.lk.undp.org**




ලොබි කිරීමේදී අනුගමනය කළ යුතුව තිබෙන පොදු නීති කීපයක් තිබේ.

1. **ඔබේ ඉලක්කය පිළිබඳ අධ්‍යයනය කරන්න.** ඉලක්කයෙහි පෙළඹවීම, දේශපාලන ප්‍රමුඛතා සහ පෞද්ගලි උනන්දුව අධ්‍යයනය කරන්න. ඔබ අත වැඩිපුර තොරතුරු තිබෙන තරමට, ඔබට අන්‍යෝන්‍ය එකඟතා ඇති කරගත හැකි කලාප සොයාගැනීම පහසු වේ. ඒවාට ධනාත්මක සම්බන්ධතාවල පදනම හෝ ආරම්භක ස්ථානය බවට පත්විය හැකිය.

2. **ඉවසිලිවන්ත හා අත්හැර නොදමන අයෙකු වන්න:** ඔබගේ ඉල්ලීම් සමග සෘජුව සම්බන්ධ නොමැති ඉලක්කයක් සමග සම්බන්ධ වීම සඳහා නිර්මාණාත්මක ආකාර පිළිබඳ සිතන්න. රාජ්‍ය නිලධාරීන් ද ඇතුළු බොහෝ දෙනා අමුත්තන් උදව් ඉල්ලනවාට අකැමැතිය. එම නිසා, ඔබේ ඉල්ලීම කෙළින්ම ඉදිරිපත් නොකරන්න. ඉලක්කය දැනුවත් කිරීම සඳහා කාලය ලබාගන්න. ක්‍රියාමාලාව පිළිබඳ අවබෝධ කරගැනීම සඳහා ඉලක්කයට ආරාධනා කරන්න. උදාහරණයක් ලෙස, පීඩාවට පත් ප්‍රජාව හමුවීමට ක්ෂේත්‍ර චාරිකාවක් සඳහා හෝ ප්‍රාදේශීය උත්සවයක කතාවක් පැවැත්වීම සඳහා හෝ රාජ්‍ය නිලධාරියකුට ආරාධනා කිරීමට ඔබට හැකිය.

3. **ප්‍රාදේශීය චාරිත්‍ර වාරිත්‍ර ගැන දැනුවත් වන්න:** උද්දේශකවරුන් සංස්කෘතික වශයෙන් දැනුවත් හා ප්‍රාදේශීය චාරිත්‍ර වාරිත්‍ර අනුව හැසිරෙන පුද්ගලයන් වීම අත්‍යවශ්‍යය. එමගින් ඔවුන් නොසිතූ වැරදි සිදුවීම සහ විශ්වසනීයත්වය යටපත් වීම ද වළකී.

4. **ඉල්ලීම්වලට ඔබ්බෙන් සම්බන්ධතා පවත්වාගන්න.** යම් කාලයකට වරක් ඉලක්කය සමග එම පුද්ගලයාට වැදගත් වන තොරතුරු බෙදාගන්න. එසේ නැතිනම්, ක්‍රියාමාලාව සාධනීය ආකාරයෙන් නිරූපණය වන ක්‍රියාකාරකම් සඳහා ඔවුන්ට ආරාධනා කරන්න.

5. **පණිවුඩය පුද්ගලයන්ට ගැලපෙන පරිදි සකස්කරන්න:** අමතර පර්යේෂණ භාවිතා කරන්න. උද්දේශන පණිවුඩය ලොබි ඉලක්කයට පෞද්ගලිකව ගැලපෙන පරිදි සකස් කරගන්න. ඉලක්කය වැඩියෙන්ම පොළඹවනසුලු දත්ත භාවිතා කරන්න. නිශ්චිත ඉලක්කයකට ගැලපෙන අන්දමින් තොරතුරු ඉදිරිපත් කරන්න.

6. **ඔබගේ කාර්යය පැහැදිලි කරන්න.** ඉලක්කය වෙතින් ඔබ අපේක්ෂා කරන කාර්යය පැහැදිලි කරන්න. තනි පිටුවේ ලේඛන වැනි සංක්ෂිප්ත ලියකියවිලි නිර්මාණය කිරීමට සලකා බලන්න. එම ලේඛනවල සියලු අදාළ දැනුම අඩංගු විය යුතු අතර, පහසුවෙන් කියවා තේරුම්ගත හැකි ආකාරයෙන් ඉදිරිපත් කළ යුතුය.

7. **ගැටලුව හා යෝජිත විසඳුම පිළිබඳ අවබෝධයෙන් යුක්ත වන්න**: ප්‍රතිපත්ති පිළිබඳ සාකච්ඡාවලදී, ඉලක්කයේ ප්‍රශ්නවලට පිළිතුරු දීමට සූදානමින් සිටින්න. ඔබගේ ස්ථාවරය අභියෝගයට ලක්විය හැකි බව තේරුම්ගන්න. ඉලක්කය ඔබගේ ස්ථාවරයට විරුද්ධ විය හැකි ආකාරය ගැන කල්තබා සිතා, අභියෝග අවම කළ හැකි අන්දමින් සාක්ෂි හා තර්ක සූදානම් කරගන්න.

8. **විනීත වන්න:** ඔබගේ ලොබි ඉලක්කය හමුවේ කිසිදු විටෙක අවිනීත අන්දමින් නොහැසිරෙන්න. ඔවුන් ඔබගේ ස්ථාවරයට දැඩි ලෙස විරුද්ධ වුවත්, ඔවුන් ප්‍රතික්ෂේප නොකරන්න. ලොබි කිරීම අනෙකුත් සෑම උද්දේශන ක්‍රියාමාර්ගයක් පරිද්දෙන්ම සංකේන්ද්‍රණාත්මක ක්‍රියාවලියකි. ඉලක්කයක් එක් දිනක අකැමැත්ත ප්‍රකාශ කළ පමණින් එම පුද්ගලයා තවත් අවස්ථාවකදී පොළඹවාගත නොහැකි යයි නොසිතන්න.

9. **සවන්දෙන්න:** උද්දේශකවරුන් විසින් සිදුකරනු ලබන පොදු වරදක් වන්නේ තම ලොබි ඉලක්ක වෙත ඉල්ලීම් ලැයිස්තුවක් හා ඒවාට ආධාරක සාක්ෂි මාලාවක් ඉදිරිපත් කිරීමයි. ඒ අතර කිසිදු ආකාරයකින් ඉලක්කයට සවන් නොදීමයි. ලොබි ඉලක්කවලට ප්‍රතිපත්තිමය කාරණා සම්බන්ධයෙන් ඍජු බලපෑමක් ඇති බව මතක තබාගන්න. එම නිසා ඔවුන්ගේ මතවාද වැදගත්ය. උද්දේශනයට දැඩිව විරෝධය දක්වන ඉලක්කවල විරෝධයට වඩා හොඳින් සවන්දීමට උද්දේශකයන් පුරුදු විය යුතුය. විරුද්ධ පාර්ශ්වයේ හැඟීම් ප්‍රතික්ෂේප කරන්න එපා. ඔවුන්ගේ තර්කය අවබෝධ කරගත යුතු අතර එය පරාජය කිරීමට නම්, එය ගැන සැලකිලිමත් විය යුතුය.

10. **කිසිදු විටෙක බොරු නොකියන්න. ප්‍රබන්ධ නොකරන්න:** බොහෝ උද්දේශනයන් සිදුකරන්නේ සීමිත බලයක් ඇති හෝ කිසිදු බලයක් නොමැති පුද්ගලයන් විසිනි. දේශපාලන ප්‍රාග්ධනය ගොනුකරගැනීම දුෂ්කරය. එසේම, එය පහසුවෙන් නාස්ති වී යාමට ද පුළුවන. ඒ වෙනුවට උද්දේශකවරුන් විසින් තීරණ ගන්නන් සමග සම්බන්ධතා ගොඩනගාගත යුතුය. විශ්වසනීය සම්පතක් ලෙස තමන් සතුව තිබෙන කීර්තිය ඒ සඳහා භාවිතා කළ යුතුය. බොරු හා ප්‍රබන්ධිත තොරතුරු හේතුවෙන් බොහෝ උද්දේශකයන්ගේ ප්‍රාග්ධනය වන කීර්තිය අහිමි වී යයි.

## පසුවදන:

මෙම උද්දේශන මෙවලම් කට්ටලය අධ්‍යයනය කිරීම රසවත් කාර්යයක් වන්නට ඇතැයි අපි අපේක්ෂා කරන්නෙමු. ඔබගේම උද්දේශන ක්‍රියාමාලාවක් ශක්තිමත් හා වඩා ඵලදායී අන්දමින් සැලසුම් කරගන්නේ කෙසේද යන්න පිළිබඳ උපදෙස් එහි අඩංගු විය. ඔබගේ උද්දේශන මෙහෙයන් ක්‍රියාත්මක කරන විට ඔබ සමග කටයුතු කිරීමට අපි බලාපොරොත්තු වන්නෙමු.

**Be SMART !**



පරදු දරන්නන් කළමනාකරණය හා ලොබි කිරීම සම්බන්ධයෙන් Freedom House විසින් පහත දැක්වෙන උපායමාර්ග හඳුන්වාදෙනු ලැබේ:

**A. උතුරුදිග සිරියාවේ කුර්දිෂ් පළාතේ බලපෑම් සහිත ස්වදේශික නිලධාරීන් සඳහා විකල්ප ඇතුළුවීම් ස්ථානයක් භාවිතා කිරීම**

2011 වසරේ සිට, සිරියානු සිවිල් සමාජ සංවිධාන මානව හිමිකම් උද්දේශනයන්ගෙන් කුපිත වූ සිරියානු රජයේ මෙන්ම සන්නද්ධ කණ්ඩායම්වල ද ප්‍රහාරවලට ලක්විය. 2017 වන විට ඊසානදිග සිරියාවේ කුර්දිෂ් පළාතේ පවතින සාපේක්ෂ වශයෙන් සහනශීලී පසුබිම තුළ පවා සිවිල් සමාජ සංවිධාන බාධා හා අතපෙවීම්වලට මුහුණදුන්හ. 2017 නොවැම්බරයේදී ස්වදේශික කුර්දි බලධාරීන් විසින් රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධ නව නීතියක් භාවිතා කරමින් පැහැදිලි කිරීමකින් තොරව සිවිල් සමාජ සංවිධාන 50ක බලපත්‍ර අත්හිටෙව්වේය.

**අරමුණ:** මානව හිමිකම් කටයුතු සම්බන්ධයෙන් ස්වදේශික රජය හා ප්‍රජාව අතර පුළුල් පිළිගැනීමක් නිර්මාණය කිරීම සහ බාධාවකින් තොරව සිවිල් සමාජ සංවිධානවලට වැඩකිරීමට අවස්ථාව ලබාදීම.

**මූලෝපාය:** 2018 වසරේදී, මෙම ප්‍රශ්නය සම්බන්ධයෙන් මැදිහත් වන කුර්දි-සිරියානු මානව හිමිකම් සංවිධාන විසින් සිවිල් සමාජ සංවිධානවලට හිංසා කිරීම නවත්වන ලෙස නීතිය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කරන රාජ්‍ය නිලධාරීන්ට බලපෑම් කිරීම සඳහා මූලෝපායක් සකස්කරන ලදී.

**උපායමාර්ග:** අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමග ඉදිරියට යාමට නොහැකි බව සංවිධානය විසින් හඳුනාගන්නා ලදී. එම නිසා, ඔවුන් විසින් ප්‍රාදේශීය මට්ටමේ පිවිසුම් ස්ථාන හඳුනාගන්නා ලදී. ඔවුහු රාජ්‍ය නොවන අංශය අධීක්ෂණය කිරීමේ කාර්යය පැවරුණු ප්‍රාදේශීය රාජ්‍ය නිලධාරීන් සහ පළාත් පාලන ආයතන සභිකයන් සමග සම්බන්ධතා ගොඩනගාගත්හ. සිවිල් සමාජ සංවිධාන සහ මෙම නිලධාරීන් අතර වැඩමුළු මාලාවක් හරහා අමාත්‍යාංශ නිලධාරීන් දේශීය නීතිවල සීමාවන් ඉක්මවා බලය මෙහෙයවමින් කටයුතු කරන්නේ කෙසේදැයි අවබෝධ කරදීමට ඔවුහු සමත් වූහ. ජාත්‍යන්තර මානව හිමිකම් සම්ප්‍රදායන් (නීති හා ප්‍රමිතිගත භාවිතයන්) මත පදනම් වූ ගැටුම්කාරී නොවන සංවාදයක් ඔස්සේ සංවිධානයට වෙනස සඳහා මාර්ගයක් විවෘත කිරීමට හැකි විය.

**බලපෑම:** මෙම මූලෝපායික මැදිහත්වීම අනුගමනය කිරීම හා සම්බන්ධතා ගොඩනගාගැනීම හරහා අදාළ පළාත් බලධාරීන් විසින් සිවිල් සමාජ සංවිධාන පහක් සම්බන්ධයෙන් ගෙන තිබුණු තීරණය ආපසු හැරවිය හැකි විය. එම සංවිධාන පහේ බලපත්‍ර ආපසු ලබාදෙන ලද අතර ඔවුන්ට තම මෙහෙයුම් ක්‍රියාත්මක කළ හැකි විය.



• මූලාශ්‍රය: syria.chathamhouse.org

**B.** අඩුවෙන් සංවේදී ප්‍රශ්නයක් හඳුනාගැනීම: චීනයේ කාන්තා හිමිකම් වෙනුවෙන් **"වැසිකිළි අත්පත් කරගැනීම - Occupy Restroom"**

චීනයේ ස්ත්‍රීවාදී ව්‍යාපාරය මුහුණදෙන්නේ දුෂ්කර අභියෝගවලටයි. සටන්කාමී අරගලවල නියැලෙන කාන්තා අයිතිවාසිකම් කණ්ඩායම් බටහිර ගැති ඒවාය යන විවේචනය එල්ලවේ. විශ්වාසය ගොඩනගාගැනීමට ඔවුන්ට අරගලයක් කරන්නට සිදුවී තිබේ. සමානාත්මතාව වෙනුවෙන් ඉල්ලීම් ඉදිරිපත් කිරීමටත්, පීතෘමූලික ආධිපත්‍යයට අභියෝග කිරීමටත් සමාජ මාධ්‍ය නැගීම හේතුවෙන් පුළුල් අවස්ථාවක් ලැබී තිබේ. එහෙත්, ස්ත්‍රීවාදී කණ්ඩායම් ප්‍රභූ කවවලින් පිටත කාන්තා සමූහයන් සමග සම්බන්ධ වීමට හා සමාන අයිතිවාසිකම් වෙනුවෙන් වන ඉල්ලීම් ස්පර්ශනීය හා ප්‍රායෝගික ප්‍රතිඵල බවට පත්කිරීමට උත්සාහ කරමින් සිටිති. ඒ අතරවාරයේ, මානව හිමිකම් ප්‍රශ්න සම්බන්ධයෙන් රජයට අභියෝග කිරීම අතිශය භයානක තත්වයක් වී තිබේ. එබැවින්, ක්‍රියාමාලාවන් අවදානමට පත් නොකරන ක්‍රියාකාරීත්වයක් සඳහා අවස්ථා සොයාගැනීම අතිශය වැදගත්ය. මෑත කාලයේදී, චීන ස්ත්‍රීවාදී ක්‍රියාකාරිකයන් විශාල පිරිසක් විසින් අධ්‍යතන චීන සමාජයේ පුරුෂමූලිකත්වයට විරෝධය දැක්වීම සඳහා නිර්මාණාත්මක ක්‍රියාමාලා පාවිච්චි කරන ලදී. මෙම ක්‍රියාකාරිකයන් වැඩිදෙනෙකු සමාජ මාධ්‍ය වෙත නැඹුරුවක් සහිත, වයස අවුරුදු විසිගණන් වන, එඩිතර තරුණියන්ය.

**අරමුණ:** පුරුෂ මූලිකත්වයේ බලපෑම පිළිබඳ දැනුවත්භාවය නැංවීම සහ කාන්තා අයිතිවාසිකම් සඳහා සහයෝගී ක්‍රියාකාරකම් දිරිගැන්වීම

**මූලෝපාය:** චීන පුරවැසියන් සමග සම්බන්ධ වෙමින් කාන්තාවන් බලසතු කිරීම සඳහා බිම් මට්ටමේ මහජන සහාය ලබාගැනීම

**උපායමාර්ගය:** මතභේදාත්මක නොවන ප්‍රශ්න හඳුනාගනිමින්, කාන්තාවන් සඳහා සමාන අයිතිවාසිකම් සඳහා ඉල්ලීම අදාළ වන සාමාන්‍ය ජනයා අතරින් ඒවාට සහාය ලබාගැනීම සඳහා විහිළු භාවිතා කිරීමට 2012 වර්ෂයේදී, තරුණ ස්ත්‍රීවාදීන් කණ්ඩායමක් විසින් තීරණය කරන ලදී. සුප්‍රකට ස්ත්‍රීවාදී ක්‍රියාකාරිනී ලී ටිංටිංගේ නායකත්වයෙන් කාන්තාවන් විසිදෙනෙක් පිරිමි වැසිකිළි අල්ලාගැනීමේ ව්‍යාපාරයක් දියත්කිරීමට තීරණය කළහ. ඔවුන්ගේ අරමුණ වූයේ, පොදු ස්ථානවල වැඩිපුර කාන්තා වැසිකිළි ස්ථාපිත කිරීමේ අවශ්‍යතාව පෙන්වාදීමයි. පළමු ‘අත්පත් කරගැනීම’ 2012 පෙබරවාරි 19දා ග්වාංෂවුහිදී (Guangzhou) සිදුවිය. එවැනි තවත් අවස්ථාවක් සතියකට පසු බීජිංහිදී සිදුවිය. මෙම ක්‍රියාමාලාවේදී ලීගේ විනෝදාත්මක ප්‍රසාංගික කලාව ස්ත්‍රීවාදී අරමුණු පිළිබඳ දැනුවත්භාවය නැංවීම සඳහා භාවිතා කරන ලදී.

**බලපෑම:** මෙම ව්‍යාපාරය පිළිබඳ තොරතුරු චීනයේ ට්විටර් හා සමාන වේදිකාව වන Weiboහි වේගයෙන් පැතිරිණි. දේශීය හා ජාත්‍යන්තර මාධ්‍ය ආයතන වෙතින් එයට දැවැන්ත සහායක් ලැබිණි. අවසානයේදී, විරෝධතාවෙන් පසු ග්වාංෂවුහි පළාත් බලධාරීන් එයට ප්‍රතිචාර දක්වමින් කාන්තා වැසිකිළි සංඛ්‍යාව 50%කින් ඉහළ නැංවීමට එකඟ වූහ. එවැනි නිර්මාණාත්මක උද්දේශන ක්‍රියා මගින් ප්‍රතිඵල ලබාගත හැකිමුත්, ඒවා ද අවදානමින් තොර නැත. පසුව 2015දී, ලී අත්අඩංගුවට ගෙන හිංසනයට ලක්කරන ලදී. එහෙත්, ඇය සිය ක්‍රියාධරභාවය අත්හළේ නැත.




• මූලාශ්‍රය: https://www.bbc.com/news/world-asia-china-32313650

### C. ජාතික ආයතන වෙත බලපෑම වැඩිකිරීම සඳහා ජාත්‍යන්තර හෝ කලාපීය මෙවලම් භාවිතා කිරීම

මාලිහි අවුරුදු ගණනාවක අස්ථාවරත්වයෙන් හා ප්‍රචණ්ඩත්වයෙන් පසු, 2015දී, රජයත්, රාජ්‍ය හිතවාදී සන්නද්ධ සන්ධානයක් සහ උතුරේ කැරලිකාර සන්ධානය අතර සාමය හා සංහිඳියාව සඳහා ගිවිසුමක් අත්සන් කරන ලදී. එයින් පසු ගතවූ 19 මාසය අතරතුරදී, සාම ගිවිසුම තිබියදී පවා, මානව හිමිකම් උල්ලංඝනයන් හා අපයෝජන 600කට වඩා සිදුවූ බව එක්සත් ජාතීන් විසින් වාර්තාගත කරන ලදී. මාලිහි දිගට ඇදී යන ගැටුම අතරතුර, මානව හිමිකම් ආරක්ෂකයන්ට එරෙහි ඉලක්කගත ප්‍රහාර පවා සිදුවිය. පොදු අස්ථාවරත්වය මානව හිමිකම් ආරක්ෂකයන්ගේ කාර්යයන් අවදානමට පත්කළේය. ඔවුන් ක්‍රියාත්මක වූයේ බිය සාමාන්‍යකරණය වූ, තර්ජන, ප්‍රචණ්ඩත්වය හා දණ්ඩමුක්තිය පැතිරී තිබුණු පරිසරයක් තුළය.

**අරමුණ:** මානව හිමිකම් ආරක්ෂකයන්ගේ යුක්තියුක්තභාවය පිළිගන්නා නීතිමය ව්‍යුහයක් හඳුන්වාදීම මගින් මානව හිමිකම් ආරක්ෂකයන්ගේ ආරක්ෂාව වර්ධනය කිරීම සහ ඔවුන්ට ප්‍රහාර හා පළිගැනීම් සම්බන්ධ බියෙන් තොරව සේවය කළ හැකි වාතාවරණයක් නිර්මාණය කිරීම

**මූලෝපාය:** මානව හිමිකම් ආරක්ෂකයන්ගේ ආරක්ෂාව හා ඔවුන්ගේ භූමිකාව ප්‍රවර්ධනය කිරීම සහතික කිරීම සඳහා මානව හිමිකම් ආරක්ෂක පනත මාලි පාර්ලිමේන්තුවේ සම්මත කිරීම සඳහා වූ ක්‍රියාමාලාව

**උපායමාර්ග:** මානව හිමිකම් ආරක්ෂා කිරීමේ නීති සම්මත කිරීම සඳහා තම ජාතික ව්‍යවස්ථාදායකයට බලපෑම් කිරීම සඳහා මාලි සිවිල් සමාජය විසින් ජාත්‍යන්තර හා කලාපීය යාන්ත්‍රණයන් භාවිතා කරන ලදී. උප සහරා කලාපීය සිවිල් සමාජය ජාත්‍යන්තර මානව හිමිකම් යාන්ත්‍රණයන් සමග ක්‍රියාත්මක වෙමින් මානව හිමිකම් ආරක්ෂකයන්ගේ ආරක්ෂාව වෙනුවෙන් ප්‍රමිති පද්ධතියක් නිර්මාණය කරන ලදී. අප්‍රිකානු කොමිෂමට එය මත පදනම්ව නව කලාපීය ප්‍රමිති නිර්මාණය කරගත හැකි විය. මානව හිමිකම් ආරක්ෂකයන්ට ජාත්‍යන්තර සංවිධාන සමග සම්බන්ධව අරමුදල් සම්පාදනය කරගැනීම සඳහා ඇති හිමිකම මෙම ප්‍රමිති මගින් තහවුරු කරන ලදී. ඔවුන්ගේ නිවාස හා කාර්යාල ආරක්ෂිත ස්ථාන ලෙස පිළිගන්නා ලදී. කාන්තා මානව හිමිකම් ආරක්ෂකවරියන්ට සහ ආබාධ සහිත මානව හිමිකම් ආරක්ෂකයන්ට විශේෂ විධිවිධාන සකස්කරන ලදී. මෙම ප්‍රමිති අප්‍රිකානු කොමිෂම විසින් සම්මත කිරීමෙන් අනතුරුව, ඒ අනුව කෝට් ඩි'අයිවර් හා බුර්කිනා ෆාසෝ විසින් සම්මත කරන ලද ප්‍රමිති මත පදනම්ව, ඒ හා සමාන ව්‍යුහයක් වෙනුවෙන් මාලි රජයට බලපෑම් කිරීමට සිවිල් සමාජ සංවිධානවලට හැකියාව ලැබිණි. සාර්ථක පනත් කෙටුම්පතක් සම්පාදනය කරන ලදී. ස්වදේශික සිවිල් සමාජ සංවිධාන හා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන සන්ධානයක් විසින් සම්මත කිරීමට තිබෙන නීතිය ගැන මහජනයා දැනුවත් කිරීම සිදුකරන ලදී. පනත සම්මත කිරීම සඳහා මහජන නියෝජිතයන්ට බලකරන ලෙස ඉල්ලාසිටින ලදී. දේශීය රේඩියෝ මධ්‍යස්ථාන ක්‍රියාමාලාවක් ද මෙයට අයත් විය. එම රේඩියෝ මධ්‍යස්ථානය සතුව දේශීය රේඩියෝ නාලිකා 56ක් සමග හවුල්කාරීත්වයන් තිබිණි. ඔවුන් විසින් මානව හිමිකම් ආරක්ෂකයන් පිළිබඳ කතා භාෂා හයකින් ඉදිරිපත් කරන ලදී. සන්ධානය විසින් මන්ත්‍රීවරුන් සමග රැස්වීම් ද සංවිධානය කරන ලදී. විශේෂයෙන්ම ඉඩම් හිමිකම් වෙනුවෙන් පෙනීසිටින්නන් ඇතුළු මානව හිමිකම් ආරක්ෂකයන් මුහුණදෙන අභියෝග ඒවායේදී අවධාරණය කරන ලදී.

**බලපෑම:** මානව හිමිකම් ආරක්ෂකයන් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා 2017 දෙසැම්බරයේදී, මාලි පාර්ලිමේන්තුව විසින් පනතක් සම්මත කරන ලදී. වසර කීපයකට ඉහතදී එවැනි පනතක් ගැන සිතීමටවත් හැකියාවක් නොතිබිණි. එම නීතිය පදනම් වූයේ මානව හා මහජන හිමිකම් පිළිබඳ අප්‍රිකානු කොමිෂන් සභාව තුළ සිවිල් සමාජය විසින් උද්දේශනය කරන ලද කලාපීය ප්‍රමිති මතය. ජාතික හා ජාත්‍යන්තර සිවිල් සමාජ සංවිධානවල උද්දේශනය හේතුවෙන්, මාලි පාර්ලිමේන්තුව විසින් කෙටුම්පත තවදුරටත් ශක්තිමත් කරන ලදී. කාන්තා මානව හිමිකම් ආරක්ෂකවරියන් වෙනුවෙන් විශේෂ ආරක්ෂණයක් එයට ඇතුළත් කරන ලදී. ඔවුන් මුහුණදෙන තර්ජනවල සුවිශේෂීභාවය එයට හේතු විය. ලිංගික ප්‍රචණ්ඩත්වය, පිළිකුල් කිරීම හා වෙනස් අන්දමින් සැලකීම මෙන්ම ආබාධ සහිත මානව හිමිකම් ආරක්ෂකයන්ගේ ආරක්ෂාව ද එයට ඇතුළත් කරන ලදී.




• මූලාශ්‍රය: ishr.ch

## D. අසාමාන්‍ය හවුල්කරුවන් සොයාගැනීම: කාම්බෝජයේ ඇඟලුම් සමාගම් හවුල්කරුවන් ලෙස

කාම්බෝජයේ සිවිල් සමාජ සංවිධාන සහ මානව හිමිකම් ක්‍රියාධරයන් මුහුණදෙන්නේ එදිරිවාදී රජයකටය. එමගින් අගමැති හින් සින්ගේ තිස් අවුරුදු පාලනයට එරෙහි සෑම ආකාරයකම විරෝධයන් ක්‍රමානුකූලව මර්දනය කරන ලදී. 2018 පාර්ලිමේන්තු මැතිවරණයට පෙර සමයේදී රජය සිවිල් සමාජය, විරුද්ධ පක්ෂ හා ස්වාධීන මාධ්‍ය නිහඬ කිරීමට උත්සාහ කළේය. මෙම සංදර්භය තුළ, මූලික ප්‍රකාශනයේ නිදහස, සංවිධානය වීමේ හා රැස්වීමේ නිදහස සඳහා අවකාශය දැඩිව සීමා කරන ලදී. රජය විසින් අන්තර්ජාලය පාලනය සඳහා දැඩි නීති සම්පාදනය කරන ලදී. ස්වාධීන සිවිල් සමාජයේ පැවැත්ම සීමාකිරීම සඳහා අධිකරණ තීන්දු ද ලබාගැනිණි. රාජ්‍ය නොවන සංවිධාන ඇතුළු සංගම් සම්බන්ධ නීතිය (LANGO) සහ වෘත්තීය සමිති සම්බන්ධ නීතිය වැඩියෙන්ම හානිකර නීති අතරට අයත් විය. එමගින් සිවිල් සමාජ සංවිධාන පිහිටුවීමේ, රැස්වීම් පැවැත්වීමේ හා ක්‍රියාත්මක වීමේ නිදහස සීමාකරන ලදී.

**අරමුණ**: සිවිල් සමාජයට, ස්වාධීන මාධ්‍යවලට සහ කම්කරු සමිතිවලට බලපෑ සීමාකාරී තත්වය වෙනස් කිරීම හා ඒවාට කාම්බෝජ නීතිය යටතේ බාධාවකින් තොරව ක්‍රියාත්මක වීමට අවස්ථාව ලබාදීම.

**මූලෝපාය**: කාම්බෝජ රජයට එරෙහි පීඩනය වැඩිකිරීම සහ ස්වාධීන සිවිල් සමාජය, වෘත්තීය සමිති හා මාධ්‍යවලට එරෙහි සීමාකාරී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී රාජ්‍ය 'වියදම' වැඩිකිරීම.

**උපායමාර්ග**: දේශීය හා ජාත්‍යන්තර සිවිල් සමාජය සාර්ථක අන්දමින් ජාත්‍යන්තර සමාගම් සමග සම්බන්ධ වූහ. සාමාන්‍යයෙන් ගත් කල ඔවුන් විය නොහැකි පාර්ශ්වකරුවන් පිරිසකි. කම්කරු අයිතිවාසිකම් පිළිබඳ සංවිධාන හා වෙනත් සිවිල් සමාජ සංවිධාන විසින් H&M සහ Adidas වැනි ජාත්‍යන්තර ඇඟලුම් සන්නාමයන් සමග සම්බන්ධ වීමට වසර ගණනක් තිස්සේ උත්සාහ දරන ලදී. එහි අරමුණ වූයේ කාම්බෝජ නීතිය යටතේ මූලික කම්කරු ප්‍රමිති හා ආරක්ෂණයන් වර්ධනය කිරීමයි. 2017 වසරේදී, මෙම ප්‍රයත්නයන් හේතුවෙන්, කාම්බෝජයේ ප්‍රජාතාන්ත්‍රික ආයතන පිරිහීම පිළිබඳ ඇමරිකානු ඇඟලුම් හා සපත්තු සන්ධානය (AAFA) වෙතින් අගමැති හුන් සෙන් වෙත ලිපියක් නිකුත් විය. තම ගැටලු කෙළින්ම කාම්බෝජ රජය වෙත ඉදිරිපත් කිරීම සඳහා ජාත්‍යන්තර සන්නාමයන් පොළඹවාගැනීමට දේශීය සිවිල් සමාජ සංවිධාන සමත් වූහ.

**බලපෑම**: 2018 මුල් කාලයේදී, රජය විසින් ප්‍රධාන පෙළේ වෘත්තීය සමිති ක්‍රියාකාරිකයන් තිදෙනෙකුට එරෙහිව දේශපාලනිකව නිර්මාණය කරන ලද අපරාධ චෝදනා එල්ලකරන ලදී. එම අවස්ථාවේදී, ඇඟලුම් සමාගම් විසින් ඒ පිළිබඳ තම අවධානය පැහැදිලිවම ඉදිරිපත් කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, 'සංවිධානය වීමේ නිදහස ආරක්ෂා කිරීම' වෙනුවෙන් වෘත්තීය සමිති ක්‍රියාකාරිකයන්ට එරෙහි සියලු චෝදනා ඉවතදැමීමට කම්කරු අමාත්‍යාංශය විසින් අධිකරණ අමාත්‍යාංශයට උපදෙස් දෙන ලදී. 2018 ඔක්තෝබරයේදී, AAFA සහ Fair Labor Association රජය හමුවී කාම්බෝජයේ ශ්‍රම හා කම්කරු අයිතිවාසිකම් පිළිබඳ තම සැලකිලිමත්බව ප්‍රකාශ කළහ. 2016 වසරේ ගෙන එන ලද වෘත්තීය සමිතිවලට එරෙහි සීමාකාරී නීති සංශෝධනය කරන්නැයි විශේෂ ඉල්ලීමක් සිදුකරන ලදී. කාම්බෝජ සිවිල් සමාජ සංවිධාන සහ වෘත්තීය සමිති තවමත් මූලික නිදහස යළි ඇතිකරගැනීම සඳහා අරගල කරයි. රජයට බලපෑම් කිරීම සඳහා ව්‍යාපාරික ප්‍රජාව පෙළඹවීම ඔවුන්ගේ මූලෝපායේ ප්‍රධාන කොටසකි.

.



• **මූලාශ්‍රය:** https://www.hrw.org/news/2016/10/24/secret-underbelly-cambodian-garment-industry

E. **හංගේරියාවේ Kella Taszහි වාචික අපහාසවලට හා පිළිකුල් කිරීමට එරෙහි අරගලය**

2010 වසරේ සිට, හංගේරියාවේ බලය අපහරණය සම්බන්ධ තුලන හා සංවරණයන්ගේ වේගවත් කඩාවැටීමක් සිදුවිය. 2010දී ඒකාධිපතිවාදී ජයප්‍රියවාදියකු වූ වික්ටර් ඕබන්ගේ ජයග්‍රහණයෙන් පසු රජය සිවිල් සමාජය පසුපස එළවීමට පටන්ගත්තේය. විදේශ අරමුදල් ලබන සංවිධාන දැඩි ලෙස නියාමනය කිරීම සඳහා පනතක් ඔහුගේ රජය විසින් 2017දී සම්මත කරන ලදී. රාජ්‍ය නොවන සංවිධාන 'ආරක්ෂක තර්ජනයක්' සහ 'විදේශ නියෝජිතයන්' ලෙස නම්කරන ලදී. රජයේ ප්‍රධාන තර්කයක් වූයේ විශේෂයෙන්ම මානව හිමිකම් සංවිධාන ඇතුළු රාජ්‍ය නොවන සංවිධාන සාමාන්‍ය පුද්ගලයන්ගේ අභිලාෂයන් නියෝජනය නොකරන බව හා යුක්තියුක්තභාවයෙන් තොර බවයි. රාජ්‍ය නොවන සංවිධාන පිළිකුල් කිරීමේ දැවැන්ත ක්‍රියාමාලාවට ප්‍රතිචාර ලෙස හංගේරියානු සිවිල් නිදහස පිළිබඳ සංගමය (HCLU) විසින් "HCLU is needed" හෝ "Kell a TASZ" යන නම්වලින් මුලපිරුමක් ආරම්භ කරන ලදී.

**අරමුණ**: සිවිල් සමාජයට එරෙහි වෛරී ක්‍රියාමාලාව සිවිල් සමාජ සංවිධාන විසින් ඇත්තෙන්ම සාක්ෂාත් කරගැනීමට බලාපොරොත්තු වන අරමුණු සම්බන්ධ සාධනීය, බලාපොරොත්තු සහගත එකක් බවට පත්කිරීම.

**මූලෝපාය**: හංගේරියානු සිවිල් සමාජ සංවිධාන විසින් රටට සාධනීය දායකත්වයක් සපයන බව හා සියලු හංගේරියානුවන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් උද්දේශනය කරන බව පෙන්වාදීම සඳහා බහුවිධ මාධ්‍ය ප්‍රචාරණයක් ආරම්භ කිරීම.

**උපායමාර්ග**: HCLU සිය සමාජ මාධ්‍ය ක්‍රියාමාලාව හා ප්‍රචාරණ මූලෝපාය ඔස්සේ වාචික අපහාස, ඒකාකෘතිකරණය හා පිළිකුල් කිරීම සම්බන්ධයෙන් කෙළින්ම ක්‍රියාත්මක විය. කුමන්ත්‍රණ න්‍යායට හා ප්‍රහාරවලට එරෙහිව නිශේධාත්මක ප්‍රතිචාර දක්වනවා වෙනුවට සාධනීය අන්දමින් ප්‍රතිචාර දැක්වීමට කටයුතු කරන ලදී. සමාජ මාධ්‍ය හැෂ්ටැග් ව්‍යාපාරයක් ලෙස ආරම්භ වූ එය ප්‍රචාරණ මූලෝපායක් බවට පත්විය. එමගින් හංගේරියානු සමාජයේ විවිධ කොටස් සමග වෙනදා නොමැති ආකාරයේ සම්බන්ධතා ගොඩනගාගන්නා ලදී. එම කොටස් මින් පෙර සිවිල් සමාජ කණ්ඩායම් කෙරෙහි සානුකම්පිත වූ ඒවා නොවේ. HCLU නායකයෝ මෙසේ සටහන් කළහ: "අපගේ සාමාජිකයන් හා ගනුදෙනුකරුවන් සම්බන්ධයෙන් සිදුකරන ලද ද්වේෂ සහගත ප්‍රචාරයන් වෙනුවට අපගේ කාර්යමණ්ඩල හා සේවාදායකයන් මානුෂීය ලෙස නිරූපණය කරන වාර්තා කිරීම් අප සිදුකළා. ඔවුන්ගේ සත්‍ය කතා මගින් ඔවුන් 'අපගෙන් කෙනෙකු' බවත් මානව හිමිකම් මගින් සෑම කෙනෙකුම ආරක්ෂා වන බවත් පෙන්වා දුන්නා." HCLU විසින් තම සිවිල් සමාජ ක්‍රියාකාරිකයන්ගේ ජීවිත හා පුරවැසියන්ගේ ජීවිත අතර සමානත්වය පෙන්වාදෙමින් ව්‍යාජ චෝදනාවලට අභියෝග කරන ලදී. මානව හිමිකම් උද්දේශනය මගින් වාසි සැලසෙන්නේ අගනුවර සිවිල් සමාජ සංවිධානවලට පමණක් නොවන බව ද, රට පුරා සියලු හංගේරියානුවන්ට එය යහපතක් බව ද පෙන්වා දෙන ලදී. වත්මන් දේශපාලන ප්‍රජාවන් අතර 'පෙළඹවිය හැකි මැද කොටස' දිනාගැනීම සඳහා ක්‍රියාමාලාවක් ඔවුහු දෙවනුව ආරම්භ කළහ. ඕබන්ගේ ආධාරකරුවන් නොවූ ඔවුන් සාමාන්‍යයෙන් හංගේරියානු සිවිල් සමාජය සමග එතරම් සම්බන්ධ නොවූ පිරිසකි. තමන්ගේ කතා හා මතකයන් බෙදාහදාගනිමින් හා අන්තර්ගතයන් බෙදාහදාගනිමින් ඔවුහු හැෂ්ටැග් ව්‍යාපාරය සමග සම්බන්ධ වූහ. මෙය මීට පෙර සිතන්නටවත් නොහැකි වූ සාර්ථකත්වයකි. මෙය සිදුවූයේ ඕබන් රජය විසින් සිවිල් සමාජ සංවිධාන යක්ෂයන් පිරිසක් ලෙස නිරූපණය කරමින් සමාජය දේශපාලනිකව බෙදා තිබුණු සංදර්භයක් තුළය.

**බලපෑම:** අවසානයේදී, ඔවුන් පෙනීසිටින්නේ කුමක් වෙනුවෙන් ද යන්න පණිවුඩවලින් පෙනිණි. එය විරෝධතාවාදයක් නොවන බව ද, බිය විය යුතු කාරණයක් නොවන බව ද පෙන්වා දෙමින් ඔවුන්ගේ දැක්ම හා බලාපොරොත්තු නිරූපණය කරන ලදී. සරල භාෂාව හා හාස්‍යය භාවිතා කරමින්, ඔවුන් විසින් පෝස්ට් හා මීම් නිර්මාණය කරන ලදී. සුබවාදී අදහස්වල උපුටාගැනීම්, හංගේරියානු සිවිල් සමාජයේ භූමිකාව විස්තර කරන වීඩියෝ ආදිය එයට ඇතුළත් විය. ඔවුන් විසින් බොහෝ සන්නිවේදන මාධ්‍ය භාවිතා කරන ලද අතර සාමාන්‍යයෙන් ළඟාවනවාට වඩා වැඩි පිරිසක් වෙත සන්නිවේදනය සිදුවිය. ග්‍රැෆික් සැලසුම්කරුවන්, සංගීතඥයන් සහ වෙනත් කලාකරුවන්ට තම කාර්යයන් පිළිබඳ ප්‍රකාශ පළකරන්නැයි ආරාධනා කරන ලදී. මෙමගින් සුවිසල් මහජන සහායක් නිර්මාණය විය. HCLU වෙත සහාය ලබාදෙමින් සිදුවූ දැවැන්ත පරිත්‍යාගවලින් හා ලිඛිත සහතික කිරීම්වලින් එහි බලපෑම නිරූපණය විය.




• මූලාශ්‍රය: www.euractiv.com

F. **උයිගුර් ඩයස්පෝරා ව්‍යාපාරය සමග වැඩකිරීම**

චීනයේ උයිගුර් හා වෙනත් මුස්ලිම් සුළුතර ප්‍රජාවන්ට දඬුවම් කිරීමට හා 'නැවත අධ්‍යාපනය ලබාදීමට' චීන රජය විසින් ෂින්ජියැං පළාතේ රැඳවුම් කඳවුරු පිහිටුවා තිබෙන බව 2018දී නිව්යෝක් ටයිම්ස් හා වෙනත් මාධ්‍ය ආයතන විසින් හෙළිදරව් කරන ලදී. ළමයින් ද ඇතුළුව මිලියනයකට වඩා ජනයා කඳවුරුගත කර ඇති බව එම වාර්තා විසින් පෙන්වාදෙන ලදී. චීනයේ ජීවත් වන උයිගුර් ප්‍රජාව තවමත් දැඩි ආවේක්ෂණයකට ලක්වන අතර තත්වයට එරෙහිව හඬ අවදිකරන පුද්ගලයන් අත්අඩංගුවට ගනුලැබේ. උයිගුර් සංස්කෘතියට එරෙහි මර්දනයේ ස්වභාවය හෙළිදරව් කිරීම සඳහා ඔවුන්ගේ හැකියාව මෙන්ම සංස්කෘතික ජීවිතය ද සීමාකර තිබේ. බාහිර ලෝකය වෙත යාම සඳහා ඔවුන්ට තිබෙන අවස්ථා සීමාකර තිබේ. ඔවුන්ගේ ප්‍රජාවට එරෙහි ඍජු ප්‍රහාර ද එල්ලවේ.

**අරමුණ**: ෂින්ජියැංහි උයිගුර්වරුන්ට එරෙහිව චීන රජය විසින් සිදුකරනු ලබන දැවැන්ත මානව හිමිකම් උල්ලංඝනයන් පිළිබඳ දැනුවත් කිරීම හා තත්වය සම්බන්ධයෙන් කටයුතු කිරීමට ජාත්‍යන්තර ප්‍රජාව පොළඹවාගැනීම.

**මූලෝපාය**: ඩයස්පෝරා කණ්ඩායම් හා ෂින්ජියැංහි පුද්ගලයන් අතර සම්බන්ධතා හරහා ෂින්ජියැංහි සිදුවන අපයෝජනයන් වාර්තාගත කිරීම හා හෙළිදරව් කිරීම. ඒවා බහු පාර්ශ්වීය මානව හිමිකම් සංවිධාන හරහා ප්‍රචාරය කිරීම.

**උපායමාර්ග**: උයිගුර් ඩයස්පෝරාව පුළුල් හා මැනැවින් සංවිධානය වී තිබේ. ලෝක උයිගුර් කොංග්‍රසයේ (WUC) සංඛ්‍යාලේඛන අනුව, ඔවුන් සංඛ්‍යාවෙන් ලක්ෂ 10-16 අතර වේ. අමානුෂික සැලකීම් පිළිබඳ මුල් මූලාශ්‍රවලින් තොරතුරු වාර්තා වන උයිගුර් සිවිල් සමාජ කණ්ඩායම්වල අධ්‍යයන හා ලේඛන හරහා මාධ්‍ය වාර්තාවලට තොරතුරු ලබාගන්නා ලදී. ෂින්ජියැංහි උයිගුර් හා වෙනත් ස්වදේශික කණ්ඩායම්වල මානව හිමිකම් තත්වය ප්‍රවර්ධනය කිරීමේ ප්‍රයත්නයන්ට සැලකිය යුතු දායකත්වයක් එක්සත් ජනපදය පදනම් කරගත් උයිගුර් මානව හිමිකම් ව්‍යාපෘතිය (2004දී පිහිටුවන ලද) සහ උයිගුර් ඇමරිකානු සංගමය (1998දී පිහිටුවන ලද) විසින් සපයන ලදී. මෙම කණ්ඩායම් දෙකත්, WUC සහ Radio Free Asia (මෙහි උයිගුර් සේවයේ ජනමාධ්‍යවේදීන් සිරගත කර තිබේ) විසින් සාර්ථක ලෙස එක්සත් ජනපද කොංග්‍රසයේ මන්ත්‍රීවරුන් 17දෙනෙකු හමුවේ ලොබි කිරීම සිදුකර චීන බලධාරීන්ට එරෙහිව ගෝලීය මැග්නිට්ස්කි පනතෙහි සම්බාධක ක්‍රියාත්මක කරන ලෙස ඉල්ලාසිටින ලදී. චීනයේ රැඳවුම් කඳවුරුවලට එරෙහිව යුරෝපා පාර්ලිමේන්තුවේ හදිසි යෝජනා සම්මතයක් සඳහා බලපෑම් කිරීමට ද ඔවුහු සමත් වූ අතර එම යෝජනාව 2018 ඔක්තෝබරයේදී සම්මත කරන ලදී.

**බලපෑම**: දැවැන්ත මානව හිමිකම් උල්ලංඝනයන් පිළිබඳ සිදුවූ හෙළිදරව් කිරීම් හේතුවෙන්, ඒවාට එරෙහිව ජාත්‍යන්තර හඬක් මතුවිය. මානව හිමිකම් උල්ලංඝනයන්ට එරෙහිව කටයුතු කිරීමේලා ඩයස්පෝරාවට තිබූ හැකියාව හේතුවෙන් චීන රජය විසින් ඩයස්පෝරාව නිහඬ කිරීමට උත්සාහ දරන ලදී. චීනයට පක්ෂපාතී වියට්නාමය, තායිලන්තය හා වෙනත් රටවල්වලින් උයිගුර්වරුන් පිටමං කිරීමට, ප්‍රශ්න කිරීමට හා රඳවා තබාගැනීමට බලපෑම් කිරීමට චීන රජය උත්සාහ කළේය. බාහිර රටවල නිදහස් ජීවිතයක් ගතකරන උයිගුර්වරුන් එක්සත් ජනපදය, යුරෝපා සංගමහ හා එක්සත් ජාතීන් ඇතුළු

ජාත්‍යන්තර ප්‍රජාවට බලපෑම් කිරීම දිගටම කරති. චීනයේ අවධානමට පාත්‍ර වී සිටින ප්‍රජාවන්ගේ මූලික මානව අයිතිවාසිකම්වලට ගරුකිරීමට චීනයට බලපෑම් කිරීම ඔවුන්ගේ අරමුණයි. බියකරු සාක්ෂි සහ චන්ද්‍රිකා ඡායාරූප ආදිය ඇතුළත් වාර්තා හේතුවෙන් ජාත්‍යන්තරයෙන් එල්ලවන පීඩනය නිසා කොමියුනිස්ට් පක්ෂයට කඳවුරු තිබෙන බව පිළිගැනීමට සිදුවිය. එහෙත්, ඔවුන් දිගටම පවසන්නේ කඳවුරු පවත්වාගෙන යන්නේ 'තාක්ෂණික පුහුණුකිරීම් හා සටන්කාමීන් පුනරුත්ථාපනය' සඳහා බවයි.




• මූලාශ්‍රය: pri.org

G. **නිර්මාණාත්මක ලෙස තාක්ෂණය භාවිතා කිරීම: චීනයේ** #METOO **ව්‍යාපාරය**

2018 වර්ෂයේදී, #MeToo ව්‍යාපාරය චීනය වෙත ළඟාවිය. දැඩි වාරණයන් තිබියදී පවා තමන් මුහුණදුන් ලිංගික හිංසනයන් පිළිබඳ කතාකිරීමට චීන ජාතික කාන්තාවෝ විශාල පිරිසක් ඉදිරිපත් වූහ. එම ප්‍රශ්න සම්බන්ධයෙන් මාධ්‍ය පවා විමර්ශනය කළේ නැත. පොලිසිය සානුකම්පිත නොවූ අතර කාන්තාවන්ට පැමිණිලි කළ හැකි එකම ක්‍රමය වූයේ අන්තර්ජාලය හරහා තම අත්දැකීම ප්‍රකාශ කිරීමයි. මෙම හෙළිදරව් කිරීම් සම්බන්ධ අවස්ථාව හදිසියේ ස්වාභාවිකවම පැනනැගුණු එකක් විය. එය කිසිදු සංවිධානයක් විසින් සංවිධානය කරනු ලැබූවක් නොවේ. එහෙත්, මහජනතාව වෙත ළඟාවීමෙන් හා දිගින් දිගටම බලපෑම් කිරීමෙන් ආකල්ප වෙනස් කිරීමේ හා ක්‍රියාමාර්ගවලට පෙළඹවීමේලා සමාජ මාධ්‍යවල තිබෙන හැකියාව එමගින් නිරූපණය විය.

**අරමුණ**: ලිංගික හිංසනය සිදුවන අවස්ථා හෙළිදරව් කිරීම මගින් චීනයේ ලිංගික හිංසනය පවතින බවට දැනුවත් කිරීම සහ අවසානයේදී වැරදිකරුවන් වගකීමට ලක්කිරීම.

**උපායමාර්ග**: #MeToo ව්‍යාපාරය චීනය වෙත පැමිණි පසු කාන්තාවන් විසින් පෞද්ගලිකව තම අත්දැකීම් සමාජ මාධ්‍යවල ස්වේච්ඡාවෙන් පළකිරීම මගින් ලිංගික හිංසනය පිළිබඳ දැනුවත් කිරීම් සිදුකරන ලදී. එමගින් එවැනි උල්ලංඝනයන්ට මුහුණදුන් පුද්ගලයන් අතර සහයෝගීතාවක් නිර්මාණය විය. ඉතාම ප්‍රකට හෙළිදරව් කිරීමක් සිදුකරනු ලැබුවේ බීජිංහි බෙයිහැං විශ්වවිද්‍යාලයේ හිටපු ශිෂ්‍යාවක වූ ලුඕ ක්වියැංක්වියැං විසිනි. අන්තර්ජාලයේ සිදුකළ පළකිරීමක් මගින් ඇය විශ්වවිද්‍යාල මහාචාර්යවරයකුට එරෙහිව ලිංගික අපයෝජන චෝදනාවක් ඉදිරිපත් කළාය. එය වහා වාරණය කරන ලදමුත්, ඒ වනවිට එය වේගයෙන් ප්‍රචාරය වී තිබිණි. ඉන් පසු, එම මහාචාර්යවරයාටම එරෙහිව බෙයිහැං විශ්වවිද්‍යාලයේ තවත් ශිෂ්‍යාවන් පස්දෙනෙකු විසින් සමාන චෝදනා ඉදිරිපත් කරන ලදී. අවසානයේදී මහාචාර්යවරයාව තනතුරින් පහකරන ලදී. එය එතැනින් අවසන් නොවූ අතර වෙනත් විශ්වවිද්‍යාලවලින් ද එවැනි පෝස්ට් පළවන්නට විය.

**බලපෑම:** බීජිං, ෆුඩාන්, වුහාන් ඇතුළු විශ්වවිද්‍යාල කීපයක සිසුන්, ආදි සිසුන් හා ගුරුවරුන් ප්‍රසිද්ධියේ පෙනීසිටිමින් විශ්වවිද්‍යාලවල ලිංගික හිංසනය වැළැක්වීම සඳහා අධීක්ෂණ හා විනය ක්‍රියාමාර්ග හඳුන්වාදෙන ලෙස බලධාරීන්ට බලපෑම් කරන ලදී. 2018 ජනවාරි 19දා, විශ්වවිද්‍යාල 50කට වැඩි සංඛ්‍යාවක ආචාර්යවරුන් ප්‍රකාශනයකට අත්සන් කරමින් විශ්වවිද්‍යාලවල ලිංගික හිංසනය වැළැක්වීම සඳහා ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශ සිදුකරන මෙන් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ඉල්ලාසිටින ලදී. එම ඉල්ලීමට එකඟ වුවද, රජය විසින් තවමත් සංයුක්ත ප්‍රතිපත්තියක් සම්පාදනය කර නැත. කෙසේ වෙතත්, වාරණයන් ක්‍රියාත්මක කරන්නන් හට මෙම විරෝධතාව සම්පූර්ණයෙන් පාලනය කිරීමට නොහැකි විය. චීනයේ වැනි පරිසරයකදී පවා අන්තර්ජාල උද්දේශනයේ බලපෑමෙහි තරම මෙමගින් නිරූපණය වේ.




• මූලාශ්‍රය: www.restofworld.org

# මාධ්‍ය උද්දේශන මෙවලම් කට්ටලය

**ප්‍රජාතාන්ත්‍රික ශ්‍රී ලංකාවක් උදෙසා මාධ්‍ය සවිබලගැන්වීමේ වැඩසටන (MEND)**

